# (ඇ) පොදු ව්‍යවසාය *

1967 දී රාජ්‍ය ( පොදු ) අංශයෙහි වාණිජ කටයුතුවල නියැලුන, පොදු ව්‍යවසායයන් 62 ක් හඳුනාගත හැකිය. 1968 මාර්තු මාසයේ දී, පිහිටුවන ලද ලංකා කොහු මණ්ඩලයත්, 1968 මැයි මස පිහිටුවන ලද කොළඹ ප්‍රදේශ සංස්කරණ සහ සංවර්ධන මණ්ඩලයත්, 1968 සැප්තැම්බරයේ දී පිහිටුවන ලද රජයේ මුද්‍රණ සංස්ථාවත් එකතු වූ විට, 1968 දී එම ව්‍යවසායයන් 65 ක් විය. මෙකී මුළු සංඛ්‍යාවෙන් 56 ක් පොදු සමායතනයන් වූ අතර, ඉතිරි සංඛ්‍යාව රජයේ දෙපාර්තමේන්තු වසයෙන් ක්‍රියාත්මක විය. ඒ අතර, වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ වාණිජ කටයුතු, 1968 අප්‍රේල් මාසයේ දී පිහිටුවනු ලැබූ රජයේ දැව සංස්ථාව වෙත පවරනු ලැබීය. මේ අතර ආණ්ඩුවේ විදුලි බල දෙපාර්තමේන්තුව, '' විදුලිබල මණ්ඩලය '' නමැති පොදු සමායතනයක් බවට හැරවීම සඳහා කෙටුම්පත් පනතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කැරුන අතර, වරාය සේවාවන් තනි '' වරාය අධිකාරයක් '' යටතේ ඒකාබද්ධ කිරීම සඳහා කටයුතු කර ගෙන යනු ලැබේ.

**පොදු අංශයේ කර්මාන්ත**

රජයේ දැව සංස්ථාව සහ ලංකා රජයේ මුද්‍රණාලයට අතිරේක වශයෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවන ලද රජයේ මුද්‍රණ සංස්ථාව පිහිටු වීමත් සමගම, කර්මාන්ත අංශයේ පොදු සමායතනයන් ගේ සංඛ්‍යාව 21 සිට 23 දක්වා ඉහළ නැඟුනි. මෙයට අමතර වශයෙන් පූර්ණ හෝ අර්ධ රජයේ දෙපාර්තමේන්තු වශයෙන් ව්‍යවසායයන් 3 ක් සංවිධානය වී තිබුනි. ඒවා නම් වශයෙන්, රජයේ ඉස්කාගාරය, අලෙවි දෙපාර්තමේන්තුවේ ඇසුරුම් කම්හල සහ රජයේ මුද්‍රණාලය වෙයි.

රජයේ පිටි ඇඹරුම් සංස්ථාව සහ ජාතික කිරි මණ්ඩලයේ උකුකිරි නිෂ්පාදනාගාරය 1968 තුළ දී නිෂ්පාදනය ඇරඹූ අතර, රජයේ ඛණිජ තෙල්, සංස්ථාවේ තෙල් පිරිපහදු කම්හල සහ රජයේ මුද්‍රණ සංස්ථාව නිෂ්පාදනය අරඹා නොමැත. අනෙකුත් සංස්ථාවන් අතරින් කිහිපයක් ම,සිය නිෂ්පාදනාවලිය පුළුල් කර ගැනීමේ වැඩ පිළිවෙලවල් සම්බන්ධයෙන් දියුණුවක් දක්වූහ. මේවා අතරින් ලංකා තෙල් සහ මේද සංස්ථාවේ නව සත්ව ආහාර නිපැයුම් හල, ලංකා සිමෙන්ති සංස්ථාවේ ප්‍රතිසංස්කරණ ලද පැරණි පෝරණුව, ලංකා ඛණිජ වැලි සංස්ථාවේ '' රූටයිල් '' සහ '' සර්කොන් '' යන ඛණිජ වර්ග වෙන් කිරීමේ මෝල සහ ලංකා වානේ සංස්ථාවේ වානේ නිර්මාන කම්හල, රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ වාත්තු කම්හල සහ ලංකා පොහොර සංස්ථාවේ පොහොර ගබඩා කිහිපය 1967/68 දී කාර්ය නියුක්ත කරවනු ලැබීය.

රජයේ කර්මාන්ත සංස්ථාවන් හි ක්‍රියා පරිපාටින් හඳුන්වාදීම සඳහා ඒ ඒ කාර්යයනට අනුව හා ඒවායේ මුදල් වර්ෂයනට අනුකූලව, ප්‍රාග්ධන ආයෝජන, නිෂ්පාදන, විකිණීම්, ලාභ සහ පාඩු පිළිබඳව පස් අවුරුදු සංඛ්‍යාත්මක සම්පිණ්ඩනයක් II (ඇ) 1 සිට II (ඇ) 4 දක්වා වන සංඛ්‍යා සටහන්වලින් දැක්වෙයි.

1967/68 අවසානයේ දී පැවැති පොදු සංස්ථාවන් 21 හී මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපි. දශ ලක්ෂ 762.5 ක් පමණ විය. මින් රුපි. දශ ලක්ෂ 643.9 ක් පමණ වැය වී තිබුනේ නිෂ්පාදනය ඇරඹූ කර්මාන්ත සම්බන්ධයෙනි. 1968/69 මුදල් වර්ෂයේ නව ආයෝජනය රුපි. දශ ලක්ෂ 255.6 ක් පමණ විය. මෙය ප්‍රධාන වශයෙන් ම, ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් පුත්තලමේ සිමෙන්ති කම්හල, ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ තෙල් පිරිපහදු කම්හල. ජාතික රෙදිපිළි සංස්ථාවේ තුල්හිරියේ රෙදි මෝල, රජයේ පිටි ඇඹරුම් සංස්ථාවේ පිටි මෝල, ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයට අයත් අවිස්සාවේල්ලේ පිහිටි තුනී ලෑලි සංකීර්ණ ස්ථානය සම්බන්ධයෙන් වූ ආයෝජනයෙකි. මේ අනුව, 1968/69 මුදල් වර්ෂය අවසානයේ දී සංස්ථා 22 ක ප්‍රාග්ධන ආයෝජන ය රුපි. දශ ලක්ෂ 1,018.1 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කළ හැකිය. මින් රුපි. දශ ලක්ෂ 797.5ක් පමණ මිඩංගු වූයේ නිෂ්පාදනය අරඹා ඇති කර්මාන්ත වෙනුවෙනි.

* මෙතාක් ම වාර්ෂික වාර්තාවලට අඩංගු වූයේ රාජ්‍ය අංශයේ කර්මාන්තයන් ගේ ක්‍රියාකාරිත්වයන්හි විශ්ලේෂණයක් පමණි. කර්මාන්ත නොවන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් ද, අඩංගු වන පරිදි මෙම විශ්ලේෂණයේ ආවරණ පථය මෙම වසරේ සිට අනුක්‍රමයෙන් පුළුල් කරනු ඇත. තවද, මෙතාක් රාජ්‍ය අංශයේ කර්මාන්තයන් පිළිබඳව විශ්ලේෂණයෙහි යෙදී ඇත්තේ ලිත් වර්ෂය පදනම් කොට ගෙන ය. මෙකී කර්මාන්තයන් මෙන් ම වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් බොහොමයක් ම සිය ගිණුම් පවත්වාගනු ලබන්නේ ලිත් වර්ෂයනට වෙනස් වන මුදල් වර්ෂ පදනම් මත හෙයින්, ලිත් වර්ෂයන් අනුව සංඛ්‍යා උපුටා ගැනීමේ දී එම සංඛ්‍යාවනට අධික ආසන්නකරණයක් ගැබ් වී තිබේ. එසේ හෙයින් වැඩි නිර්වද්‍යතාවයක් ඇති කරලීමේ අටියෙන් මින් මතු විශ්ලේෂණයෙහි යෙදෙනුයේ වඩා විශ්වාසයක් තැබිය හැකි මුදල් වර්ෂය සංඛ්‍යා ඉවහල් කර ගනිමිනි.

සංඛ්‍යා සටහන

## රාජ්‍ය කර්මාන්තවල වාර්ෂික ධාරිතාව, නිමැවුම් හා

| සමායතනය | නිමැවුම් ඒකකය | 1964-65 | | | |
|---|---|---|---|---|---|
| | | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව |
| 1. ජාතික කිරි මණ්ඩලය | | | | | |
| (අ) සකස්කිරීමේ ආයතන | | | | | |
| (i) කිරි මිලට ගැනීම් | පයින්ට් '000 ... | — | 16938 | — | — |
| (ii) වෙන් කළ කිරි | පයින්ට් '000 ... | — | 598 | ල.නො. | — |
| (iii) සකස් කළ කිරි | පයින්ට් '000 ... | 59250 | 16340 | 16,096 | 59,250 |
| (ආ) උකු කිරි කම්හල (ආ) | ටින් '000 ... | — | — | — | — |
| 2. නැගෙනහිර කඩදාසි | | | | | |
| (අ) නිෂ්පාදනය — | කඩදාසි ටොන් ... | 6570 | 5950 | 5710 | 7345 |
| | කොපි පොත් '000 ... | 6500 | 6606 | 4110 | 6000 |
| (ආ) වෙළෙඳ | කඩදාසි —ටොන් ... | — | 800/ඇ | 652 | — |
| 3. ලංකා පිඟන් බඩු | | | | | |
| (අ) මීගමු කම්හල | පිඟන් බඩු—ටොන් ... | 880 | 880 | ල.නො. | 880 |
| (ආ) පිළියන්දල කම්හල | ඉවුම් පිහුම් බඳුන්-ටොන් ... | — | — | — | — |
| | සනීපාරක්ෂක උපකරණ-ටොන් ... | — | — | — | — |
| | පිඟන් ගඩොල්-ටොන් ... | — | — | — | — |
| (ඇ) මැටි කම්හල | මැටි ටොන් ... | 5000 | 1630 | 998 | 5000 |
| 4. ලංකා තෙල් සහ මේද | | | | | |
| (අ) තෙල් මෝල | පොල් තෙල් ටොන් ... | 22320 | 1747 | 2259 | 22320 |
| (ආ) සත්ව ආහාර | සත්ව ආහාර ටොන් ... | 31200 | 16804 | 16575 | 31200 |
| (ඇ) මේද අම්ල | මේද අම්ල ටොන් ... | — | — | — | — |
| | ග්ලිසරින් ටොන් ... | — | — | — | — |
| (ඇ) අනිකුත් ඒකක | අනෙකුත් තෙල් ටොන් ... | — | — | — | — |
| 5. ලංකා තුනී ලෑලි (ඇ) | තුනී ලෑලි ප්ලයි 3 නේ ව.අ. '000 | 18000 | 15323 | — | 18000 |
| | තේ පෙට්ටි '000 ... | 780 | 731 | 722 | 840 |
| | බැටන් '000 ... | 700 | 428 | ල.නො. | 710 |
| | ලෑලි ව. අ. ගණන '000 .. | 993 | ල.නො. | 697 | 1550 |
| | දොරවල් '000 ... | 8 | 6 | 6 | 10 |
| 6. ලංකා සම්භාණ්ඩ | ක්‍රෝම් සම් ව. අ. ගණන '000 ... | 646 | 473 | 135 | 567 |
| | සපත්තු කුට්ටම් '000 ... | 216 | 184 | 181 | 216 |
| | වෙනත් නිෂ්පාදන රාත්. '000 ... | 286 | 210 | 54 | 304 |
| 7. පරන්තන් රසායන ද්‍රව්‍ය | කෝස්ටික් සෝඩා ටොන් ... | 1500 | 844 | 844 | 1500 |
| | ක්ලෝරින් ටොන් ... | 1400 | 255 | 255 | 1400 |
| | මේස ලුණු ටොන් ... | — | 11 | 11 | — |
| 8. ලංකා සිමෙන්ති | සිමෙන්ති ටොන් ... | 80000 | 73436 | 75583 | 80000 |
| (අ) කන්කසන්තුරේ කම්හල | සිමෙන්ති ටොන් ... | 80000 | 73436 | 75583 | 80000 |
| (ආ) ගාල්ල කම්හල | සිමෙන්ති ටොන් ... | — | — | — | — |
| 9. ශ්‍රී ලංකා සීනි | | | | | |
| (අ) කන්තලේ කම්හල | සීනි ටොන් ... | 21000 | 1958 | 1958 | 21000 |
| | ස්ප්‍රිතු වර්ග ප්‍රෘෆ් ගැලුම් '000 ... | 600 | 423 | 400 | 600 |
| (ආ) ගල්ඔය කම්හල (ඉ) | සීනි ටොන් ... | 19200 | 5471 | 5393 | 19200 |
| | ස්ප්‍රිතු ප්‍රෘෆ් ගැලුම් '000 ... | 750 | 391 | 374 | 750 |
| 10. ලංකා ඛණිජ වැලි | ඉල්මනයිට් ටොන් ... | 60000 | 46953 | 38380 | 60000 |
| | රුටයිල් ටොන් ... | — | — | — | — |
| | සිර්කොන් ටොන් ... | — | — | — | — |

II (ඇ) 1

**විකුණුම් ප්‍රමාණය – 1964–65 සිට 1968–69 (අ)**

| 1965–66 | | 1966–67 | | | 1967–68 | | | 1968–69* | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් |
| 17165 | — | — | 18583 | — | — | 22763 | — | — | 30776 | — |
| 229 | ල.නො. | — | 17 | ල.නො. | — | 1217 | ල.නො. | — | 2852 | ල.නො. |
| 16935 | 16353 | 59250 | 18566 | 17203 | 59250 | 20382 | 19526 | 59250 | 24968 | 23084 |
| — | — | — | — | — | — | — | — | 25000 | 11514 | 6011 |
| 7361 | 5987 | 8050 | 9156 | 6684 | 9000 | 9500 | 6014 | 9000 | 8333 | 9765 |
| 10767 | 11241 | 6200 | 10327 | 6792 | 8500 | 7215 | 8213 | 8500 | 12000 | 12000 |
| 6500ඇ | 4453 | — | 12600ඇ | 7644 | — | 6700ඇ | 7155 | — | 6992ඇ | 8510 |
| 852 | ල.නො. | 880 | 814 | ල.නො. | 940 | 954 | ල.නො. | 940 | 1021 | 1000 |
| — | — | 1600 | 189 | ල.නො. | 1600 | 1180 | ල.නො. | 1600 | 1133 | 1325 |
| — | — | — | — | — | 500 | 110 | ල.නො. | 500 | 280 | 194 |
| — | — | — | — | — | 300 | 125 | ල.නො. | 300 | 169 | 133 |
| 435 | 1054 | 5000 | 2027 | 1916 | 5000 | 2600 | 2181 | 5000 | 2750 | 2283 |
| 2050 | 1442 | 22320 | 1759 | 2207 | 22320 | 1300 | 1293 | 22320 | 1447 | 1447 |
| 23810 | 23754 | 31200 | 29234 | 29144 | 31200 | 30011 | 30383 | 31200 | 53016 | 56060 |
| — | — | — | — | — | 5400 | 350 | 220 | 5400 | 8028 | 1334 |
| — | — | — | — | — | 5400 | 22 | ... | 5400 | 673 | 175 |
| — | — | — | — | — | — | — | — | — | 104 | 20 |
| 13677 | — | 18000 | 19649 | — | 25000 | 19807 | — | 25000 | 25349 | — |
| 714 | 727 | 1260 | 987 | 988 | 1300 | 977 | 974 | 1300 | 1163 | 958 |
| 410 | ල.නො. | 480 | 312 | 338 | 750 | 215 | ල.නො. | 750 | 20 | 306 |
| ල.නො. | 744 | 1250 | 1608 | 1109 | 2400 | 1099 | 1152 | 2400 | 910 | 923 |
| 5 | 5 | 7 | 5 | 5 | 9 | 11 | 11 | 9 | 20 | 18 |
| 514 | 165 | 600 | 649 | 118 | 600 | 629 | 145 | 600 | 695 | 156 |
| 184 | 211 | 216 | 246 | 244 | 216 | 260 | 255 | 271 | 309 | 307 |
| 248 | 46 | 300 | 289 | 22 | 300 | 334 | 26 | 300 | 342 | ල.නො. |
| 1082 | 1082 | 1500 | 1002 | 1002 | 1500 | 970 | 970 | 1500 | 1021 | — |
| 288 | 288 | 1400 | 397 | 397 | 1400 | 540 | 540 | 1400 | 639 | 482 |
| 11 | 11 | — | 89 | 89 | 175 | 121 | 121 | 175 | 205 | 196 |
| 84477 | 86578 | 120000 | 81575 | 75105 | 265000 | 206631 | 214699 | 275000 | 240683 | 228246 |
| 84477 | 86578 | 120000 | 81575 | 75105 | 165000 | 160491 | 164981 | 175000 | 155233 | 146083 |
| — | — | — | — | — | 100000 | 46140 | 49718 | 100000 | 85450 | 82163 |
| 3299 | 3299 | 21000 | 2587 | 2587 | 21000 | 1403 | 1403 | 21000 | 3545 | 3545 |
| 729 | 707 | 600 | 871 | 832 | 600 | 426 | 503 | 600 | 735 | 782 |
| 6492 | 6379 | 19200 | 915 | 2539 | 19200 | 5789 | 5789 | 19200 | 4542 | 4542 |
| 379 | 307 | 750 | 249 | 282 | 750 | 500 | 480 | 750 | 480 | 347 |
| 53742 | 50575 | 90000 | 53265 | 55480 | 90000 | 48281 | 73430 | 90000 | 71464 | 73430 |
| — | — | — | — | — | — | — | — | 10500 | 1277/ඊ | — |
| — | — | — | — | — | — | — | — | 9500 | — | — |

සංඛ්‍යා සටහන

රාජ්‍ය කර්මාන්තවල වාර්ෂික ධාරිතාව, නිපයුම් හා

| සමායතනය | නිමැවුම් ඒකකය | 1964/65 | | | |
|---|---|---|---|---|---|
| | | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව |
| 11. ජාතික ලුණු | ලුණු ටොන් ... | 20000 | 10926 | 4527 | 30000 |
| 12. ජාතික පේෂකර්ම | කපු නූල් රාත්තල් '000 ... | 3400 | 1971 | 2112 | 3400 |
| | රෙදිපිළි යාර '000 ... | — | — | — | 14000 |
| 13. ජාතික සුළු කර්මාන්ත | ගෘහ භාණ්ඩ වටිනාකම රු. '000... | — | 3868 | 3814 | — |
| | ගඩොල් සහ උළු වටිනාකම රු'000... | — | — | — | — |
| | ඖෂධ වටිනාකම රු. '000... | — | — | — | — |
| 14. ලංකා වානේ (උ) | තැලුනු කොටස් මෙට්‍රික් ටොන් ... | — | — | — | — |
| | කම්බි නිෂ්පාදිත එම ... | — | — | — | — |
| 15. ලංකා ටයර් (ඌ) | ටයර් ගණනින් ... | — | — | — | — |
| | ටියුබ් ගණනින් ... | — | — | — | — |
| | පතු ගණනින් ... | — | — | — | — |
| 16. ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ | උදලු '000 ... | — | — | — | — |
| | අනෙකුත් කෘෂි උපකරණ '000 ... | — | — | — | — |
| | ගොඩනැගිලි උපකරණ '000 ... | — | — | — | 895 |
| | ජල නල සවිකිරීම් '000 ... | — | — | — | — |
| | හැඳි ගෑරුප්පු ආදිය '000 ... | — | — | — | — |
| | වඩු උපකරණ '000 ... | — | — | — | — |
| | ඉංජිනේරු උපකරණ '000 ... | — | — | — | — |
| 17. ලංකා පෝර | පොහොර ටොන් ... | — | 79733/ඇ | 24283 | — |
| 18. ලංකා ධීවර | මාළු රාත්තල් '000 ... | — | — | — | — |
| | (අ) අල්ලාගත් මාළු ... | — | — | — | — |
| | (ආ) මිලට ගත් මාළු ... | — | — | — | — |
| | කරවල රාත්තල් '000 ... | — | — | — | — |
| | මත්ස්‍ය ආහාර රාත්තල් '000 ... | — | — | — | — |
| | අක්මා තෙල් රාත්තල් '000 ... | — | — | — | — |
| 19. ලංකා පිටි නිෂ්පාදන (ඒ) | පිටි ටොන් ... | — | — | — | — |
| | අනු නිෂ්පාදිත ටොන් ... | — | — | — | — |

* තාවකාලිකයි.

(අ) සියළුම සංඛ්‍යා සංස්ථාවන්හි මුදල් වර්ෂයන් හා සම්බන්ධ වෙයි. ජාතික කිරි මණ්ඩලය ලිත් වර්ෂය නව මුදල් වර්ෂය වශයෙන් යොද ගෙන තිබේ. අනෙකුත් සියළුම සංස්ථා අප්‍රේල් සිට මාර්තු දක්වා ඇති මුදල් වර්ෂයන් යොද ගෙන තිබේ.

(ආ) නිෂ්පාදනය ඇරඹුනේ 1968 මාර්තු සිට ය.

(ඇ) ආනයන කළ ප්‍රමාණය පිළිබිඹු වෙයි.

## II (ඇ) 1

## විකුණුම් ප්‍රමාණය — 1964/65 සිට 1968/69 (අ)

| 1965/66 | | 1966/67 | | | 1967/68 | | | 1968/69* | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් | ධාරිතාව | නිමැවුම් | විකුණුම් |
| 19127 | 13900 | 70000 | 63468 | 60800 | 70000 | 74611 | 77546 | 78000 | 90885 | 77688 |
| 2658 | 2323 | 3400 | ල.නො. | 2270 | 3400 | 2669 | 1000 | 3400 | 2315 | 456 |
| 439 | — | 14000 | 2810 | 1924 | 14000 | 6682 | 5431 | 14000 | 6166 | 5208 |
| 4575 | 4634 | — | 4642 | 4404 | — | 4584 | 4624 | — | 4177 | 5175 |
| 1700 | 659 | — | 2710 | 2018 | — | 3005 | 1997 | — | 3057 | 3234 |
| — | — | — | 1283 | 416 | — | 1368 | 642 | — | 1080 | 1083 |
| — | — | — | — | — | 60000 | 25425 | 24407 | 60000 | 26505 | 15950 |
| — | — | — | — | — | 12000 | 3343 | 3007 | 12000 | 4822 | 4976 |
| — | — | — | — | — | 250000 | 57622 | 28284 | 250000 | 62124 | 65260 |
| — | — | — | — | — | 152000 | 62062 | 33063 | 152000 | 43108 | 46177 |
| — | — | — | — | — | 88000 | 29477 | 17873 | 88000 | 2921 | 7004 |
| — | — | 200 | 12 | 12 | 200 | 214 | 138 | 281 | 187 | 141 |
| — | — | — | — | — | 13 | 5 | 1 | 121 | 8 | 5 |
| 46 (එ) | — | 895 | 437 | 415 | 935 | 1023 | 704 | 1045 | 1147 | 600 |
| — | — | — | — | — | 244 | 173 | 57 | 269 | 34 | 42 |
| — | — | — | — | — | 500 | 29 | 15 | 600 | 73 | 51 |
| — | — | — | — | — | 65 | 12 | 5 | 195 | 18 | 13 |
| — | — | — | — | — | — | — | — | 274 | 3 | 2 |
| 90180 (ඇ) | 101241 | — | 145000 (ඇ) | 111789 | — | 177182 (ඇ) | 157756 | — | 220000 (ඇ) | 192080 |
| | | — | | — | | | | — | | — |
| 5138 | 3930 | — | 8467 | 7178 | — | 9767 | 6711 | — | 11784 | 6717 |
| 2527 | — | — | 5980 | — | — | 6633 | — | — | 9976 | — |
| 2611 | — | — | 2487 | — | — | 3134 | — | — | 1808 | — |
| 64 | 37 | — | 345 | 333 | — | 378 | 366 | — | 640 | 518 |
| 41 | 41 | — | 104 | 98 | — | 85 | 85 | — | 74 | 61 |
| 14 | — | — | 23 | 28 | — | 23 | 31 | — | 33 | 35 |
| — | — | — | — | — | — | — | — | 70000 | 4245 | 3245 |
| — | — | — | — | — | — | — | — | — | 1357 | 2115 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.
(සමායතනයන්ගෙන් සැපැයුන දත්තයන් ගෙනි)

* තාවකාලිකයි.

(ඇ) සංස්ථාවේ මුළු නිමැයුම 3 න් පට තුනී ලෑලි වල සමකයක් වශයෙන් දක්වා ඇත. විකුණුම් සංඛ්‍යා ලබා ගත හැකිව ඇත්තේ නිම කළ නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් පමණි. ඒවා වෙන් වශයෙන් දක්වා ඇත. සංස්ථාව විසින් සාදන සුළු ප්‍රමාණවල වෙනත් නිෂ්පාදිතයන් මෙහි ඇතුළත් කර නොමැත.

(ඉ) 1966 සැප්තැම්බරයේ දී සංස්ථාව විසින් ගල්ඔය කර්මාන්ත ශාලාව පවරා ගන්නා ලදී.

(ඊ) නිෂ්පාදනය, 1968 ජූලි මාසයේදී ඇරඹුනි. එම නිසා මෙහි දක්වා ඇති සංඛ්‍යා 1968 ජූලි සිට 1969 මාර්තු දක්වා වන කාල සීමාව සඳහා වෙයි.

(උ) 1967 අප්‍රේල් මාසයේදී නිෂ්පාදනය අරඹන ලදී.

(ඌ) 1967 මැයි මාසයේ දී නිෂ්පාදනය අරඹන ලදී.

(එ) 1966 පෙබරවාරි මාසයේ දී නිෂ්පාදනය අරඹන ලදී.

(ඒ) 1968 ජූලි මාසයේ දී නිෂ්පාදනය අරඹන ලදී.

## රාජ්‍ය කර්මාන්තවල විකුනුම්හි වටිනාකම, ලාභාලාභ, සහ ආයෝජන ප්‍රමාණය

| සමායතනය | විකුණුම්හි වටිනාකම 1964/65 | 1965/66 | 1966/67 | 1967/68 (ඇ) |
|---|---|---|---|---|
| 1. ජාතික කිරි මණ්ඩලය ... ... ... ... ... | 9,566 | 10,160 | 10,717 | 13,227 |
| (අ) සකස් කරන මධ්‍යස්ථාන ... ... ... ... | 9,566 | 10,160 | 10,717 | 13,227 |
| (ආ) උකුකළ කිරි කර්මාන්තශාලාව ... ... ... | — | — | — | — |
| (ඇ) විස නැසූ කිරි යෝජනාක්‍රමය ... ... ... | — | — | — | — |
| 2. නැගෙනහිර කඩදසි කර්මාන්ත ශාලාව ... ... ... | 15,964 | 27,737 | 33,430 | 32,004 |
| (අ) නිෂ්පාදනය | | | | |
| (1) කඩදසි කර්මාන්තශාලාව ... ... ... | 13,864 | 14,537 | 16,230 | 14,604 |
| (2) කඩදසි බෝඩ් කර්මාන්ත ශාලා යෝජනා ක්‍රම ... | — | — | — | — |
| (ආ) වෙළෙඳ ... ... ... ... ... | 2,100 | 13,200 | 17,200 | 17,400 |
| 3. ලංකා පිඟන් බඩු ... ... ... ... ... | 2,932 | 3,348 | 4,421 | 10,075 |
| (අ) මීගමු කර්මාන්තශාලාව ... ... ... ... | 2,658 | 3,058 | 3,219 | 4,000 |
| (ආ) පිළියන්දල කර්මාන්තශාලාව ... ... ... | — | — | 675 | 5,475 |
| (ඇ) කියොලින් පිරිපහදු ... ... ... ... | 274 | 290 | 527 | 600 |
| 4. ලංකා තෙල් සහ මේද ... ... ... ... ... | 10,179 | 12,304 | 18,406 | 18,747 |
| (අ) පොල් තෙල් යන්ත්‍රාගාරය ... ... ... ... | 2,421 | 1,760 | 2,665 | 1,660 |
| (ආ) ප්‍රවැන්ඩර් යන්ත්‍රාගාරය ... ... ... ... | 6,134 | 9,232 | 11,330 | 14,666 |
| (ඇ) මේද අම්ල යන්ත්‍රාගාරය ... ... ... ... | — | — | — | 357 |
| (ඈ) ග්ලිසරින් යන්ත්‍රාගාරය ... ... ... ... | — | — | — | ... |
| (ඉ) අනෙකුත් යන්ත්‍රාගාර ... ... ... ... | 1,624 | 1,312 | 4,411 | 2,064 |
| 5. ලංකා තුනී ලෑලි ... ... ... ... ... | 5,039 | 5,103 | 6,749 | 7,839 |
| (අ) ගිංතොට කර්මාන්ත ශාලාව ... ... ... | 5,039 | 5,102 | 6,749 | 7,839 |
| (ආ) අවිස්සාවේල්ල කර්මාන්තශාලාව ... ... ... | — | — | — | — |
| 6. ලංකා සම්භාණ්ඩ නිෂ්පාදනය ... ... ... ... | 3,817 | 4,507 | 5,230 | 4,893 |
| (අ) සපත්තු කර්මාන්තශාලාව ... ... ... ... | 3,368 | 4,010 | 4,795 | 4,417 |
| (ආ) සම්පදම් කරන ස්ථාන ... ... ... ... | 449 | 497 | 425 | 476 |
| 7. පරන්තන් රසායන ද්‍රව්‍ය ... ... ... ... | 1,642 | 3,437 | | |
| (අ) නිෂ්පාදනය ... ... ... ... ... | 1,406 | 1,588 | 2,019 | 2,442 |
| (ආ) වෙළෙඳාම ... ... ... ... ... | 236 | 1,849 | — | — |
| 8. ලංකා සිමෙන්ති ... ... ... ... ... | 13,573 | 15,244 | 15,815 | 39,898 |
| (අ) කන්කසන්තුරේ කර්මාන්ත ශාලාව ... ... ... | 13,573 | 15,244 | 15,815 | 29,656 |
| (ආ) ගාල්ලේ කර්මාන්ත ශාලාව ... ... ... | — | — | — | 10,242 |
| (ඇ) පුත්තලමේ කර්මාන්ත ශාලාව ... ... ... | — | — | — | — |
| 9. ශ්‍රී ලංකා සීනි (ඉ) ... ... ... ... ... | 8,495 | 14,926 | 21,592 | 21,777 |
| (අ) කන්තලේ කර්මාන්ත ශාලාව ... ... ... | 8,495 | 14,926 | 15,743 | 10,008 |
| (1) සීනි ... ... ... ... ... | 1,104 | 1,846 | 852 | 702 |
| (2) ස්ප්‍රිත්තු ... ... ... ... ... | 7,391 | 13,080 | 14,891 | 9,306 |
| (ආ) ගල්ඔය කර්මාන්ත ශාලාව ... ... ... | 9,604 | 7,829 | 5,849 | 11,769 |
| (1) සීනි ... ... ... ... ... | 2,753 | 2,254 | 822 | 2,887 |
| (2) ස්ප්‍රිත්තු ... ... ... ... ... | 6,851 | 5,575 | 5,027 | 8,882 |
| 10. ලංකා ඛණිජ වැලි ... ... ... ... ... | 946 | 1,372 | 1,453 | 2,503 |
| (අ) ඉල්මනයිට් කර්මාන්ත ශාලාව ... ... ... | 946 | 1,372 | 1,453 | 2,503 |
| (ආ) අනු නිෂ්පාදිත කර්මාන්ත ශාලාව ... ... | — | — | — | — |
| 11. ජාතික ලුණු ... ... ... ... ... ... | 407 | 1,112 | 5,463 | 7,025 |

**1964/65 සිට 1968/69 දක්වා — (අ) සංඛ්‍යා සටහන II (ඇ) 2**

රුපියල් දහස්

| | ලාභ (+) හෝ පාඩු (—) (ආ) | | | | | ආයෝජිත ප්‍රාග්ධන (ඇ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1968-69 (ඇ) | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68 (ඇ) | 1968-69 (ඇ) | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68 (ඇ) | 1968-69 (ඇ |
| 23,517 | 1,392 | 641 | −889 | −1,5000 | − 63 | 14,751 | 14,741 | 14,741 | 20,352 | 22,971 |
| 16,890 | −1,392 | −641 | −889 | −1,500 | −513 | 11,956 | 11,956 | 11,956 | 13,156 | 14,506 |
| 6627 | — | — | — | — | + 450 | 2,785 | 2,785 | 2,785 | 5,696 | 6,300 |
| — | — | — | — | — | — | — | — | — | 1,500 | 2,165 |
| 43,301 | + 766 | +3,159 | +3,783 | + 3,919 | + 6,440 | 29,000 | 29,000 | 29,000 | 29,000 | 35,700 |
| 24,601 | — 250 | +1,617 | +1,072 | + 1,496 | + 5,040 | 29,000 | 29,000 | 29,000 | 29,000 | 29,000 |
| — | — | — | — | — | — | — | — | — | — | 6,700 |
| 18,700— | + 516 | +1,542 | +2,711 | + 2,423 | + 1,400 | — | — | — | — | — |
| 13,004 | + 276 | + 442 | + 775 | + 1,802 | + 4,008 | 8,075 | 8,075 | 19,000 | 20,000 | 20,000 |
| 4,756 | + 378 | + 581 | + 728 | + 743 | + 987 | 5,000 | 5,000 | 5,000 | 5,000 | 5,000 |
| 7,604 | — | — | + 24 | + 989 | + 2,830 | — | — | 10,934 | 11,925 | 11,925 |
| 644 | − 102 | − 139 | + 23 | + 70 | + 191 | 3,075 | 3,075 | 3,075 | 3,075 | 3,075 |
| 23,388 | + 215 | + 568 | − 1,611 | + 642 | + 4,552 | 21,900 | 21,940 | 21,940 | 21,940 | 27,940 |
| 629 | − 1,010 | − 904 | − 2,033 | − 1,288 | + 549 | | | | | |
| 19,088 | +1,289 | +1,963 | +1,359 | + 609 | + 435 | | | | | |
| 2,731 | — | — | — | — | — | | | | | |
| 239 | — | — | — | + 970 | + 3,118 | | | | | |
| 701 | − 64 | − 491 | − 937 | + 353 | + 450 | | | | | |
| 10,265 | + 378 | + 14 | + 597 | + 281 | + 1,603 | 2,800 | 2,800 | 2,800 | 3,456 | 14,800 |
| 10,265 | + 378 | + 14 | + 597 | + 182 | + 1,603 | 2,800 | 2,800 | 2,800 | 2,800 | 2,800 |
| — | — | — | — | — | — | — | — | — | 656 | 12,000 |
| 7,889 | + 309 | + 214 | + 391 | + 187 | + 413 | 5,200 | 5,200 | 5,200 | 6,245 | 6,245 |
| 7,147 | — | — | — | — | — | 3,500 | 3,500 | 3,500 | 4,225 | 4,225 |
| 742 | — | — | — | — | — | 1,700 | 1,700 | 1,700 | 2,020 | 2,020 |
| 4,920 | — 614 | — 471 | + 270 | + 733 | + 865 | 12,321 | 12,321 | 12,321 | 12,321 | 12,321 |
| — | − 674 | − 887 | − 569 | − 124 | | 12,321 | 12,321 | 12,321 | 12,321 | 12,321 |
| — | + 60 | + 416 | + 839 | + 857 | | — | — | — | — | — |
| 48,046 | +4,441 | +9,628 | +8,004 | +13,875 | +13,160 | 51,622 | 61,442 | 100,533 | 110,138 | 170,114 |
| 29,448 | +4,441 | +9,628 | +8,004 | +12,550 | +13,070 | 38,120 | 44,534 | 50,197 | 52,120 | 65,952 |
| 18,598 | — | — | — | + 1,325 | + 90 | 7,578 | 10,275 | 13,514 | 14,489 | 18,234 |
| — | — | — | — | — | — | 5,924 | 6,633 | 36,822 | 43,529 | 85,928 |
| 25,455 | + 900 | +6,725 | +7,657 | + 4,500 | + 4,140 | 33,300 | 33,700 | 151,900 | 157,621 | 163,911 |
| 16,467 | + 900 | +6,725 | +7,814 | + 500 | + 5,140 | 33,300 | 33,700 | 34,700 | 35,700 | 35,000 |
| 2,007 | ල.නො. | ල.නො. | − 2,763 | − 2,500 | — 4,360 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| 14,460 | ල.නො. | ල.නො. | +10,577 | + 3,000 | + 9506 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| 8,988 | − 6,195 | − 6,295 | − 157 | − 5,000 | − 1,000 | 112,900 | 117,200 | 117,200 | 122,521 | 128,911 |
| 2,571 | −12,182 | −12,391 | − 5,094 | − 10,000 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| 6,417 | +5,987 | +6,096 | +4,937 | 5,000 | ල.නො. | | | | | |
| 3,150 | − 502 | − 600 | + 54 | + 192 | + 1,088 | 10,100 | 11,100 | 11,100 | 11,100 | 14,875 |
| 3,150 | − 502 | − 600 | + 54 | + 192 | + 1,088 | 10,100 | 11,100 | 11,100 | 11,100 | 11,375 |
| — | — | — | — | — | — | | — | — | 3,500 | 3,500 |
| 7,049 | + 860 | + 629 | +1,000 | + 2,196 | − 2,500 | 1718 | 2,013 | 6,503 | 8,862 | 13,067 |

## II (ඈ) 2 සංඛ්‍යා සටහන හා සම්බන්ධයි

| සමායතනය | විකුනුම්හි වටිනාකම | | | |
|---|---|---|---|---|
| | 1964/65 | 1965/66 | 1966/67 | 1967/68 |
| 12. ජාතික පේෂකර්ම ... ... ... ... ... | 7,274 | ල.නො. | 9,700 | 12,988 |
| (අ) වේයන්ගොඩ කර්මාන්ත ශාලාව ... ... ... | 7,274 | ල.නො. | 9,700 | 12,988 |
| (ආ) තුල්හිරිය යෝජනා ක්‍රමය ... ... ... ... | — | — | — | — |
| (ඇ) අනෙකුත් යෝජනා ක්‍රමය ... ... ... ... | — | — | — | — |
| ... ... ... ... ... | — | — | — | — |
| 13. ජාතික සුළු කර්මාන්ත ... ... ... ... ... | 3,814 | 5,293 | 6,838 | 7,263 |
| (අ) වඩු වැඩ අංශය ... ... ... ... ... | 3,814 | 4,634 | 4,404 | 4,624 |
| (ආ) ගඩොල් සහ උළු කර්මාන්ත ශාලාව ... ... ... | — | 659 | 2,018 | 1,997 |
| (ඇ) ආයුර්වේද ඖෂධ කර්මාන්ත ශාලාව ... ... ... | — | — | 416 | 642 |
| 14. ලංකා වානේ ... ... ... ... ... | — | — | — | 25,665 |
| 15. ලංකා ටයර් ... ... ... ... ... ... | — | — | — | 8,541 |
| 16. ලංකා රාජ්‍ය ලෝහ ... ... ... ... ... | — | 23 | 513 | 2,564 |
| (අ) ලෝහ කර්මාන්ත ශාලාව ... ... ... ... | — | 23 | 513 | 2,564 |
| (අ ) වීනච්චට්ටි කර්මාන්ත ශාලාව ... ... ... | — | — | — | — |
| 17. ලංකා පොහොර ... ... ... ... ... | 9,795 | 41,339 | 47,000 | 68,838 |
| (අ) මිශ්‍ර කිරීමේ යන්ත්‍රාගාර ආදිය ... ... ... | 9,795 | 41,339 | 47,000 | 68,838 |
| (ආ) පොහොර ගබඩා ... ... ... ... ... | — | — | — | — |
| (ඇ) කර්මාන්ත ශාලා යෝජනා ක්‍රමය ... ... ... | — | — | — | — |
| 18. ලංකා ධීවර ... ... ... ... ... ... | — | 2,718 | 7,029 | 8,229 |
| (අ) ධීවර යාත්‍රා සහ අලෙවි ව්‍යාප්තිය ... ... ... | — | 2,718 | 7,029 | 8,229 |
| (ආ) ධීවර වරාය සහ බෝට්ටු නැවතුම් පොලවල් ... ... | — | — | — | — |
| 19. රාජ්‍ය පිටි කර්මාන්ත ශාලාව ... ... ... ... | — | — | — | |
| 20. රාජ්‍ය පොහොර නිෂ්පාදන (උ) ... ... ... ... | — | — | — | — |
| 21. ලංකා ඛණිජ තෙල් — පිරිපහදු (උ) ... ... ... | — | — | — | — |
| 22. රාජ්‍ය මුද්‍රණ (උ) ... ... ... ... ... | | | | |
| 23. රාජ්‍ය දැව ... ... ... ... ... ... | — | — | — | — |

(අ) සියළුම සංඛ්‍යා සමායතනයන්හි මුදල් වර්ෂයන් අනුව වේ. ජාතික කිරි මණ්ඩලය සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සිය මුදල් වර්ෂය ලෙස ලිත් වර්ෂය අනුගමනය කරයි. අනෙකුත් සියලුම සමායතන අප්‍රේල් සිට මාර්තු, මුදල් වර්ෂය ලෙස සලකයි.

(ආ) අයබදු කිරීමට පෙර.

(ඇ) ක්ෂය කිරීම් හැර, මුදල් වර්ෂාවසානයට වූ සමුච්චිත එකතුව

(ඈ) තාවකාලිකයි.

| 1968/ 9 (ඇ) | ලාභ (+) හෝ පාඩු (—) (ආ) | | | | | ආයෝජිත ප්‍රාග්ධන (ඈ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1965/66 | 1965/66 | 1966/67 | 1967/68 (ඈ) | 1968/69 (ඇ.) | 1264/65 | 1965/66 | 1966/67 | 1967/68 (ඈ) | 1968/69 (ඈ) |
| 13,484 | +1,368 | +1,335 | + 719 | + 1,964 | +3,546 | 45,400 | 50,300 | 54,467 | 64,500 | 93,600 |
| | +1,368 | +1,335 | + 719 | +1,964 | +3,546 | 45,400 | 50,000 | 53,300 | 53,300 | 53,300 |
| — | — | — | — | — | — | — | — | 1,167 | 7,208 | 40,300 |
| — | — | — | — | — | — | | | | | |
| — | — | — | — | — | — | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| 9,492 | − 1,468 | − 1,004 | − 1,154 | − 1,160 | − 515 | 14,632 | 19,832 | 21,410 | 21,760 | 22,760 |
| 5,175 | −1,084 | − 766 | − 841 | − 987 | − 704 | 1,350 | 1,350 | 2,378 | 2,378 | 2,378 |
| 3,234 | − 384 | − 238 | − 439 | − 420 | − 45 | 12,249 | 17,282 | 17,832 | 18,182 | 19,182 |
| 1,083 | — | — | + 126 | + 247 | + 234 | 1,033 | 1,200 | 1,200 | 1,200 | 1,200 |
| 22,652 | — | — | — | + 1,988 | + 7,827 | 80,273 | 94,395 | 115,900 | 121,065 | 123,300 |
| 25,187 | — | — | — | + 800 | + 3,000 | 37,721 | 58,731 | 67,396 | 67,525 | 67,525 |
| 2,985 | — | − 28 | − 1,052 | — 37 | + 2,132 | — | 15,127 | 16,704 | 30,170 | 43,455 |
| 2,985 | — | − 28 | − 1,052 | — 37 | + 2,132 | — | 15,127 | 16,249 | 15,667 | 21,952 |
| — | — | — | — | — | — | — | — | 455 | 14,503 | 21,503 |
| 99,245 | + 235 | +2,204 | +2,073 | + 1,210 | + 5,939 | 90 | 165 | 927 | 2,463 | 13,600 |
| 99,245 | + 235 | +2,204 | +2,073 | + 1,210 | + 5,939 | 90 | 165 | 245 | 377 | 600 |
| — | — | — | — | — | — | — | — | 681 | 1,922 | 6,000 |
| — | — | — | — | — | — | — | — | 1 | 164 | 7,000 |
| 9,089 | — | − 1,447 | − 3,400 | − 3,553 | − 2,800 | — | ල.නො. | 11,077 | 13,632 | 53,800 |
| 9,089 | — | − 1,447 | − 3,400 | − 3,553 | − 2,800 | — | ල.නො. | 9,346 | 9,684 | 30,721 |
| — | — | — | — | — | — | — | ල.නො. | 1,731 | 3,948 | 23,078 |
| 2,687– | — | — | — | — | ල.නො. | 5,194 | 11,115 | 15,153 | 19,992 | 29,106 |
| — | — | — | — | — | — | — | — | 800 | 2,800 | 10,000 |
| — | — | — | — | — | — | — | — | 8,075 | 17,521 | 65,521 |
| | | | | | | | | | | |
| ල.නො. | — | — | — | — | ල.නො. | — | — | — | — | 2,500 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව (සමායතනවලින් සැපැයූ දත්තයන් වලින්)

(ඉ) අයවැය ලේඛනයෙන් වෙන් කැරුන හෝ ඇස්තමේන්තු ගත සංඛ්‍යා.

(ඊ) 1966 සැප්තැම්බරයේ දී සමායතනය විසින් ගල්ඔය කර්මාන්ත ශාලාව ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය යෙන් ලබා ගන්නා ලදී. ගල්ඔය කර්මාන්ත ශාලාව ඔක්තෝබර් සැප්තැම්බර් මුදල් වර්ෂය ඇතුළත ක්‍රියාකළ හෙයින්, 65/66 දක්වා වූ සංඛ්‍යා සංස්ථාවේ සංඛ්‍යා සමග සමුච්චිත කොට නොමැත.

(උ) 1968 දෙසැම්බර් වල දී විකුණුම් අරඹන ලදී.

(ඌ) තවම නිෂ්පාදනයේ නොයෙදේ.

## සංඛ්‍යා සටහන II (ඇ) 3.
## සේවා නියුක්තිය — රාජ්‍ය කර්මාන්ත — 1966/67 සිට 1968/69

| සමායතනය | විධායක | | | ලිපිකාර, විධායක නොවන | | | කර්මාන්තශාලා කම්කරුවන් | | | මුළු ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1966/67 | 1967/68 | 1968/69 | 1966/67 | 1967/68 | 1968/69 | 1966/67 | 1967/68 | 1968/69 | 1966/67 | 1967/68 | 1968/69* |
| 1. ජාතික කිරි මණ්ඩලය ... | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | 889 | 1,275 | 1,171 |
| 2. නැගෙනහිර කඩදසි කර්මාන්ත ශාලාව ... | 32 | 35 | 36 | 219 | 229 | 250 | 611 | 662 | 793 | 862 | 926 | 1,079 |
| 3. ලංකා පිඟන් බඩු ... | 29 | 34 | 38 | 71 | 123 | 95 | 736 | 745 | 788 | 836 | 902 | 921 |
| 4. ලංකා තෙල් සහ මේද ... | 28 | 26 | 26 | 93 | 109 | 113 | 575 | 557 | 583 | 696 | 697 | 722 |
| 5. ලංකා තුනී ලෑලි ... | 10 | 12 | 9 | 67 | 69 | 44 | 692 | 697 | 989 | 769 | 778 | 1,042 |
| 6. ලංකා සම්භාණ්ඩ නිෂ්පාදනය... | 15 | 13 | 13 | 88 | 99 | 101 | 485 | 531 | 547 | 588 | 643 | 661 |
| 7. පරන්තන් රසායනික ... | 11 | 14 | 14 | 29 | 37 | 37 | 240 | 259 | 263 | 280 | 310 | 314 |
| 8. ලංකා සිමෙන්ති ... | 51 | 65 | 73 | 305 | 334 | 358 | 1,171 | 1,364 | 1,476 | 1,527 | 1,763 | 1,907 |
| 9. ශ්‍රී ලංකා සීනි (ආ) ... | ල. නො. | 36 | 42 | ල. නො. | 897 | 520 | ල. නො. | 1,083 | 1,768 | 2,933 | 2,016 | 2,333 |
| 10. ලංකා ඛණිජ වැලි ... | 4 | 7 | 7 | 21 | 48 | 37 | 76 | 125 | 155 | 101 | 180 | 209 |
| 11. ජාතික ලුණු ... | 16 | 18 | 23 | 36 | 122 | 127 | 402 | 1,257 | 1,158 | 454 | 1,397 | 1,309 |
| 12. ජාතික පේෂකර්ම ... | 12 | 16 | 310 | 73 | 98 | 311 | 1,417 | 1,622 | 1,400 | 1,502 | 1,736 | 2,021 |
| 13. ජාතික කුඩා කර්මාන්ත ... | 42 | 44 | 44 | 483 | 491 | 509 | 1,403 | 1,425 | 1,396 | 1,928 | 1,960 | 1,949 |
| 14. ලංකා වානේ ... | 29 | 36 | 60 | 49 | 61 | 133 | 518 | 853 | 801 | 596 | 950 | 994 |
| 15. ලංකා ටයර් ... | 19 | 19 | 24 | 43 | 52 | 67 | 698 | 726 | 892 | 760 | 797 | 983 |
| 16. ලංකා රාජ්‍ය ලෝහ ... | 23 | 24 | 30 | 94 | 120 | 124 | 489 | 2,066 | 1,006 | 606 | 2,210 | 1,160 |
| 17. රාජ්‍ය පිටි ඇඹරුම් කම්හල | 9 | 9 | 11 | 19 | 20 | 48 | 34 | 34 | 162 | 62 | 63 | 221 |
| 18. ලංකා පොහොර ... | 10 | 12 | 16 | 70 | 113 | 152 | 31 | 36 | 97 | 111 | 161 | 265 |
| 19. ලංකා ධීවර ... | 89 | 94 | 94 | 862 | 875 | 803 | 411 | 411 | 411 | 1,362 | 1,380 | 1,308 |
| 20. පොහොර නිෂ්පාදන ... | 2 | 3 | ල. නො. | 4 | 4 | ල. නො. | 4 | 4 | ල. නො. | 10 | 11 | ල.නො. |
| 21. ලංකා ඛණිජ තෙල්—තෙල් පිරිපහදු ... | — | ල. නො. | 39 | — | ල. නො. | 43 | — | ල. නො. | 82 | — | 52 | 164 |
| 22. රාජ්‍ය දැව ... | — | — | 42 | — | — | 249 | — | — | 890 | — | — | 1,181 |
| එකතුව | 431 | 517 | 951 | 2,626 | 3,901 | 4,148 | 9,993 | 14,457 | 15,382 | 16,872 | 20,207 | 21,914 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව (සමායතනයන් ගෙන් සැපයුන දත්තයන්)

(අ) 1966/67 සහ 1967/68 සඳහා වන සංඛ්‍යා සාමයතනයන්ගේ මුදල් වර්ෂයන් අනුව වූ ඒවා වෙයි. ජාතික කිරි මණ්ඩලයේ සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වෙයි. අනෙකුත් සියළුම සමායතනයන් මාර්තු මස 31 වැනි දයින් අවසන් වන සේ මුදල් වර්ෂය යොද ගෙන තිබේ. 1968/69 සඳහා දක්වා ඇති සංඛ්‍යා 1968 දෙසැම්බර් 31 වැනි ද දක්වා වූ සංඛ්‍යා වන අතර ඒවා තාවකාලිකය.

(ආ) පූර්ණ සංඛ්‍යා නොවේ.

## සංඛ්‍යා සටහන II (ඇ) 4

## රජයේ කර්මාන්තයන් ගේ අපනයන — 1964/65 සිට 1968/69

| සමායතනය | නිෂ්පාදන ඒකක | 1964/65 ප්‍රමාණය | 1964/65 වටිනාකම රු. '000 | 1965/66 ප්‍රමාණය | 1965/66 වටිනාකම රු. '000 | 1966/67 ප්‍රමාණය | 1966/67 වටිනාකම රු. '000 | 1967/68* ප්‍රමාණය | 1967/68* වටිනාකම රු. '000 | 1968/69* ප්‍රමාණය | 1968/69* වටිනාකම රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ලංකා තෙල් සහ මේද ... | මේද අම්ල ටොන් | — | — | — | — | — | — | 220.0 | 356.7 | 2700.0 | 5400.0 |
| | ග්ලිසරින් – ටොන් | — | — | — | — | — | — | 1.0 | 0.2 | 300.0 | 715.0 |
| 2. ලංකා සම්භාණ්ඩ නිෂ්පාදන | සපත්තු – කුට්ටම් '000 | — | — | — | — | 2.0 | 44.5 | — | — | 20.0 | 984.3 |
| | සම් රාත්තල් '000 | 34.9 | 55.6 | — | — | 5.9 | 9.8 | 11.5 | 13.5 | — | — |
| 3. ලංකා ඛණිජ වැලි ... | ඉල්මනයිට්–ටොන්'000 | 38.4 | 945.7 | 50.6 | 1372.4 | 55.5 | 1453.2 | 73.4 | 2503.0 | 84.0 | 3150.0 |
| 4. පරන්තන් රසායනික ද්‍රව්‍ය ... | ක්ලොරින් – ටොන් | 6.7 | 7.8 | 13.4 | 15.6 | 13.3 | 15.4 | — | — | — | — |
| 5. ලංකා ටයර් ... ... | ටයර් ගණනින් | — | — | — | — | — | — | — | — | 320 | 38.6 |
| | ටියුබ් ගණනින් | — | — | — | — | — | — | — | — | 320 | |
| | පතු ගණනින් | — | — | — | — | — | — | — | — | 120 | |
| 6. ලංකා ධීවර ... ... | මාළු රාත්තල් '000 | — | — | — | — | — | — | 986.6 | 648.1 | 1.9 | 1459.7 |
| | මෝර වරල් රා. '000 | — | — | — | — | 5.9 | 44.8 | 3.7 | 13.7 | 7.1 | 56.5 |
| | අනෙකුත් නිෂ්පාදන රා. '000 | — | — | — | — | — | — | 41.4 | 7.1 | — | — |
| මුළු ඉපැයීම ... | | — | 1009.1 | — | 1388.0 | — | 1567.7 | — | 3542.3 | — | 11804.1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව ( සමායතනයන් විසින් සංඛ්‍යා තොරතුරු සපයන ලදී ).

* තාවකාලිකයි.

1967/68 වර්ෂයේ දී කර්මාන්ත සංස්ථාවන් බොහොමයක ම නිෂ්පාදනය ඉකුත් වසරේ නිෂ්පාදන මට්ටම ඉක්මවා ගොස් තිබේ. නිෂ්පාදනයේ අඩුවීම් වාර්තා වී ඇත්තේ ශ්‍රී ලංකා සීනි සංස්ථාවෙන් ( කන්තලේ කම්හල ) සහ ලංකා ඛණිජ වැලි සංස්ථාවෙන් පමණි. ලංකා තෙල් සහ මේද සංස්ථාවේ සහ පරන්තන් රසායනික සංස්ථාවේ ඇතැම් නිෂ්පාදිතයන් ගේ නිමැවුමෙහි ද පහත වැටීම් ඇති විණි. 1968/69 වසරේ මුල් කාර්තු 3 තෙහි උපනතිනට අනුව, සංස්ථාවන් බොහොමයක් ම ඒවායේ නිෂ්පාදනයන් තවදුරටත් වැඩි කරන ලද බවක් පෙනී යයි. නැගෙනහිර කඩදසි සංයුක්ත මණ්ඩලයේ, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ( ගල්ඔය කම්හල ), ජාතික රෙදිපිළි සංස්ථාව සහ ජාතික සුළු කර්මාන්ත සංස්ථාවෙහි නිෂ්පාදන අඩුවීම් ඇති වෙතැයි අපේක්ෂිතය.

සියළුම සංස්ථාවන්ම පාහේ සිය පූර්ණ නිෂ්පාදන ධාරිතාවනට අඩුවෙන් නිෂ්පාදනය කර ඇති බව ඉහත සඳහන් සංඛ්‍යා සටහන්වලින් පෙනී යයි. මේ අනුව බලන කල, වාර්තාගත වී ඇති ප්‍රමාණයට වඩා අධික නිෂ්පාදනයක් ලබා ගත හැකිව තිබේ.

1967/68 වර්ෂයේදී සංස්ථා බොහොමයක් ම ලාභ ලබා ඇති බැව් වාර්තා විය. පාඩු ලබා ඇති බව වාර්තා වී ඇත්තේ ජාතික කිරි මණ්ඩලය ( 1967 දී ), ලංකා තෙල් සහ මේද සංස්ථාව, ශ්‍රී ලංකා සීනි සංස්ථාව ( ගල්ඔය කම්හලේ දී ඇති වූ පාඩු හේතු කොට ) ජාතික සුළු කර්මාන්ත සංස්ථාව, ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව සහ ලංකා ධීවර සංස්ථාව යන සංස්ථාවන් හී පමණි. 1968/69 තුළ දී සංස්ථාවන් ගේ ක්‍රියාවලිය වඩා යහපත් වන බව පවත්නා උපනතීන් අනුව පෙනී යයි. පාඩු ඇති වෙතැයි අපේක්ෂා කරනුයේ ජාතික සුළු කර්මාන්ත සංස්ථාවෙහි සහ ලංකා ධීවර සංස්ථාවෙහි පමණි. එසේ වුවද, මෙම සංස්ථාවල සාපේක්ෂක කාර්යක්ෂමතාවය හෝ අකාර්යක්ෂමතාවය අගැයීමෙහිලා මූල්‍ය ලාභ හෝ පාඩු යොදවා ගත යුත්තේ ඉතා සුපරික්ෂාකාරිව බව සැලකිය යුතුය. මෙයට හේතු වී ඇත්තේ ඇතැම් සංස්ථාවනට මූල්‍ය වශයෙන් අවාසිදයක සමාජයීය වගකීම්හි නිරතවීමට සිදුවීමය. මේ හැරත්, ඇතැම් සංස්ථාවන් අර්ධ හෝ ආසන්න ඒකාධිකාරිත්වයන් උසුලනු ලබයි.

කර්මාන්ත සංස්ථාවන් කිහිපයක් ම සිය නිෂ්පාදන කාර්යයනට අමතර වශයෙන් වෙළෙඳ කාර්යයන්හි ද නියැලුන බව ද පෙනී ගිය තවත් කරුණෙකි. පොදු වශයෙන් මෙකී වැඩ කටයුතුවලින් සැලකිය යුතු ලාභ ලැබිණි. නැගෙනහිර කඩදසි, පරන්තන් රසායනික, ජාතික රෙදිපිළි සහ ලංකා වානේ සංයුක්ත මණ්ඩල එබඳු සංස්ථා වෙති. මෙකී වෙළෙඳ කටයුතු වල ප්‍රතිඵල නිෂ්පාදන ප්‍රතිඵලවලින් වෙන් කොට දක්වීම සඳහා ii (ඇ) 2 සංඛ්‍යා සටහනෙහි ප්‍රයත්නයක් දරා තිබේ.

මෑතකදී, මෙකී සංස්ථාවන් සිය නිෂ්පාදිතයන් අපනයනය කිරීමට නැඹුරු වන බවත් පෙනේ. ඉකුත් පස් වසර තුළදී, සංස්ථාවන් විසින් කැරුන අපනයනයන්ගේ සංඛ්‍යා 2 (ඇ)4 සංඛ්‍යා සටහනින් දක්වෙයි. 1964/65 වසරේ දී රුපි. දශ ලක්ෂ 1.0 ක්ව පැවති සංස්ථාවන්හි, අපනයන වටිනාකම 1967/68 දී රුපි. දශලක්ෂ 3.5 දක්වා වැඩි වී තිබේ. 1968/69 දී අපනයන රුපියල් දශ ලක්ෂ 11.8 ක් දක්වා වැඩුණු බවට ඇස්තමේන්තු කොට තිබේ. ප්‍රධාන අපනයන කරුවන් වූයේ, ලංකා තෙල් සහ මේද සංස්ථාව ( මේද අම්ල සහ ග්ලිසරින් ) ලංකා ඛණිජ වැලි සංස්ථාව ( ඉල්මනයිට් ) ලංකා ධීවර සංස්ථාව ( මාළු, සහ අනෙකුත් මාළු නිෂ්පාදිත ) යන මේවාය.

විධායකයන්, කාර්යාල සේවකයන් සහ කම්කරුවන් වශයෙන් වර්ග කොට පසුගිය වසර 3 තුළ මෙම කර්මාන්ත සංස්ථාවන්හි සේවක සංඛ්‍යා 2 (ඇ) 3 සංඛ්‍යා සටහනින් දක්වා තිබේ. 1966/67 දී සේවාවේ නියැලි 16,872 සිට 1967/68 දී 20,207 දක්වා සේවා නියුක්තිය වැඩි වී ඇති බව එකී සංඛ්‍යා සටහනින් පෙනී යයි. 1968 දෙසැම්බරයේදී 21,914 දක්වා එය තවත් ඉහලට නැගිනි. මෙකී මුළු ගණනෙහි ප්‍රධාන වැඩිවීම ඇතිවූයේ කම්කරු පිරිසෙහිය. සංස්ථාවන් අතුරින් ප්‍රධාන සේවා යෝජනකයන් වූයේ ශ්‍රී ලංකා සීනි, ජාතික රෙදි පිළි, ජාතික සුළු කර්මාන්ත සහ ලංකා සිමෙන්ති සංස්ථාවන්ය.

ඉහත සඳහන් කර්මාන්ත සංස්ථාවන්ගේ ක්‍රියාකාරිත්වය ගැන විස්තරාත්මක විග්‍රහයක් වෙන් වෙන් වශයෙන් පහත දක්වේ.

**ජාතික කිරි මණ්ඩලය**

" කාර්යක්ෂමව හා අඩු මිලට කිරි නිෂ්පාදනය කිරීම සහ අළෙවි කිරීමේ සේවාවන් " ආරම්භ කිරීම හා පවත්වාගෙන යෑමටත්,1 " ලංකාවේ පාරිභෝගිකයනට සාධාරණ මිලකට

1. 1955 හේ අංක 28, 1957 අංක 9 සහ 1964 අංක 18 දරන පනත් මගින් සංශෝධිත වූ 1954 අංක 12 දරන කිරි මණ්ඩල පනත.

උසස් වර්ගයේ කිරි ප්‍රමාණවත් පරිදි සැපැයීමට '' වෙනත් කිරි නිෂ්පාදන ආයතනයන් නගා ලීමටත්, 1954 දී ජාතික කිරි මණ්ඩලය පිහිටුවනු ලැබීය. මුලදී මෙම මණ්ඩලය කිරි සහ කිරි නිෂ්පාදිතයන් සකස් කිරීම සඳහා කම්හල් කිහිපයක් පිහිටු විය. මෑතක දී නව කර්මාන්ත පිහිටුවමින් මණ්ඩලය සිය කටයුතු ව්‍යාප්ත කළේය.

විශේෂයෙන්ම, ඉකුත් දෙවසර තුළදී, කිරි සකස් කිරීම සහ බෙදහැරීම දියුණු කිරීම මණ්ඩල යේ ක්‍රියාකාරිත්වයන්හි වැදගත් ලක්ෂණයක් විය. කිරි මිලට ගැනීම 1967 දී පයින්ට් දශ ලක්ෂ 4.2 කින් හෙවත් සියයට 22.5 කින් වැඩිවිය. ඉකුත් වසරේදී මිලට ගත් ප්‍රමාණය වැඩි වූයේ පයින්ට් දශ ලක්ෂ 1.4 කිනි. 1968 තුළ දී මිලට ගැනුම් තවත් පයින්ට් දශ ලක්ෂ 8.0 කින් ( හෙවත් සියයට 35.2 කින් ) වැඩිවිය. එසේ වූයේ නිෂ්පාදනය වැඩිකරලීම සඳහා දිරි ගැන්වීමක් වශයෙන්, 1967 ජනවාරි මාසයේ සිට පයින්ට් එකකට නිෂ්පාදකයනට ගෙවන මිල සත 45 ක් වන පරිදි සත 10 කින් එකී මිල වැඩිකිරීම නිසාය. තරමක් දුරට ආනයන කළ පිටි කිරි හිඟය නිසා කිරි සඳහා ඉල්ලුම් වැඩීමේ හේතුවෙන් මණ්ඩලයට සිය ධාරිතා උපයෝගිතාවය වැඩිකරගත හැකිවීම ඉහත කී වැඩි වීමට හේතු වූ තවත් කරුණකි. ඉල්ලුම අඩු වූ නිසා මෑතක් වන තුරුම ඇතැම් මධ්‍යස්ථානයන්හි කිරි මිලට ගැනුම් සීමා විය. මෙකී කිරි මධ්‍යස්ථානවලට අධික කිරි ප්‍රමාණය සකස් කිරීම සඳහා කොළඹට, එවනු ලැබීය. මෙකී කිරිවල අලෙවිය රඳී පැවතුනේ කොළඹ අවට ප්‍රදේශවල ඉල්ලුම අනුවය. නමුත්, මේ අතර උකු කිරි කම්හලක් පිහිටුවූ නිසා මෙම අධික කිරි ප්‍රමාණයන් උකහා ගැනීමට හැකි විය. 1967 සිට කිරි මණ්ඩලයට මේ නයින් සිය ක්‍රියාකාරිත්වය සැලකිය යුතු පරිදි පුළුල් කර ගැනීමට හැකිවිණි.

ඉහත සඳහන් හේතුන් නිසා කිරි සකස් කිරීම ද සමානුපාතිකව මෑත වර්ෂවලදී වැඩි වන්නට විය. 1967 සහ 1968 වර්ෂයන් තුලදී කිරි අලෙවිය පිළිවෙලින් පයින්ට් දශ ලක්ෂ 2.3 කින් හා 3.6 කින් වැඩි විය. මෙකී වැඩිවීම ඇති වූයේ කිරි නිෂ්පාදකයිනට ගෙවන ලද මිල වැඩි කිරීමත් සමග 1967 දී මිල ( සාමාන්‍ය ) සත 10 කින් වැඩි කර තිබියදීත් ය. හිම කි .ම, යෝගට්, සහ දී කිරි වැනි, මණ්ඩලයට අයත් වෙනත් නිෂ්පාදනයන්හි ද සැලකිය යුතු අලෙවිය වැඩිවීමක් දක්නට ලැබිනි. මේ අනුව වූ වැඩි පිරිවැටුම මත, මණ්ඩලයට 1967 දී රුපි. දශ ලක්ෂ 1.5 ක්ව පැවැති සිය අලාභය 1967 දී රුපි. දශ ලක්ෂ 0.5 දක්වා අඩු කර ගත හැකි විය. 1967 දී, ඊට පෙර අවුරුද්දට වඩා පාඩු වැඩි වූයේ බොහෝ දුරටම, '' අතුරු '' දීමනා ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වියදම් වැඩි වූ හෙයිනි. මේ අතර, වෙළෙඳ පොලේ මිලට වඩා සත 10 කින් අඩු සහන මිලකට පාසැල් දරුවනට කිරි සැපයීමේ කාර්යයද මණ්ඩලය විසින් නොකඩවාම ඉටු කැරිණි.

කිරි බෙද හැරීමේදී ඇති වූ ඉහත සඳහන් අලාභ 1968 දී උකු කළ කිරි කර්මාන්ත ශාලාව විසින් උපයන ලද ලාභයන් පමණටත් වඩා මැකී ගියේ ය. 1968 මාර්තු මාසයේ දී නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලද උකු කිරි ටින් දශ ලක්ෂ 25.0 ක වාර්ෂික ධාරිතාවකින් ( නිෂ්පාදන හැකියාවකින් ) යුතු වූ මෙම කර්මාන්ත ශාලාවෙහි 1968 දෙසැම්බර් මාසය වන විට ටින් දශ ලක්ෂ 11.5 ක් නිෂ්පාදනය කරන ලදී. කෙසේ වෙතත්, ආනයනය කළ උකු කිරි වෙළෙඳ පොලෙහි ලබා ගැනීමට තිබුනෙන්, අලෙවිය නිෂ්පාදනයෙන් අඩක් පමණ විය. එසේ වුවද, වර්ෂය තුළ දී එයින් ලද ලාභය රුපි. දශ ලක්ෂ 8.0 ක් වේ යැයි ඇස්තමේන්තු කොට ඇත. එවැනි වැඩි ලාභ ලබා ගැනීමට හැකි වනුයේ, 1968 දී කළා සේ, සාපේක්ෂ ලෙස ලාභ වූ ආනයනය කළ අමු ද්‍රව්‍ය උපයෝගී කොට ගතහොත් පමණක් බැව් සැලකිය යුතු ය. 1969 සිට ආනයනය කළ අමු ද්‍රව්‍ය වෙනුවට දේශීය කිරි අනුක්‍රමික ලෙස උපයෝගී කර ගැනීමට මණ්ඩලය බලාපොරොත්තු වන හෙයින්, අනාගතයේ දී උකු කිරි කම්හලට ලබාගත හැකි වනුයේ මීට වඩා අඩු ලාභ ප්‍රමාණයකි.

### නැගෙනහිර කඩදසි සංයුක්ත මණ්ඩලය

නැගෙනහිර කඩදසි සංයුක්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වූයේ වාලෙයිචෙනයි හි පිහිටි සිය කර්මාන්ත ශාලාවේදී කඩදසි නිෂ්පාදනය කිරීම සහ අලෙවියයි. තවද එය කඩදසි ආනයනය සහ අලෙවියෙහි ද යෙදුනි. 1967/68 දී කඩදසි නිෂ්පාදනය ටොන් 9,500 කින් හෙවත් සියයට 3.7 කින් ඉකුත් වසර අභිබවා වැඩි විණි. කර්මාන්ත ශාලාවේ වාර්ෂික ධාරිතාව ටොන් 950 කින් වැඩි කිරීමෙනුත් පිළිවෙලින් තුන්වෙනි අවුරුද්දටත් තම ධාරිතාව උසස් ලෙස උපයෝගී කර ගැනීමෙනුත්, ඉහතකී වැඩිවීම ඇතිවිණි. 1968/69 වසරේ පළමු කාර්තු තුනෙහි ක්‍රියාකාරිත්වය අනුව සහ මෙම සංස්ථාවේ සැලසුම් අනුව බලන කල, 1968/69 දී නිමැවුම් ඉකුත් වසරේ නිමැවුමට වඩා ටොන් 1,167 කින් පමණ අඩු විය හැකිය. මෙයට හේතුවනුයේ මේතාක් අවධානය යොමුව පැවති ලිවීම් මුද්‍රණ සහ වෙනත් කඩදසි නිෂ්පාදනය වෙනුවට වඩා බර අඩුවූද

( එහෙත් මිලවැඩි ) බැන්ක් සහ බොන්ඩ් කඩදසි නිෂ්පාදනය සඳහා 1968/69 දී වැඩි සැල කිල්ලක් දක්විණ. මෙම වෙනසට හේතුවූයේ මෑත වර්ෂවලදී නොවිකුණුන නානාවිධ කඩදසි තොග ඒක්රැස් වීමයි.

කෙසේ වුවද, ඉකුත් වසරේ දී සඳහන් කළ පරිදි, පෞද්ගලික අංශයේ ඉල්ලුම පහත වැටීම නිසා සංයුක්ත මණ්ඩලයට අලෙවිය පිළිබඳ ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදුවිය. මේ අනුව, සංස්ථාවෙහි අධික තොග රැස්වුනු අතර, ඒවා ඉකුත් වසර දෙකෙහි දී අලෙවි කර ගැනීමට සිදු විය. 1967/68 දී සියයට 10.0 කින් පහත වැටී ටොන් 6,014 ක් ව පැවැති අලෙවි–පරිමාව, 1967/68 දී ඉහළ නැගෙන උපනතියක් දක්විය. පවත්නා උපනතියට අනුව 1968/69 විකුණුම්, සියයට 61.7 කින් සීඝ්‍ර ලෙස වැඩි වී ටොන් 9,765 ක් වනු ඇතැයි අපේක්ෂිත හෙයින්, විකුණුමෙන් ලබන ආදයම රුපියල් දශ ලක්ෂ 10.0 කින් වැඩිවනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. 1967/68 තුළ දී නිෂ්පාදනය කළ කඩදසි විකිණීමෙන් ලත් ලාභයෙහි සුළු වැඩිවීමක් දක්නට විය. මෙය අලෙවි කිරීමේ දුෂ්කරතාවයන් මධ්‍යයෙහි ලැබූ ලාභයකි. එහෙත් 1968/69 වසරේ මුල් කාර්තු තුනෙහි උපනතීනට අනුව, ප්‍රධාන වශයෙන් ම වසරේ අලෙවිය වැඩිවීමේ හේතුව නිසා වැඩි ලාභයක් ඉපැයිය හැකි වන බව පෙනී යයි.

සංස්ථාවේ වෙළෙඳ ක්‍රියාකාරිත්වයන් ගෙන බලන කල, 1967/68දී කඩදසි ටොන් 6,700 ක් සංස්ථාව විසින් ආනයනය කර තිබේ. මෙය 1968/69 දී ටොන් 6,992 දක්වා වැඩිවනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. ඉහත කී ආනයනයන්ගෙන් 1967/68 දී සංස්ථාව ටොන් 7,155 ක් විකුණා ඇති අතර 1968/69 දී ටොන් 8,510 ක් විකිණීමට අදහස් කරයි, වෙළෙඳ කටයුතුවලින් 1967/68 දී ලැබූ ලාභය රුපි දශ ලක්ෂ 2.4 ක් වූ අතර එකී ලාභය ඉකුත් වසරේදිට වඩා සියයට 10.6 කින් අඩුවිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ, අලෙවිය පහත වැටීමය. අනෙක් අතට 1968/69 දී ලැබේ යයි ඇස්තමේන්තු කර ඇති ලාභය රුපි. දශ ලක්ෂ 1.4 දක්වා පහත වැටෙන බැව් පෙනේ. මෙයට හේතු වනුයේ අවප්‍රමාණ කිරීම සහ වි. වි. හි. ස. ක්‍රමය හේතු කොට ගෙන වැඩිවන ආනයන වියදම් නිසා අපේක්ෂිත වැඩි පිරි වැටුපෙන් ලැබෙන ලාභය කැපී යනු ඇතැයි අපේක්ෂිත හෙයිනි.1 සංස්ථාවේ සේවා නියුක්තිය 1966/67 දී පැවැති 862 සිට 1967/68 දී 926 දක්වා වැඩි වී ඇති අතර 1968/69 දී 1,079 ක් වෙයි.

ටොන් 12,000 ක වාර්ෂික ධාරිතාවක් ඇති කඩදසි බෝඩ් කම්හලක් වාලෙච්චේනයි හි පිහිටු වීමෙන් සංස්ථාව සැලකිය යුතු දියුණුවකට පත් විය. මෙම කම්හල සඳහා යන්ත්‍රසූත්‍ර සහ උප කරණ සැපැයීම පිණිස ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ ව්‍යාපාරික ආයතනයක් සමඟ 1968 මාර්තුවේ දී ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම කම්හල 1971 දී පමණ නිෂ්පාදනයෙහි නිරත වනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, ටොන් 15,000 ක වාර්ෂික ධාරිතාවක් සහිත ඇඹිලිපිටියෙහි කල්ක සහ කඩදසි කම්හලක් තැනීම සඳහා ඇති හැකියාවන් පිළිබඳවත් එම ධාරිතාවෙන් ම යුතු තවත් කඩදසි කම්හලක් රාජාංගනයෙහි පිහිටුවීමත් පිළිබඳව ඇති හැකියා වන් සංස්ථාව විසින් හදරා තිබේ.

### ලංකා පිඟන් බඩු සංස්ථාව

පිඟන් බඩු සංස්ථාව විසින් මීගමුවේ ( වාර්ෂික ධාරිතාව ටොන් 940 ) පිලියන්දල ( වාර් ෂික ධාරිතාව 1600 ) පිඟන් බඩු කර්මාන්ත ශාලාවන් දෙකක් ද බොරලැස්ගමුවේ, ( වාර්ෂික ධාරිතාව ටොන් 5000 ) පිඟන් මැටි පිරිපහදු කම්හලක් ද ක්‍රියාත්මක කරවනු ලැබීය.

සංස්ථාවේ පිඟන් බඩු නිමැවුම 1966/67 දී පැවැති ටොන් 1003 සංඛ්‍යාවෙහි සිට 1967/68 දී ටොන් 2,369 දක්වා දෙගුණයක් ද ඉක්මවා වැඩි විණි. 1968/69 වසරේ මුල් කාර්තු තුනේ උපනතීනට අනුව, මෙම වර්ෂයේ දී ටොන් 2,603 දක්වා නිමැවුම තවදුරටත් වැඩි විය හැකිය. 1967/68 දී ඇති වූ වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ පිලියන්දල කම්හල නිෂ්පාදන කාර්යයන් ඇරඹීමය. 1968/69 දී තවත් වැඩිවීමක් ඇති වීමට හේතු වූයේ මීගමු කම්හලේ පිඟන් බඩු ආදී ද සහ පිලියන්දල කම්හලේ සෞඛ්‍යාරක්ෂක භාණ්ඩ සහ පිඟන් ගඩොල් නිපැයුම් වැඩිවීම යයි දක්විය හැකිය. එහෙත්, ඉකුත් දෙවසර තුළ දී මීගමුවේ කර්මාන්ත ශාලාව සිය ධාරිතාව ඉක්මවමින් ද, පිලියන්දල කර්මාන්ත ශාලාව සිය ධාරිතාවට වඩා අඩුවෙන් ද නිෂ්පාදනයෙහි නියළුන බව සැලකිය යුතුය. ඇතැම් කම්හල් විසින් සිය ධාරිතාවනට වඩා අඩුවෙන් නිෂ්පාදනයෙහි යෙදී ඇත්තේ, වෙළෙඳ පොලේ ඉල්ලුම අනුව නිෂ්පාදනය ගැලපීමට තුඩු දෙන සංස්ථාවේ ප්‍රතිපත්තිය හේතුකොට ගෙනය.

1. 1968 ඔක්තෝබර් මාසයේදී වැඩිවූ ආනයන ගාස්තුව පියවා ගැනීම් වස් ආනයනය කළ කඩදසිවල මිල, වැඩි කැරිණි. මේ අනුව 1968-69 දී වෙළෙඳ කටයුතුවලින් ලබන ලාභය අධික විය හැකිය.

වටිනාකම අනුව සංස්ථාවේ විකුණුම් ක්‍රමානුකූලව ඉහළ නැඟ තිබේ. ඉකුත් වසරේ රුපියල් දශ ලක්ෂ 5.7 කින් වැඩිවීම හා සසඳන කල, 1968/69 සඳහා ඇස්තමේන්තුගත වැඩිවීි රුපි. දශ ලක්ෂ 3.0 ක් විය. ආනයන සීමා කිරීම නිසා, ඉකුත් වසරවල දී උද්ගත වූ සපුරාගත නොහැකි ඉල්ලුම සඳහා සංස්ථාව විසින් භාණ්ඩ සැපැයීමෙන් පසුව, ඉල්ලුමෙහි වාර්ෂිකව සෙමින් වැඩිවන ප්‍රවනතාවකට සංස්ථාව ඇබ්බැහි විය. මින් මතුවට, සංස්ථාව සිය පූර්ණ ධාරිතාවම උපයෝගී කර ගත යුතු නම්, එමෙන් ම, ප්ලාස්ටික් ආදේශකයන් ගේ තරඟ කාරිත්වයට මුහුණ දීමට සූදනම් වන්නේ නම් සංස්ථාව විසින් වඩාත් ක්‍රියාශීලී වූ ද, නානාංග කරණීය වූ ද, අලෙවිප්‍රතිපත්තියක් යොද ගත යුතු බැව් පෙනේ.

සංස්ථාවෙහි ලාභ ඉහළ නැඟෙමින් පැවතීමට හේතු සාධක වූයේ, නිෂ්පාදනයේ මෙන් ම විකුනුමෙහි ද ස්ථිර වැඩිවීමක් ඇතිවීමය. 1967/68 දී රුපි. දශ ලක්ෂ 1.8 ක් ව පැවැති ලාභය ඉකුත් වසරට වඩා රුපි. දශ ලක්ෂ 1.0 කින් වැඩිවීමක් දක්වා තිබේ. මෙම ලාභයට ප්‍රධාන වශයෙන් ම දයක වූයේ පිළියන්දල කර්මාන්ත ශාලාවය. සංස්ථාවේ සේවා නියුක්තිය 1966/67 දී පැවැති 836 සංඛ්‍යාවේ සිට 1967/68 දී 902 දක්වාත්, 1968 දෙසැම්බරයේ දී 921 දක්වාත් ඉහළ නැඟුනි.

රුපියල් දශ ලක්ෂ 5.0 වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති සංස්ථාවේ සංවර්ධන වැඩ පිළිවෙල අතින් සංස්ථාව දියුණුවක් ලබා තිබේ. '' ඉන්සියුලේටර් '' නිෂ්පාදන කම්හලක් ද' ඇතුළත් වන මීගමු කර්මාන්ත ශාලාවේ ව්‍යාප්තිය හා සංවිධානය මෙකී වැඩ පිළිවෙලට අයත් වෙයි. මේ අතර පිළියන්දල පිහිටි පිහන් ගඩොල් නිෂ්පාදන ආයතනය ද ව්‍යාප්ත කෙරෙනු ඇත.

**ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය**

ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය ආරම්භක වශයෙන්, තෙල් සහ මේද කර්මාන්ත ශාලාව පිහිටුවාලූයේ වඩාත් විද්‍යාත්මක ක්‍රියාවලියන් ( සම්ප්‍රදායානුගත ක්‍රියාවලින්ට වඩා මේ මගින් වැඩියෙන් තෙල් ලබා ගත හැකි වේ ) මගින් උසස් වර්ගයේ පොල් තෙල් නිෂ්පාදනය කිරීමට සහ අතුරු නිෂ්පාදනයන් වන්නා වූ මේද සහ සත්වාහාර නිෂ්පාදනය කිරීමටත් ය. එබඳු තෙල් සඳහා ලෝක වෙළෙඳ පොළවල්හි පවත්නා අවාසිදයක තියුණු වෙනස්වීම ද, අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ දී පවත්නා දුෂ්කරතාවයන් නිසා ද, කාලයක් යෑමේ දී සත්ව ආහාර නිෂ්පාදනයට ද මෑතක දී පටන් ග්ලිසරින් සහ මේද අම්ලයන් නිෂ්පාදනය කෙරෙහි ද ක්‍රමයෙන් වෙනස් කිරීමට සංයුක්ත මංඩලයට සිදු විය. භාවිතයට නොගත් සහ අර්ධ වශයෙන් භාවිතා කළ, මූලික උපකරණයන් ඇතුළුව 1968/69 වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රාග්ධන ආයෝජනය රුපි. දශ ලක්ෂ 27.9 කි.

1966/67 සහ 1967/68 දී පොල් තෙල් නිෂ්පාදනයේ පැවැති පහළ යාමේ උපනතිය 1968/69 දී තරමක් දුරට මැඩ පවත්වන ලදී. ටොන් 147 කින් නිමැවුමේ ස්වල්ප වැඩිවීමක් ඇති වුණු බැව් පසු වර්ෂයේ දී වර්තන උපනතීන් විසින් පෙන්වා ලනු ලබයි. කෙසේ වුවත්, 1967/68 සහ 1968/69 දී තෙල් මෝල, එහි ධාරිතාවය පිළිවෙළින් සියයට 5.8 සහ සියයට 4.1 වශයෙන් ක්‍රියාත්මක කැරුණි. අනෙක් අතට, 1967/68 දී ටොන් 777 කින් ඉහළ නැඟුණු සත්වාහාර නිමැවුමක් පැවැති සත්වාහාර මෝල වර්තන උපනතීන්ට අනුව 1968/69 දී ටොන් 23,005 කින් එහි නිමැවුමේ වාර්තාගත වර්ධනයක් ඇති කිරීමට බලාපොරොත්තු වෙයි. එහි උසස් ධාරිතා උපයෝගීකරණය සහ අභිනව සත්වාහාර මෝල පූර්ණ ක්‍රියාකාරිත්වයට පමුණුවා ලීම මෙයින් හඟවනු ලැබේ. 1967 පසුභාගයේදී ක්‍රියාත්මක කරන ලද මේද අම්ල සහ ග්ලිසරින් නිෂ්පාදනය කිරීමේ සංකීර්ණය ද 1968/69 දී නිෂ්පාදනයෙහි සැලකියයුතු තරමේ වර්ධනයක් වාර්තාගත කරන ලදී. කෙසේ වුවද, මේද අම්ලයන් සහ ග්ලිසරින් නිෂ්පාදනය කිරීම සඳහා තෙල් නිමැවුමෙන් කොටසක් භාවිතයට ගැනීම හේතු කොට ගෙන පොල් තෙල් විකිණුම්වල පිරිහීමක් තිබිණි. ඉකුත් උභය වර්ෂයන් තුළ දී සත්ව ආහාර, මේද අම්ලයන් සහ ග්ලිසරින්වලින් ලැබුණු විකිණුම් ආදයම තියුණු වර්ධනයන් පිළිබිඹු කළා ය. පොල් තෙල්වලින් ලද පාඩුව මකන ලද ග්ලිසරින් මේද අම්ලයන් සහ සත්ව ආහාර වලින් ලද ලාභයන් පුළුල් වීම කරණකොට ගෙන සංස්ථාව විසින් මේ අන්දමින් 1967/68 අතර කාලය තුළ දී රුපි. දශ ලක්ෂ 0.6 ක ලාභයක් ලබන ලදී. ප්‍රථමවරට එහි මූලාරම්භයේ පටන් පොල් තෙල් මෝලෙන් ලාභයන් ලැබීම නිසාත්, ප්‍රධාන වශයෙන් ග්ලිසරින්වලින් විශාල ලාභයක් ලැබීමත් කරණකොට ගෙන, 1968/69 අතර කාලය තුළ දී ලාභය රුපි. දශ ලක්ෂ 4.6 දක්වා තියුණු ලෙස ඉහළ නඟිනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. සංස්ථාවේ සේවකයන් ගේ සංඛ්‍යාව 1967/68 දී 696 ක්ව තිබී 1968 දෙසැම්බර් මාසයේ දී 722 දක්වා වැඩි විය.

## ලංකා තුනී ලෑලි සංයුක්ත මංඩලය

ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලය ප්‍රාරම්භක තුනී ලෑලි කර්මාන්ත ශාලාව 1941 දී ගිංතොට ආරම්භ කරන ලදී.[1] 1955 දී එය සංස්ථාවක් සංස්ථාපනය කිරීමෙන් පසුව වර්ෂයකට තුනී ලෑලි වර්ග අඩි දශ ලක්ෂ 25 ධාරිතාවයක් කරා කර්මාන්තශාලාව ප්‍රසාරණය කර තිබේ. 1968/69 අවසානය තෙක් ආයෝජනය රුපි. දශ ලක්ෂ 14.8 කට ඇස්තමේන්තු කර තිබේ. මෙයින් රුපි. දශ ලක්ෂ 2.8 ක් පමණක් ම ගින්තොට කර්මාන්ත ශාලාව වෙනුවෙන් ය. දැනට සංයුක්ත මණ්ඩලය විසින් එහි ප්‍රධාන නිෂ්පාදිතය වන තේ පෙට්ටිවල පටන් කලම්ප දොරවල්, තුනී ලෑලි ( බෝඩ් ) බ්ලොක් බෝඩ්, දොරවල්, ටේබල්–ටෙනිස් සහ ලියන මේස ( සහ මෑතක දී තුනී ලෑලි තහඩු දක්වා අන්තරයන් ගෙන් යුතු භාණ්ඩ ප්‍රභේදයක් නිෂ්පාදනය කරයි.

ධාරිතාවය පුළුල් ලෙස උපයෝගී කරගැනිම නිසා 1966/67 දී වර්ග අඩි දශ ලක්ෂ 6.0 කින් පමණ ඉහළ නගින ලද සංයුක්ත මංඩලයේ තුනී ලෑලි නිපැයුම 1967/68 දී වර්ග අඩි 1,58,000 කින් ආන්තික වශයෙන් ඉහළ නැගිනි. ඉකුත් වර්ෂය තුළ දී ඇති කැරුනු ධාරිතාවේ සම්පූර්ණ උපයෝගීකරණය හේතු කොට ගෙන, 1968/69 දී වර්ග යාර දශ ලක්ෂ 5.5 කින් පමණ සැලකිය යුතු තරමේ වැඩිවීමක් කෙසේ වුවද,ඇති වූ බව 1968 දී වර්තන උපනතීන් විසින් පෙන්වා දෙනු ලබයි.

දොරවල්, මේස, සහ තුනී ලෑලි තහඩු ආදී වඩාත් වාසිදයක භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි මෑතක පටන් සංයුක්ත මණ්ඩලය විසින් වැඩියෙන් අවධාරණය යොමු කිරීම හේතු කොට ගෙන සමාලෝචනයට භාජනය වූ ඉකුත් වර්ෂ තුන අතර කාලය තුළ දී තේ පෙට්ටි විකුණුම්වල ස්වල්ප වූ පහළ යාමක් විය. මේ අනුව ඉකුත් වර්ෂවල විකිණුම්වල වටිනාකමෙහි ස්ථිර වර්ධනයක් පිළිබිඹු කැරිණි. සංයුක්ත මණ්ඩලය විසින් ලාභ ඉපැයීමට පටන් ගත් අතර, එය 1968/69 දී වාර්තාගත වර්ධනයන් අපේක්ෂා කරනු ලබයි. එක් අතෙකින්, අතුරු දීමනාවන් ගෙවීම හේතු කොට ගෙන පිරිවැය ඉහළගිය අතර, ප්‍රවාසිතාවය අඩු කරලීම මාර්ගයෙන් පිරිවැසුම් ඇති කර ගන්නා ලදී. 1968/69 ඉහළ ලාභයන් ඇතිවීමට අධික පිරිවැටුම ද හේතු විය. සංයුක්ත මණ්ඩලයේ සේවා නියුක්තිය ( සංවර්ධන යෝජනා ක්‍රමයන් ඇතුළුව ) 1966/67 අග දී වූ 966 සිට 1968 දෙසැම්බර් මස අග දී වූ 1,042 ක් දක්වා වර්ධනය විය.

රුපි. දශ ලක්ෂ 66.5 ක පිරිවැයක් ඇස්තමේන්තු කොට ඇති, ඒකාබද්ධ දැව නිෂ්පාදනය කිරීමේ සංකීර්ණයක් අවිස්සාවේල්ලේ ගොඩනැගිම පිණිස සංයුක්ත මණ්ඩලය විසින් රුමේනියානු කර්මාන්ත අපනයනය සමග 1968 ජූලි මස දී කොන්ත්‍රාත්තුවකට එළැඹෙන ලදී. එවක් පටන් කිසියම් ප්‍රමාණයක දියුණුවක් ඇති වීමත්, 1970 දී තුනී ලෑලි පතුරු ගැසීමේ යන්ත්‍ර පට්ටලයේ 1971 ජූනි මස දී ලී ඉරන මෝලේ සහ තුනී ලෑලි මෝලේ වැඩ අවසන් කිරීමත් සමග සම්පූර්ණ සංකීර්ණය විසින් 1971 ජූනි මාසයේ දී වාණිජ නිෂ්පාදනයේ යෙදීමට අපේක්ෂා කරනු ලැබේ. දිනකට සේවා මුරයන් 3 ක් වැඩ කිරීමෙන් තුනී ලෑලි සහ තුනී ලෑලි තහඩු ඝන මීටර් 32,750 ක් ද, ඉරන ලද ලී ඝන මීටර් 9,000 ක් ද නිමැවුමක් ඇස්තමේන්තු කොට තිබේ. වර්ෂයකට රුපි. දශ ලක්ෂ 20 ක පමණ විදේශීය විනිමය ඉතිරි කර ගැනීමටත් 2000 කට පමණ රැකීරක්ෂා ලබා දීමටත් මේ මගින් අපේක්ෂා කරනු ලැබේ.

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මංඩලය

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය මූලාරම්භ වශයෙන් පාවහන් කම්හලකින් සහ සම් පදම් කිරීමේ ස්ථානයකින් සංයුක්ත වූ සම්භාණ්ඩ කර්මාන්ත ශාලාවක් 1941 දී ආරම්භ කොට 1956 දී සංස්ථාගත කරන ලදී. එවක් පටන්, අභිනව පාවහන් කම්හලක් ආරම්භ කර ලීමෙන් එය ප්‍රසාරණය වී තිබේ. වර්තමානයේ දී සංයුක්ත මණ්ඩලය විසින් පාවහන්, ක්‍රෝම් සහ (බාක්) පොතු සම්, සහ වෙනත් විවිධ සම් භාණ්ඩ රාශියක් නිෂ්පාදනය කරනු ලැබේ.

1967/68 දී ක්‍රෝම් සම් නිෂ්පාදනය වර්ග අඩි 20,000 කින් පහළ ගොස් වර්ග අඩි 6,29,000 විය. රාත්තල් 45,000 කින් '' අනිකුත් භාණ්ඩයන් '' ( ප්‍රධාන වශයෙන් ම පොතු හම් නිෂ්පාදනයෙහි වර්ධනයක් කරණකොට ගෙන මෙම හිඟපාඩුව පිරිමසා ගන්නා ලදී. 1967/68 දී පාවහන් නිෂ්පාදනය ද ජෝඩු14,000 කින් වැඩි විණි. 1968/69 වෙනුවෙන් දැනට ලබා ගත හැකි අළුත් ම සංඛ්‍යා තොරතුරුවලට අනුව, ක්‍රෝම් සහ පොතු හම් දෙවර්ගයේ ම නිමැවුම්, වර්ධනයන් පෙන්නුම් කරයි. පාවහන් නිෂ්පාදනය ද ජෝඩු 49,000 ක සැලකිය යුතු තරම් වැදගත් ඉහළ නැගීමක් පෙන්වා දෙනු ලබයි. ඉකුත් වර්ෂ තුන (3) අතර කාලයේ දී සංයුක්ත

1. 1957 දී වර්තමාන රාජ්‍ය සංස්ථාව වශයෙන් එය ප්‍රති සංස්ථාපන කරන ලදී.

මණ්ඩලය විසින් ධාරිතාවයට වඩා බොහෝ වැඩියෙන් ක්‍රියාත්මක කොට තිබේ. ක්‍රෝම් සහ පොතු හම් ( වෙනත් භාණ්ඩයන් ) පිළිබඳ පහත් විකිණුම් සංඛ්‍යාවන් ( ප්‍රමාණය ) වලට හේතුව වනාහී මෙම හම්වලින් වැඩි කොටසක් පාවහන් නිෂ්පාදනයෙහි භාවිතයට ගැනීමයි.

මුළුමනින් ම, පාවහන් කර්මාන්ත ශාලාවේ ආදායමෙහි පහත වැටීම හේතු කොට ගෙන සංයුක්ත මණ්ඩලයේ විකිණුම් අයහාරය 1967/68 දී රුපි. දශ ලක්ෂ 0.34 කින් පහළ වැටුණි. පෞද්ගලික අංශයෙන් ඇති වුණු තියුණු තරඟකාරී තත්වය හේතු කොට ගෙන පැන නැඟුණ විකිණුම් දුෂ්කරතාවයන් මෙයට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, තොග වටිනාකම 1967/68 දී සියයට 66.9 කින් ඉහළ ගියේ ය. කෙසේ වුවද, 1968/69 දී වර්ධිත විකිණුම් මාර්ග, යෙන් මෙම තොගයන් අවසාන කිරීමට සංයුක්ත මණ්ඩලයට හැකි වෙයි. මෙවක් පටන්, 1967/68 දී රුපි. දශ ලක්ෂ 0.19 කට පහත වැටුණු සංයුක්ත මණ්ඩලයේ ලාභය 1968/69 දී රුපි. දශ ලක්ෂ 0.41 ක දක්වා ඉහළ නගිණු ඇතැයි බලාපොරොත්තු වෙනු ලැබේ. සංයුක්ත මණ්ඩලයේ සේවකයන් ගේ සංඛ්‍යාව 1966/67 දී පැවැති 588 සිට 1967/68 දී 643 දක්වා ද, 1968 දෙසැම්බරයේ දී 661 දක්වා ද ඉහළ නැඟුණි.

සංයුක්ත මණ්ඩලයේ සංවර්ධන සැලැස්මවල්වලට අභිනව සම් පදම් කිරීමේ ස්ථානයන් ආරම්භ කිරීම ද දේශීය සම් නිෂ්පාදිතයන් වෙනුවෙන් අපනයන වෙළෙඳ පොලවල් නභා සිටුවාලීම ද අන්තර්ගත වෙයි. ශාබහම් රාත්තල් 4,30,000 ක් සහ ක්‍රෝම් සම් ව. අඩි 12,50,000 ක ධාරිතාවයක් පවත්වා සම් පදම් කිරීමේ ස්ථානය සඳහා රුපියල් දශ ලක්ෂ 6.2 ක පිරිවැයක් වනු ඇතැයි ඇස්තමේන්තු කොට තිබේ. එය 1969 දී නිෂ්පාදනයෙහි යෙදෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

**පරන්තන් රසායනික ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය**

පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය කොස්ටික් සෝඩා, ක්ලෝරීන් සහ ඩී. ඩී. ටී. නිෂ්පාදනය සඳහා රසායනික සංකීර්ණයක් 1951 දී ආරම්භ කළ අතර, ඊට අනතුරුව 1956 දී එය සංස්ථාගත කරන ලදී. ඩී. ඩී . ටී. නිෂ්පාදනය කිරීම සඳහා පැවැති සැලසුම් අත්හැර දමන ලද අතර, දැනට සංයුක්ත මණ්ඩලය විසින් ශුද්ධ කරන ලද මේස ලුණු නිෂ්පාදනය කරයි. තවද, 1964 පටන්, සංයුක්ත මණ්ඩලය විසින් කෝස්ටික් සෝඩා ආනයනය කිරීමත්, ලංකාවේ පාවිච්චි කරන්නන්ට විකිණීමත් සිදු කරයි. 1968/69 දී සම්පූර්ණ ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 12.3 කට ඇස්තමේන්තු කොට තිබේ.

එහි නිෂ්පාදනය කිරීමේ ක්‍රියාකාරිකම් ගැන සලකා බැලීමේ දී 1967/68 දී ටොන් 32 කින් පහළ බසිමින් කෝස්ටික් සෝඩා නිෂ්පාදනය ටොන් 970 ක් විය. මේ අතර, ක්ලෝරීන් සහ මේස ලුණු නිමැවුම සැලකිය යුතු තරමින් ඉහළ ගොස් ඇත. දැනට ලබා ගැනීමට හැකිව පවත්නා අළුත් ම සංඛ්‍යාවලට අනුව 1968/69 දී නිෂ්පාදනයෙහි සමස්ත වර්ධනයක් ඇති වනු ඇත. 1967/68 දී සංයුක්ත මණ්ඩලය විසින් ධාරිතාවයට අඩුවෙන් ක්‍රියාත්මක කළ අතර 1968/69 දී මේස ලුණු සම්බන්ධයෙන් හැරුණු කළ එපරිද්දෙන් ම ක්‍රියාත්මක වනු ඇත. සංයුක්ත මණ්ඩලය විසින් නිපදවනු ලබන ක්ලෝරීන් සම්බන්ධයෙන් පවත්නා අලෙවි කිරීමේ දුෂ්කරතාව යන් පසුගිය වාර්ෂික වාර්තාවේ ද සඳහන් කොට තිබේ. 1967/68 දී සහ 1968/69 දී ක්ලෝරීන් අලෙවි කිරීම්වල ධෛර්ය ගන්වන සුළු වර්ධනයක් තිබුනේ වී නමුත්, කෝස්ටික් සෝඩා නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදනයක් වන ක්ලෝරීන් අතිරික්තය සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට සංයුක්ත මණ්ඩලයට සිදු විය. ඇත්ත වශයෙන් ම ක්ලෝරීන් සඳහා පවත්නා ඉල්ලුම, කර්මාන්ත ශාලාව විසින් නිපදවනු ලබන කෝස්ටික් සෝඩා නිෂ්පාදනය කෙරෙහි බලවත් අවහිරයක් ඇති කරනු ලැබිණි.

ප්‍රාථමික වශයෙන් ක්ලෝරීන් සහ මේස ලුණුවල වර්ධනය වන්නා වූ විකිණිය හැකි බව හේතු කොට ගෙන සාදන ලද නිෂ්පාදිතයන් ගේ අලෙවියෙන් ලබන ආදයමේ සීඝ්‍ර වර්ධනයක් පිළිබිඹු විණි. එවක් පටන් සංයුක්ත මණ්ඩලය 1965/66 සිට ම නිෂ්පාදනය කිරීමේ ක්‍රියා කාරීත්වයෙන් ලබන ලද අලාභයන් අනුක්‍රමික වශයෙන් අඩු කර ගැනීමට සමත් විය. 1964/65 පටන් වර්ධනය වන්නාවූ ලාභයන් ගේ ප්‍රතිවිපාකයක් වශයෙන් එය සිදුවීම හැරුණු කළ එහි වෙළෙඳ ක්‍රියාකාරිකම් සම්බන්ධයෙන් කිසිදු සංඛ්‍යා තොරතුරක් ලබා ගැනීමට නොහැකි ය. ඇත්ත වශයෙන්, 1966/67 සහ 1967/68 දී මුළු මහත් සංයුක්ත මණ්ඩලයේ ගිණුම් ලාභයන් කෙරෙහි හේතු වූයේ නිෂ්පාදනය කිරීමේ අලාභයන් කෙරෙහි වූ වෙළෙඳ ලාභයන් ගේ අතිරික් තයයි.

පිළිවෙලින් ටොන් 600 ක සහ ටොන් 25 ක වාර්ෂික ධාරිතාවයකින් සමන්විත හයිඩ්‍රොක් ලොරික් අම්ලය සහ පොටෑසියම් ක්ලෝරයිඩ් නිෂ්පාදනය සඳහා සංයුක්ත මණ්ඩලය විසින්

යන්ත්‍රාගාර දෙකක් අවස්ථානුකූලව සකස් කර ගන්නා ලදී. මෙයින් අදහස් කරන ලද්දේ, සංයුක්ත මණ්ඩලයේ අතිරික්ත ක්ලෝරීන් උකහා ගැනීමටයි. මෙම උභය යන්ත්‍රාගාරයන් 1969 අතරතුර දී නිෂ්පාදනයෙහි යෙදෙනු ඇත.

## ලංකා සිමෙන්ති සංයුක්ත මංඩලය

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය ප්‍රාරම්භක වශයෙන්, 1950 ඔක්තෝබරයේ දී ටොන් 80,000 ක වාර්ෂික ධාරිතාවයකින් සමන්විතව සිමෙන්ති කර්මාන්ත ශාලාවක් කන්කසන්තුරේ ආරම්භ කරන ලදී.[1] මෙය 1956 නොවැම්බරයේ දී කාන්කේසන් සිමෙන්ති කර්මාන්ත සංයුක්ත මණ්ඩලය වශයෙන් නීතිගතව සංස්ථාපනය කරන ලද අතර, 1959 ජනවාරියේ දී ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය ලෙස දැනට පවත්නා වර්තමාන ස්වරූපයෙන් ප්‍රති සංස්ථාපනය[2] කරන ලදී. සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත නිෂ්පාදනය, ආනයනය, හා අලෙවිය, එහි කාර්යයනට ඇතුලත් වනු ඇත.[3] සංස්ථාපනය කිරීමෙන් පසුව, ගාල්ල (ඇඹරීමේ යන්ත්‍රාගාරයක් පමණක් ) කන්කසන්තුරෙයි සහ පුත්තලමේ අතිරේක කර්මාන්ත ශාලා ආරම්භ කිරීම දක්වා එහි වැඩ කටයුතු ප්‍රසාරණය කොට ඇත.

1967/68 දී සිමෙන්ති සංයුක්ත මංඩලයේ නිමැවුම ටොන් 2,06,631 ක් දක්වා ටොන් 1,25,056 කින් තියුණු ලෙස වැඩි විය. ටොන් 2,65,000 කට සංයුක්ත මණ්ඩලයේ සම්පූර්ණ ධාරිතාවය ඉහළ නංවන ලද ටොන් 1,00,000 ක අභිනව ධාරිතාවයක් පවත්නා ගාල්ලේ ඇඹරීමේ යන්ත්‍රාගාරය ද, කන්කසන්තුරේ පවත්නා ටොන් 45,000 ක අතිරේක ධාරිතාවය ද ක්‍රියාත්මක කිරීම කරණ කොට ගෙන මෙය සිදු කැරිණ. කෙසේ වුවද, නිෂ්පාදනයෙහි පවත්නා සම්ප්‍රයුක්ත වර්ධනය වූයේ පිළිවෙලින් කන්කසන්තුරෙයි ටොන් 78,916 ද ගාල්ලේ ටොන් 46,140 ද වීමයි. 1968/69 දී දැනට ලබා ගත හැකි අළුත් ම සංඛ්‍යා තොරතුරු වලට අනුව කන්කසන්තුරෙයි සිමෙන්ති නිෂ්පාදනය ටොන් 5,258 කින් පහත වැටීමක් පෙන්වාලයි. ටොන් 34,052 සම්පූර්ණ වර්ධනයක ප්‍රති විපාකයක් වශයෙන් ගාල්ලේ ටොන් 39,310 ක නිෂ්පාදනයෙහි වැඩිවීමක් මගින් මෙය පමණටත් වඩා මකාලනු ලබයි. කන්කසන්තුරෙයි පහල යාමට හේතුව වූයේ, නැවත අළුත් වැඩියා කරන ලද පරණ කර්මාන්ත ශාලාව අභිනව කර්මාන්ත ශාලාවකට සංකලනය කිරීමේ ප්‍රතිවිපාකයක් වශයෙන් එහි ක්‍රියා කාරිත්වයට නිතර බාධා පැමිණීමයි. මේ අතර, පිටරටින් ක්ලින්කර් සාපේක්ෂක වශයෙන් විශාල ලෙස ලබා ගැනීමට හැකිවීම නිසා එහි නිෂ්පාදනයේ ධාරිතාවය සියයට 85.5 ට වැඩි කිරීමට ධාරිතාවය සියයට 46.1 ක් ව ක්‍රියාත්මක වූ ගාල්ලේ ඇඹරීමේ යන්ත්‍රාගාරයට හැකි විය. කෙසේ වුවද, කර්මාන්ත ශාලාවන් දෙක ම ධාරිතාවයට වඩා අඩුව ක්‍රියාත්මක වූ බව සැලකිල්ලට භාජනය කර ගත යුතු ය.

ඉකුත් වර්ෂවල දී, සංයුක්ත මණ්ඩලයේ අලෙවි කිරීම්, අනුක්‍රමික වර්ධනයක් පෙන්වාලිය. ඇත්ත වශයෙන් ම, කිසිදු අලෙවිකිරීමේ දුෂ්කරතාවයකට සංයුක්ත මණ්ඩලයට මුහුණ දීමට සිදු නොවීය. සංයුක්ත මණ්ඩලයේ නිමැවුවන් සහ ඇස්තමේන්තු කරන ලද වෙළෙඳ අවශ්‍යතාවයන් ලංකාවට ගෙන්වන සිමෙන්ති ආනයනයන් සමග සාමාන්‍ය වශයෙන් ඒකාබද්ධ කිරීම මීට හේතුව විය[4]. කෙසේ වුවද, 1968 පසු භාගය අතරතුර කාලයේ දී වෙළෙඳ පොලෙහි ආනයනය කරන ලද සිමෙන්ති බහුලවීම කරණකොට ගෙන අලෙවි පිරිවැටුම සෙමින් සෙමින් පහළ බැස්සේ ය. මීට හේතුව වූයේ ප්‍රමාද වූ ආනයනයන් ලඟාවීම් සංකේන්ද්‍රණය වීමයි. 1968/69 දී කන්කසන්තුරෙහි අලෙවි පහළ බැසීමට හේතු වූයේ මෙම සාධකයයි.

1967/68 දී රුපි. දශ ලක්ෂ 5.9 කින් තියුණු ලෙස වර්ධනය වී උසස් පිරිවැටුමක් මත සංයුක්ත මණ්ඩලයේ ලාභයන් රුපි. දශ ලක්ෂ 13.9 ක් විය. කන්කසන්තුරයේ කර්මාන්ත ශාලාව මුළුමනින් ම පාහේ මෙයට වග කිව යුතු වෙයි. ධාරිතාවය ඌන ලෙස උපයෝගී කරණය කිරීම නිසාත්, ආනයනය කරන ලද ක්ලින්කර්වල අධි පිරිවැය නිසාත්, ගාල්ලේ කර්මාන්ත ශාලාව රුපි. දශ ලක්ෂ 1.3 ක සුළු ලාභයක් වාර්තා ගත කරන ලදී. කන්කසන්තුරේ අය–වැය කරණීය කළ ආන්තික වර්ධනයකින් පමණටත් වැඩියෙන් වඩා මකා දැමීම සිදු

---

1. මූලික අනුප්‍රමාණික ධාරිතාවය වූයේ ටොන් 1,00,000 කි. නමුත් සමහර ශිල්පීමය ගැටළු හේතු කොට ගෙන මෙය අඩු කරන ලදී.
2. 1955 හේ අංක: 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංයුක්ත මණ්ඩල පනත යටතේ ප්‍රාරම්භක සංස්ථාපනය සිදු විය. ඊට අනතුරුව කරන ලද සංස්ථාපනය කිරීම් කරන ලද්දේ 1957 තේ අංක: 47 දරන රාජ්‍ය කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනත යටතේ ය.
3. ඉහත දී ටිකකලක් තිස්සේ ලංකාවට සිමෙන්ති ආනයනය කිරීමේ ඒකාධිකාරය සංයුක්ත මණ්ඩලය විසින් භුක්ති විඳින ලදී.
4. රාජ්‍ය වෙළඳ සංවිධානයක් වන්නාවූ සමුපකාර තොග වෙළඳ සංස්ථාව ( ස. තො. ස. ) සිමෙන්ති ආනයනයන් පිළිබඳ ඒකාධිකාරයක් භුක්ති විඳිනු ලැබිය.

කැරුනු ගාල්ලේ ලාභයන් හි පහත වැටීම කරණකොටගෙන 1968/69 දී වර්තන උපනතීන් විසින් සංයුක්ත මංඩලයේ ලාභයෙහි මඳ වශයෙන් හීනතාවයක් පෙන්නුම් කරන ලදී. මෙයට හේතු වූයේ කන්කසන්තුරේ අය වැය කරනයේ ආන්තික වැඩිවීම මකාලන තරමින් ගාල්ලේ ලාභ පහත වැටීමය. උසස් ධාරිතා උපයෝගීකරණයක් තිබුනේ වී නමුත් ගාල්ලේ ලාභයන්හි පහත වැටීමට හේතු වූයේ විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයනය කරන ලද ක්ලින්කර් පිරිවැයෙහි තියුණු වර්ධනයක් ඇතිවීමය. 19681 සැප්තැම්බර් වලදී ටොන් එකක් රුපියල් 30 බැගින් සිමෙන්ති මිලයන්හි ඉහළ යාමේ ප්‍රතිශෝධනයක් කළේ නැතිනම් ලාභයෙහි මෙම පහත වැටීම මීටත් වැඩි වන්නට ඉඩ තිබුණි. සංයුක්ත මණ්ඩලයේ සම්පූර්ණ සේවකයන්ගේ සංඛ්‍යාව 1966/67 දී 1,527 ක්ව තිබී 1967/68 දී, 1,763 කට ද 1968 දෙසැම්බර් වන විට 1,907 දක්වා ද වර්ධනය විය.

ඇඹරීමේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන පූර්ණ ධාරිතාවයට ( ටොන් 100,000 ) නවීකරණය කරන ලද කන්කසන්තුරෙහි පෝරණුව ( 1969 යට ජනවාරියේ දී එය ක්‍රියාත්මක කැරිණි ) උපයෝගී කිරීමට සංයුක්ත මණ්ඩලය අපොහොසත් විය. එවක් පටන්, තුන් වන සිමෙන්ති කම්හලක් කන්කසන්තුරෙයි ගොඩ නැගීම 1969 පෙබරවාරියේ දී ආරම්භ කළ අතර එය 1969 අගදී නිමාවට පත් කරනු ඇත. මෙය හේතු කොට ගෙන කන්කසන්තුරෙයි කම්හලේ ධාරිතාවය තවත් වැඩිපුර ටොන් 100,000 කින් ඉහළ නංවනු ඇත. වර්ෂයකට ටොන් 220,000 ක නිෂ්පාදනයක් බලාපොරොත්තු වන්නා වූ රුපියල් දශ ලක්ෂ 94.45 ක පිරිවැයකින් යුක්ත පුත්තලමේ ප්‍රසාරණය කිරීමේ යෝජනා ක්‍රමයේ පළමුවන අවස්ථාවෙහි ද සංයුක්ත මණ්ඩලය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. 1969 අගදී එය නිමාවට පත් කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. පුත්තලමේ කර්මාන්ත ශාලාවේ දෙවැනි අවස්ථාව සඳහා යන්ත්‍රෝප කරණ සැපයීම උදෙසා ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ සීමාසහිත ක්ලොක්නර් හුම්බෝල්ඩ්ට් ඩොයිට්ස් සමාගම සමග සංයුක්ත මණ්ඩලය විසින් ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම යෝජනා ක්‍රමය 1971 දී නිමාවට පත් කිරීමෙන් පසුව තවත් වැඩිපුර සිමෙන්ති ටොන් 220,000 නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයේ ඇස්තමේන්තු ගත වියදම රුපියල් දශ ලක්ෂ 89.7 ක් විය.

**ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය**

මූලික වශයෙන් කන්තලේ සීනි සංයුක්ත මණ්ඩලය 1957 දී පිහිටවූයේ, වර්ෂයකට සීනි ටොන් 21,000 ක් නිපදවීමට සහ එහි අතුරු නිෂ්පාදන ( ඉක්ෂුපාක ) මද්‍යසාර ගැළුම් 600,000 ධාරිතාව ඇති ස්කාගාරයක උපයෝගිකරණය සංරගැනීමටය. එසේම එවකට ගල්ඔය සංයුක්ත මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වුනු සීනි ටොන් 19,200 ක් හා ස්ප්‍රීතු සැර ගැළුම් 750,000 ක ධාරිතාව ඇති ස්කාගාරයක් සහිත සීනි කම්හලක් ගල්ඔය හිඟුරන ප්‍රදේශයේ පිහිටුවිය. නිෂ්පාදනය සඳහා කම්හල් දෙකට උක්ගස් වවන ලදී. රජය සතු සියළුම සීනි කර්මාන්ත එක පාලක මණ්ඩලයක් යටතට පැවරීමට 1963 දී රජය ගත් තීරණයට පසුව, සංස්ථාවේ කලින් නම, ශ්‍රීලංකා සීනි සංයුක්ත මණ්ඩලය යනුවෙන් වෙනස් කැරිණ. 1966 ඔක්තෝබරයේදී ගල්ඔය සීනි සංකීර්ණ ආයතනයේ කටයුතු ද 1968 දී උඩ වලවේ සැලසුම් කළ සීනි යෝජනා ක්‍රමය ද සංයුක්ත මණ්ඩලයට පැවරිණ. දැනට සංයුක්ත මණ්ඩලය විසින් කන්තලේ හා ගල්ඔය දී සීනි, ඉක්ෂුපාක සහ ප්‍රතිශෝධිත ස්පිතු හා අත් හද බැලීමේ පදනම් මත වලවේ දී සීනි සිරප් ද නිපදවයි.

මූලාරම්භයේ සිටම විකිණීම සඳහා නොකඩවා අවශ්‍ය ප්‍රමාණයක් උක් දඬු සැපයීමක් නොමැති නිසා කන්තලේ හා ගල්ඔය සීනි කම්හල් ක්‍රියා කළේ ඒවායේ ධාරිතාවයට ඉතා අඩුවෙනි. මෙයට මූලික හේතුව, උක් වගාව හා සීනි නිෂ්පාදනය අතර ඒකාබද්ධ තාවයක් නොමැතිකම නිසාත්, උක් වගා කිරීම සහ කැපීම සඳහා අවශ්‍ය ශ්‍රමයේ හිඟකම නිසාත්ය. උක් වගාවට තියුණු ජල හිඟයක් ඇති වූ නිසා 1967/68 දී කන්තලේ කම්හලේ නිමැවුම කලින් වර්ෂයෙන් භාගයකට පමණ අඩු වී ඇත. වඩා විශ්වාස දයක ජල සැපයුමක් ඇති ගල්ඔය කම්හලේ නිමැවුම එම වර්ෂයේ පස් ගුණයකින් වැඩි වී ඇත. 1968/69 වර්ෂයේ අළුත්ම සංඛ්‍යා අනුව, කාල ගුණ තත්ත්වයන්ම හේතු කොට ගෙන කන්තලේ සීනි නිපැයුමේ නැඟීමක් හා ගල්ඔය නිපැයුමේ බැසීමක් ද දක්වයි. ඉකුත් වර්ෂවලදී සීනි නිෂ්පාදනයෙහි පැවති උපනතීන්ම, ඉක්ෂුපාක නිමැවුම ( සීනි කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයකි. ) මත මුළුමනින් රඳා පවත්නා ස්ප්‍රීතු නිමැවුම කෙරෙහි ද දක්වයි.

1. කාන්කේසන් සිමෙන්ති මිල ටොන් එකක් රුපියල් 180 සිට රුපියල් 210 දක්වා ද රුහුණු ( ගාල්ල ) සිමෙන්ති ටොන් එකක් රුපියල් 210 සිට රුපියල් 240 දක්වා ද ඉහළ නංවනු ලැබීය.

පසුගිය තුන් වසර තුළ ලෝක වෙළඳපොලේ පැවති රුපියල් 550–ක් (හෙවත් රාත්තලක් ශත 24 ක් පමණ වූ) මිලට සංයුක්ත මණ්ඩලයේ සම්පූර්ණ සීනි සැපයුම රජයට විකිණුමට සිදු විය. අනික් අතට 1966/67 කන්තලේ සීනි රාත්තලක නිෂ්පාදන වියදම ශත 62 ක් පමණ වූ අතර 1967/68 රුපියලක් පමණ විය. ගල්ඔය කර්මාන්ත ශාලාවේ වියදම් ඊටත් වඩා වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කන්තලේදීට වඩා ගල්ඔයදී සීනි නිෂ්පාදනය කිරීම සංස්ථාවට විශාල පාඩු ගෙන දෙන්නක් විය. ඒ එසේ මුත් ස්ප්‍රීතු නිෂ්පාදනය බොහෝ සෙයින්ම ලාභ ගෙන දෙන්නක් විය. 1967/68 දී මෙකී මාර්ගයෙන් කන්තලේ දී ලැබූ ලාභ, නිෂ්පාදනය අඩුවීම නිසා අඩුවී ගියේ ය. එහෙත් 1968/69 දී මෙහි දියුණුවක් ඇති වෙතැයි අපේක්ෂා කෙරේ. ගල්ඔයෙහි ද මෙකී ක්‍රියාකාරිත්වයෙන් ලාභ වැඩි වෙන ප්‍රවණතාවයන් පෙනී යයි. කන්තලේ සහ ගල්ඔය සේවක සංඛ්‍යා ( සංඛ්‍යා ලබා ගත නොහැකිවූ ගල්ඔය වගාවේ සේවා නියුක්තිය හැර ) 1967/68 දී පැවති 2,016 සංඛ්‍යාවේ සිට 1968 දෙසැම්බරයේදී, 2,333 දක්වා වැඩිවී ඇත.

උක්ගස් ලබා ගත නොහැකි වීම නිසා විෂම බලපෑමකට ගොදුරු වූ සිය කර්මාන්ත ශාලාවන්හි ධාරිතාවන්ගේ සම්පූර්ණ උපයෝගීතාවය පිළිබඳ ප්‍රශ්නයන් මූලික වශයෙන් සංස්ථාවේ අවධානයට යොමු වී තිබේ. සිය වගාවන් සඳහා නිති පතා ජලය සැපයීම පිණිස වග බලා ගැනීමෙන් නිමැවුම වැඩි කිරීමට අපේක්ෂා කොට තිබේ.

### ලංකා ඛණිජ වැලි සංයුක්ත මණ්ඩලය

1957 දී, ඛණිජ වැලි සංයුක්ත මණ්ඩලය පිහිටුවනු ලැබුයේ, ටොන් දශ ලක්ෂ 4 ක් යැයි ඇස්තමේන්තු කරන ලද පුල් මොඩායි පිහිටි ඉල්මනයිට් සහිත වැලි අපනයනය කිරීම උපයෝජනය කිරීම සඳහා ය. ටොන් 9000 ක වාර්ෂික ධාරිතාවයකින් සමන්විත වූ ඉල්මනයිට් වෙන් කර ලීමේ යන්ත්‍රාගාරය 1962 පටන් ක්‍රියාත්මක ව පවතී. අනතුරුව, එම වැලිවලින්1 ලබා ගත හැකි රුටයිල් සහ සර්කෝන් උපයෝජනය කර ගැනීම සඳහා සංයුක්ත මණ්ඩලය විසින් ත්‍රිකුණාමලයෙහි අතුරු නිෂ්පාදිත යන්ත්‍රාගාරයක් ආරම්භ කරන ලදී. 1968/69 අග දී ඉල්මනයිට් යන්ත්‍රාගාරය වෙනුවෙන් රුපි. දශ ලක්ෂ 11.4 ක් ද, රුටයිල් සර්කෝන් යන්ත්‍රාගාරය වෙනුවෙන් රුපි. දශ ලක්ෂ 3.5 ක් ද විය.

1967/68 දී මඳ වශයෙන් පහළ බසින ලද ඉල්මනයිට් නිෂ්පාදනය වර්තන උපනතීන්ට අනුව, 1968/69 දී තියුණු ලෙස වර්ධනය කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහි සඳහන් කර ඇති අන්දමට පුල්මොඩාහී නිෂ්පාදනය අධික ධාරිකත්වයක ( කාල ගුණ තත්ත්වයන්ට අනුව ) පිළිබිඹු කරනු ලබයි. තවදුරටත්, විදේශීය ගැනුම්කරුවන්ගෙන් ලබන්නා වූ නියම ඇණවුම් පදනම මත සංයුක්ත මණ්ඩලය විසින් නිෂ්පාදනය සිදු කැරෙයි. 1968–69 දී නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට සංයුක්ත මණ්ඩලයට ජපානයෙන් ලැබුණ ස්ථාවර ඇණවුම (ඇතැම් ඉකුත් වර්ෂවල දී මෙන්) බොහෝ සෙයින් ඉවහල් විය. තවමත්, ධාරිතාවයේ සැලකිය යුතු තරමේ ඌන—උපයෝගී කරණයක් පැවතුණි. 1968 ජූලිවල දී පමණක් රුටයිල් නිෂ්පාදනය ආරම්භ කැරිණි. ජලය සැපැයුම ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන සර්කෝන් නිෂ්පාදනයෙහි සමහර ප්‍රමාද වීම් සිදු විණි.

ඉල්මනයිට්වල උසස් අලෙවි කිරීම් පදනමට අනුව, 1966–67 පටන් සංයුක්ත මණ්ඩලය විසින් වර්ධනය වන්නා වූ ලාභයන් ලබමින් පවතී. අධික මිලක් නියම කරන ලද රුටයිල් සහ සර්කෝන් නිෂ්පාදනයන් සමග අනාගතයේ දී සංයුක්ත මණ්ඩලයේ ලාභ ලැබීමේ හැකියාව සැලකිය යුතු තරමින් ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

ත්‍රිකුණාමලයේ අතුරු–නිෂ්පාදන කර්මාන්ත ශාලාව නියමිත පරිදි නිමාවට පත් කරන ලද අතර, රුටයිල් නිෂ්පාදනය කිරීමේ පරීක්ෂණ අත්හද බැලීම් 1968 අප්‍රේල්වල දී ආරම්භ කරන ලදී. මේ අතර, අනාගතයේ දී ඉල්මනයිට් සඳහා ස්ථාවර වූ ද, පුළුල් වූ ද, ඉල්ලුමක් අපේක්ෂාවෙන් මෝසම් වර්ෂාකාලය අතරතුර දී බාධාවක් නොමැතිව නිෂ්පාදනය කිරීම තහවුරු කරනු සඳහා ටොන් 20 ක වේලනයක් සවි කිරීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වෙයි. 1969 දී මෙම වේලනය සවි කළ කල්හි, ඉල්මනයිට් වෙන් කිරීමේ යන්ත්‍රාගාරයෙහි ධාරිතාවය වර්ෂයකට ටොන් 1,20,000 දක්වා ඉහළ නගිනු ඇත.

---

1. නැගෙනහිර වෙරළෙහි පිහිටි පුල්මොඩායි සහ ත්‍රිකුණාමලය අවට පවතිනා ඛණිජ සහිත වැලිවල සියයට 72 ක් ඉල්මනයිට් ද, සියයට 10 ක් රුටයිල් ද සහ සියයට 10 ක් සර්කෝන් සහ සුළු වශයෙන් මොනසයිට් ද අඩංගුව ඇතැයි ගණන් බලා ඇත. පින්තාරු තීන්ත කර්මාන්තය සඳහා අවශ්‍ය වර්ණ සංයෝජක ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීමෙහි ලා ඉල්මනයිට් උපයෝගී කර ගනු ලැබේ. ( අභ්‍යාවකාශයානා, මිසයිල සහ අධි-ධ්වනිය ජෙට් ගුවන් යානා ) තාපයට ඔරොත්තු දීමේ ශක්තිය එහි පවත්නා බැවින් අභ්‍යාකාශ යානා මිසයිලයන් හී සහ අධි–ධ්වනී ජෙට් ගුවන් යානාවන්හි ද, ගිනියම්කාර පෑස්සීමේදී ද විස්තීරණ ලෙස භාවිතා කරනු ලබන ලෝහයක් වන ටයිටෝනියම් නිෂ්පාදනය කිරීමෙහිදී රුටයිල් උපයෝගී කර ගනු ලැබේ. පිහන් මැටි සහ පරමාණු බල කර්මාන්තයන්හි ද, වාත්තු කම්හල් මුණත් සහ නොවිරෙනයන් නිෂ්පාදනයෙහි ද උපයෝගී කර ගනු ලැබේ.

**ජාතික ලුණු සංයුක්ත මණ්ඩලය**

ප්‍රාරම්භක වශයෙන්, 1957 දී මෙම මණ්ඩලය ආරම්භ කරන ලද්දේ අපනයනය සඳහා වර්ෂයකට ලුණු ටොන්, 5,00,000 ක් නිෂ්පාදනය කිරීමට හම්බන්තොට දිශාවෙහි (පළමුපාන, බුන්දල, කොහොලන්කල සහ හම්බන්තොට) ලුණු ලේවායන් සතර සංවර්ධනය කිරීම පිණිසයි. මේ අතර රජයේ ලුණු දෙපාර්තමේන්තුව, දේශීය වෙළෙඳ පොළෙහි අවශ්‍යතාවයන් සපුරාලන ලද උතුරු සහ බටහිර දිශාවන් හි පිහිටි අනෙකුත් ලුණු ලේවායන්හි සම්පූර්ණ පරිපාලන වගකීම ද භාර ගති. 1963 දී හම්බන්තොට යෝජනා ක්‍රමය අත්හැර දැමුවාට පසුව, සියළු ම ලුණු නිෂ්පාදනය කිරීමේ කටයුතු සංයුක්ත මණ්ඩලය යටතේ ඒක බද්ධ කිරීමට තීරණය කළේය. මෙපරිද්දෙන්, 1966 ජූලිවල දී ලුණු දෙපාර්තමේන්තුව සංයුක්ත මණ්ඩලය යටතට පමුණුවන ලදී. වර්තමානයේ දී, ටොන් 63,500 ක වාර්ෂික ධාරිතාවයකින් සමන්විත වූ ලුණු ලේවායයන් 8 ක (දකුණු දිශාවේ පිහිටි ඉහත සඳහන් කරන ලද හතර සහ බටහිර දිශාවේ පිහිටි මන්නාරමේ සහ පාලවියේ පිහිටි අනෙක් ඒවාද උතුරු දිශාවේ පිහිටි එලිපන්ට්පාස් සහ ඉරුපලායි ) අයිතියක්, ටොන් 14,500ක වාර්ෂික ධාරිතාවයකින් සමන්විත වූ පුද්ගලයන් සතු ලුණු ලේවායයන් 7 කින් (බටහිර දිශාවේ පිහිටි පුත්තලම, තල්පිටිය, සහ තච්චිකාලියෙහි ද උතුරු දිශාවේ පිහිටි චිවියාතෙරු, කලුන්දයි, කුඹුරුපිටිය සහ නිලාවෙලිහි) ලුණු මිල දී ගැනීමක් කරනු ලැබේ. මෙයින්, බුන්දල සහ කොහොලන්කළ ලුණු ලේවායයන්හි නිෂ්පාදනයක් සිදු නො කෙරෙන අතර, ප්‍රධාන ලුණු ලේවායයන් හතර වන එලිපන්ට් පාස්හි (ටොන් 34,000), හම්බන්තොට (ටොන් 18,000), පුත්තලම (ටොන් 9,000) සහ පාලවියෙහි (ටොන් 8,000) නිමැවුමෙන් සියයට 88.5 ක් නිපදවනු ලබයි. මෙම ලුණු ලේවායයන්හි භූමියේ වටිනාකම (මෙය තවමත් තක්සේරු කර නොමැත.) හැරුණු කළ සම්පූර්ණ ප්‍රාග්ධන ආයෝජනය 1968–69 අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 13.1ක් වේ යැයි ඇස්තමේන්තු කොට තිබේ.

වාසිදයක කාලගුණය හේතු කොට ගෙන, 1967–68 දී සහ 1968–69 දී සංයුක්ත මණ්ඩලයේ නිමැවුමෙහි පිළිවෙළින් ටොන් 11,143ක සහ ටොන් 16,274ක තියුණු වර්ධනයක් ඇති වුණු බව පිළිබිඹු කොට ඇත. මේ අතර, අලෙවි කිරීම්, ආන්තික වශයෙන් වර්ධනය වී ඇත. උසස් පිරිවැටුමක් හේතු කොට ගෙන, 1967–68 දී රුපියල් දශ ලක්ෂ 1.2කින් ඉහළ නගන ලද සංයුක්ත මණ්ඩලයේ ලාභයන් 1968–69 දී රුපියල් දශ ලක්ෂ 0–3කින් තවදුරටත් වර්ධනය වෙනු ඇතැයි ඇස්තමේන්තු කොට තිබේ. පසුව සඳහන් කළ වර්ධනයට හේතු වූයේ ඇහිරුම් පිරිවැයෙහි සහ වැටුප් පිරිවැයෙහි (අතුරු දීමනාවන් ගෙවීම කරණකොට ගෙන) වර්ධනයකින් මතා දැමුවාට වැඩියෙන් ලබන ලද ආදායමක් 1968 ජූලිවල දී ටොන් එකක් රුපියල් 80 සිට රුපියල් 110 දක්වා මිල වැඩි කිරීම හේතු කොට ගෙන ලැබීමය. සංයුක්ත මණ්ඩලයේ සේවා නියුක්තිය 1966–67 දී 454ක්ව තිබී ප්‍රධාන වශයෙන් ම මුලින් පිහිටි ලුණු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ද එකතු කර ගැනීම හේතු කොට ගෙන 1967–68 දී 1,397 දක්වා ඉහළ නැගුණි. කෙසේ වුවද, 1968 දෙසැම්බරයේ දී එය 1,308 දක්වා පහළ වැටුණි. නිෂ්පාදනයේ වාරික සවභාවය කරණකොට ගෙන සංයුක්ත මණ්ඩලයේ සේවා නියුක්තිය පාතෝත්පාදනය වෙයි.

1968–69 අතරතුර දී සංයුක්ත මණ්ඩලය විසින් එලිපන්ට් පාස්, පාලවි සහ පුත්තලම් ලුණු ලේවායයන්හි සංවර්ධන වැඩ අඛණ්ඩව ගෙන ගියේය. පළමුපාන සහ බුන්දලෙහි ද සංවර්ධන වැඩ බොහොමයක් සිදු කරන ලදී. මේ අතර, 1968 දී චාවකච්චේරියේහි යෝජිත යාන්ත්‍රික ලුණු ලේවාය පිළිබඳ ප්‍රාරම්භක පරීක්ෂණයන් නිමාවට පත් කරන ලදී. මෙම ටොන් 1,15,000ක ධාරිතාවයන් සමන්විත ලුණු ලේවාය (දැනට ලංකාවේ පවත්නා විශාලතම ලුණු ලේවාය වන එලිපන්ට්පාස් හි ලුණු ලේවාය මෙන් ආසන්න වශයෙන් සිව් ගුණයකින් විශාලය). 1970 දී නිමාවට පත් කල කල්හි ජාතික නිමැවුම දෙගුණයක් වනු ඇත. ලංකාවේ අනෙකුත් ලුණු ලේවායන් ද නවීකරණය කිරීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වෙයි.

**ජාතික පේෂකර්ම සංයුක්ත මණ්ඩලය**

මෙම සංයුක්ත මණ්ඩලය 1958 දී පිහිටුවන ලද අතර නූල් කැටීමේ මෝලක් පළමුවෙන් ම 1963 අගෝස්තු මාසයේ දී වේයන්ගොඩ පිහිටුවන ලදී. රෙදි යාර දශ ලක්ෂ 14.0ක් වියීමේ හා රෙදි යාර දශ ලක්ෂ 40.0ක් නිම කිරීමේ වාර්ෂික ධාරිතාවයකින් සතු වූ වියීමේ හා නිම කිරීමේ මෝලක් 1965 දී එයට එක් කරන ලදී. ඊට අතිරේකව, පූගොඩ ඉදි කිරීමට බලාපොරොත්තු වූ තවත් රෙදි මෝලක් සම්බන්ධයෙන් සංයුක්ත මණ්ඩලය වැය කොට ඇත. එහෙත් එම යෝජනාව පසුව අත්හැර දමන ලදී. ඒ වෙනුවට සංයුක්ත මණ්ඩලය විසින් තුල්හිරියේ මෝලක් ඉදි කිරීමේ කටයුතු 1967–68 වර්ෂයේ දී ආරම්භ කැරිණ. ඉහතින් සඳහන් කරන ලද නිෂ්පාදන කටයුතුවලට අතිරේකව, දේශීය පේෂකාර්මිකයන් වෙත විකිණුම සඳහා කපු නූල් අපනයනය කිරීමේ ඒකාධිකාරයක් 1964 නොවැම්බර් මාසයේ සිට සංයුක්ත

මණ්ඩලය වෙත පවරා ඇත. තවද, අම්බලන්තොට පිහිටි රජයේ කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවට අයත් වූ අක්කර 2,000ක කපු වගාව, 1966 දී සංයුක්ත මණ්ඩලය වෙත පවරා ගන්නා ලදී. වේයන්ගොඩ පේෂකර්ම සංකීර්ණය වෙනුවෙන් ආයෝජන කොට ඇති මුළු ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 53.3 වේ යැයි ඇස්තමේන්තු කොට ඇත. තුල්හිරියේ නව යෝජනා ක්‍රමය වෙනුවෙන් 1968–69 වන තෙක් වෙන්කොට ඇති ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 40.3ක් විය. වෙනත් ව්‍යාපාර වෙනුවෙන් වැය කොට ඇති ප්‍රමාණය දැන ගත නොහැක.

පිටරටින් ලබා ගන්නා අමු කපු සැපයීම්වල විෂමතාවය හේතු කොට ගෙන ඉකුත් වර්ෂ 5 තුළ දී නූල් කැටීමේ මෝලෙහි නිමැවුම තරමක් දුරට උච්චාවචනය විය. 1967–68 දී වැඩි වුනු නූල් නිමැවුම 1968–69 දී පහළ වැටීමට ඉඩ ඇත. පටන් ගැන්මේ සිට ම මෝල ක්‍රියාත්මක කරවනු ලැබුයේ එහි ධාරිතාවට අඩුවෙන් විය. 1967–68 තෙක් අනුක්‍රමික වැඩිවීමක් දක් වූ රෙදි වියන මෝල් නිමැවුම 1968–69 දී නැවතත්, නූල් සැපයීම් අඩුවීම හේතු කොට ගෙන (වැඩි වීමක් අය–වැය කරණ කොට තිබුන ද) පහළ වැටෙනු ඇත. රෙදි වියන මෝලෙහි ධාරිතාවේ අඩු උපයෝගි කර ගැනීම නූල් කටින මෝලෙහි ධාරිතාවේ අඩු උපයෝගී කර ගැනීමට වඩා වැඩි විය. රෙදි වියන නූල් සහ රෙදිපිළි නිමැයුමෙහි අයවැය කරන කළ වැඩිවීම් අනුව 1968–69 දී රුපියල් දශ ලක්ෂ 1.6කින් සැලකිය යුතු ලෙස ලාභ වැඩි කර ගැනීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු විය. ඉකුත් වර්ෂය තුළ දී ද ලාභයෙහි වැඩිවීමක් සිදු විය. සංයුක්ත මණ්ඩලය විසින් නිපදවනු ලබන රෙදි විවීම සඳහා ගනු ලබන නූල්වලින් ප්‍රධාන කොටසක් සංයුක්ත මණ්ඩලයට ම අයත් රෙදි වියන මෝල් පාවිච්චිය සඳහා ගෙන අතිරික්තය පමණක් සංයුක්ත මණ්ඩලය විසින් නිපදවනු ලබන රෙදි විවීම සඳහා ගනු ලබන නූල්වලින් ප්‍රධාන කොටසක් සංයුක්ත මණ්ඩලයට ම අයත් රෙදි වියන මෝල් පාවිච්චිය සඳහා ගෙන අතිරික්තය පමණක් විකුණනු ලැබීම පහත් විකුණුම්—ප්‍රමාණ සංඛ්‍යාවට (II (ඇ) 2 සංඛ්‍යා සටහනෙහි) හේතු විය. සංයුක්ත මණ්ඩලයේ වෙළෙඳ කටයුතු පිළිබඳ දත්තයන් කිසිවක් ලබාගත නොහැකි ය. සංයුක්ත මණ්ඩලයේ සේවා නියුක්තිය 1967–68 අවසානයේ දී 1,736 සිට 1967–68 අවසානයේ දී 2,201 දක්වා වැඩි විය.

තුල්හිරියේ ඒක සම්බන්ධ පේෂකර්ම සංකීර්ණයේ ඉදි කිරීමේ කටයුතුවල සීඝ්‍ර ප්‍රගතියක් ඇති කර ගැනීමට 1968න් පසු සංයුක්ත මණ්ඩලයට හැකි විය. 1970 මැද හරියේ දී ඉදි කොට නිම කළ පසු වර්ෂයකට රෙදි විවීම සඳහා පාවිච්චි කරනු ලබන නූල් රාත්තල් දශ ලක්ෂ 17.4 ක් ද, රෙදි යාර දශ ලක්ෂ 14.0ක් ද, නිපදවීමට සහ තවත් රෙදි යාර දශ ලක්ෂ 40 ක් නිම කිරීමට ද මෙම කර්මාන්ත ශාලාවට හැකි වෙතැයි ගණන් බලා ඇත.

**ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය**

1945 දී දෙ වැනි ලෝක සංග්‍රාමය අවසන් වීමත් සමග ම, යුද්ධ හමුදාවෙන් මුද හරින ලද වඩුකාර්මිකයන්හට රැකියා සැපැයීම සඳහා ආණ්ඩුව විසින් වඩු කර්මාන්ත ශාලා කිහිපයක් පිහිටුවන ලදී. පළමුවෙන් ම මේවා සමුපකාර පදනමක් මත ගොඩනැගුණු "වඩු කාර්මික සංගම්" වලට හරවන ලද අතර, පසුව යටත් පිරිසෙයින් රජයේ කාර්යාල සඳහා වන ලී භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා "ලංකා වඩු කාර්මික සංයුක්ත මණ්ඩලය" ලෙස සංස්ථා ගත කරන ලදී. ගඩොල්, උළු, බෝට්ටු සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය යන අළුත් කාර්යයන් ද පවරන ලද "ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය" ලෙස 1958 දී එය නැවත සංස්ථාපිත කරන ලදී. බෝට්ටු කම්හල 1968 දී ධීවර සංස්ථාව වෙත මාරු කරන ලදී. මහනුවර, මඩකලපුව, මට්ටක්කුලිය, මොරටුව, කොග්ගල, බණ්ඩාරවෙල සහ යාපනයෙහි සංයුක්ත මණ්ඩලය විසින් වඩු කර්මාන්ත ශාලා පිහිටුවා ඇත. මේ අතර, 1961 සිට 1964 දක්වා අතර කාලය තුළ දී බිංගදෙනිය, අනුරාධපුර, යටියන, වැළඹ, අළුත් නුවර සහ මුලතිවු හි, ගඩොල් සහ උළු (ප්‍රධාන වශයෙන් උළු) කර්මාන්ත ශාලා 6ක් සංයුක්ත මණ්ඩලය විසින් පිහිටුවන ලදී. පළමුවෙන් කී කර්මාන්ත ශාලා හතර වර්ෂයකට ගඩොල් හෝ උළු දශ ලක්ෂ 2ක නිෂ්පාදන ධාරිතාවකින් යුතු වූ අතර, අළුත්නුවර හා මුලතිව් කර්මාන්ත ශාලා, වර්ෂයකට පිළිවෙලින් ඒකක දශ ලක්ෂ 4ක සහ දශ ලක්ෂ 1 ක ධාරිතාවලින් යුක්ත විය. සමහර අත්හද බැලීම් කිරීම සඳහා අනුරාධපුර කර්මාන්ත ශාලාව 1967 දී රාජ්‍ය ඉංජිනේරු සංයුක්ත මණ්ඩලය වෙත බාර දෙන ලදී. නාවින්නේ පිහිටි ආයුර්වේද ඖෂධ කර්මාන්ත ශාලාව 1966 දී නිෂ්පාදනය අරඹන ලදී. 1968–69 අවසන් වන විට සංයුක්ත මණ්ඩලය විසින් කරන ලද මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 22.8ක් වේ යැයි ඇස්තමේන්තු කොට ඇති අතර, එයින් රුපියල් දශ ලක්ෂ 19.2ක් ගඩොල් සහ උළු කර්මාන්ත ශාලා වෙනුවෙන් විය.

සංයුක්ත මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලැබූ ලී භාණ්ඩ, උළු හා ගඩොල්, සහ ඖෂධවල වටිනාකම 1967/68 දක්වා වැඩිවීමක් දැක්වීය. ලී භාණ්ඩ සහ ඖෂධ නිෂ්පාදනයේ වටිනාකමෙහි පිරිහීමක්, 1968–69 පවත්නා උපතතීන් ගෙන් දැක්වෙන අතර,

ගඩොල් සහ උළු කර්මාන්තයන්හි පෙර පැවැති උපනතීන් ම විද්‍යාමාන විය. අනෙක් අතට, ඉල්ලුමෙහි සැලකිය යුතු දියුණුවක් ඇති වූ ගඩොල් සහ උළුවලින් හා වඩු කාර්මික නිෂ්පාදනවලින් ලද වැඩි වූ ලැබීම් හේතු කොට ගෙන අලෙවියෙන් ලද ආදයම් සීඝ්‍ර ලෙස වැඩිවෙමින් පැවතුනි. මේ හේතුවෙන්, ගඩොල් සහ උළු නිෂ්පාදනයෙන් ඇති වන අලාභ අඩු කර ගැනීම සංයුක්ත මණ්ඩල බලාපොරොත්තු වේ. පිරිවැටුම වැඩි කිරීමෙන්, අලෙවියෙන් ලබන ආදයම වැඩි කර ගැනීමට, ඖෂධ අංශය ද බලාපොරොත්තු වේ. මේ අනුව, සංයුක්ත මණ්ඩලයේ මුළු අලාභය 1968–69 දී අඩකින් පමණ අඩු වේ යැයි බලාපොරොත්තු වේ. වැටුප් වියදම් වැඩිවී තිබියදීත් මෙම ක්‍රියා ස.ාරිත්වය ඇතිවූයේ ධාරතාව වැඩියෙන් උපයෝගී කරගැනීම නිසාය.

තවත් ගඩොල් සහ උළු කර්මාන්ත ශාලාවක් හංවැල්ලේ ඉදි කිරීමේ කටයුතු 1968 ඔක්තෝබර මාසයේ දී සංයුක්ත මණ්ඩලය විසින් අරඹන ලදී. 1970 මුල දී ඉදි කොට නිම කිරීමට බලාපොරොත්තු වන මෙම කර්මාන්ත ශාලාව ඒකක දශ ලක්ෂ 17ක වාර්ෂික ධාරිතාවකින් යුතු වන අතර, එම ධාරිතාව, ඒකක දශ ලක්ෂ 6කින් සංයුක්ත මණ්ඩලයේ දැනට ඇති ගඩොල් සහ උළු කර්මාන්ත ශාලා සියල්ල ගේ ම ඒකාබද්ධ ධාරිතාව ඉක්මවයි. දැනට සුළු වශයෙන් නිපැයෙන බිම් ගඩොල් නිපදවීමට ද සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වේ.

### ලංකා වානේ සංයුක්ත මණ්ඩලය

ඔරුවල වානේ නිපදවීමේ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා සෝ. ස. ස. සංගමය වෙතින් ලබාගත් ණය මුදලක් උපයෝගී කර ගැනීමේ අරමුණ ඇතිව, 1961 දී මෙම සංයුක්ත මණ්ඩලය පිහිටුවන ලදී. පළමුවෙන් ම, රුපියල් දශ ලක්ෂ 118.1ක වියදමකින් රොල් වානේ ටොන් 60,000ක වාර්ෂික ධාරිතාවකින් යුතු වූ වානේ රෝල් මෝලක් සහ කම්බි නිෂ්පාදන ටොන් 12,000ක වාර්ෂික ධාරිතාවයකින් යුතු වූ කම්බි නිපදවීමේ මෝලක් ඉදි කරන ලදී. මෙම මුල් පියවරේ නිෂ්පාදන කටයුතු 1967 අප්‍රේල් මාසයේ දී ආරම්භ විය. වර්ෂ 2කට ඉහත දී, සීමාසහිත හින්දුස්තාන් මැෂින් ටූල්ස්හි ලංකාවේ නියෝජ්‍යත්ව අයිතිවාසිකම් සංයුක්ත මණ්ඩලය විසින් ලබාගත්තෙන් එය ලාභදායී වෙළෙඳ කටයුත්තක ද යෙදෙයි.

දැනට ලබා ගත හැකි සංඛ්‍යාව අනුව රෝල් වානේ සහ කම්බි නිපැයුම් නිෂ්පාදනයෙහි ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට වඩා 1968–69 දී වැඩිවීමක් දක්විණි. එසේ වුවද, මෝල් දෙක ම අඩු ධාරිතාවක ක්‍රියාකාරීවීම සැලකිය යුතු අතර, රෝල් මෝලේ සහ කම්බි මෝලේ ධාරිතා උපයෝගී කර ගැනීමේ අනුපාතිකය පිළිවෙළින් සියයට 44.2ක් හා සියයට 40.2 ක් විය. නිෂ්පාදන කාර්මික ශිල්පයන්හි සංකීර්ණතාවය හා ඉල්ලුමෙහි ලැසි වැඩිවීමක් බලාපොරොත්තු වීම හේතු කොට ගෙන, අනුක්‍රමික අවධීන් අනුව පූර්ණධාරිතාව මුදුන්පත් කර ගැනීමට සංයුක්ත මණ්ඩලය විසින් සැලසුම් කොට තිබීම, මෙයට හේතු විය. 1967–68 දී රුපියල් දශ ලක්ෂ 2.0ක් වූ ලාභය, වැඩි වේ යැයි බලාපොරොත්තු වූ පිරිවැටුම හේතු කොට ගෙන, 1968–69 දී රුපියල් දශ ලක්ෂ 7.8 දක්වා වැඩි කර ගැනීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, දැනට ලබා ගත හැකි සංඛ්‍යාවලින් දක්වෙනුයේ ප්‍රධාන වශයෙන් පිරිවැටුමෙහි අඩුවීම හේතු කොට ගෙන, 1968–69 දී මෙම ඉලක්කය වෙත එළඹීමට සංයුක්ත මණ්ඩලයට නො හැකි වන බවය. අලෙවියෙහි මෙම පහත වැටීමට හේතු වී ඇත්තේ, විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු, සමහර රෝල් වානේ කොටස් විවෘත පොදු බලපත්‍ර යටතේ ආනයන කිරීමට ඉඩ දීම කරණකොට ගෙන ආනයන වැඩිවීමය. 1969 ජනවාරි මාසයේ දී මෙම භාණ්ඩ විවෘත පොදු බලපත්‍ර ලේඛනයෙන් ඉවත් කරන ලද අතර, 1969–70 දී අලෙවි ප්‍රමාණය දියුණු වෙතැයි බලාපොරොත්තු වේ.

වාත්තු කළ භාණ්ඩ ටොන් 700ක වාර්ෂික ධාරිතාවකින් යුතු වූ වාත්තු කම්හලක් ද, ඔරුවල ඉදි කොට නිම කරන ලද අතර, 1969 මැයි මාසයේ දී පරීක්ෂණ නිෂ්පාදනය ඇරඹෙනු ඇත. ගැල්වනයිස් යකඩ කම්හල ඉදි කිරීම සංයුක්ත මණ්ඩලය විසින් පසුවට කල්තබන ලද අතර, ගොඩනැගිලි නිර්මානය සඳහා පාවිච්චි කරනු ලබන වානේ කම්හල ඉදි කොට නිම කරන ලදුව, 1968 ජනවාරි මාසයේ දී නිෂ්පාදනය ආරම්භ කරන ලදී. සීමා සහිත හින්දුස්තාන් මැෂින් ටූල්ස්හි කාර්මික සහයෝගිතාව ඇතිව, යන්ත්‍ර උපකරණ නිපදවීමේ කම්හලක් පිහිටුවීමට ද, සංයුක්ත මණ්ඩලය පියවර ගෙන ඇත. පළමුව, 1969 ජූනි මාසයේ සිට යන්ත්‍ර උපකරණ ගණන 5ක් එකලස් කිරීම සඳහා ඔරුවල දැනට පවත්නා ගොඩනැගිලි උපයෝගී කර ගනු ඇත. පසුව මෙම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. නිෂ්පාදන් උපකරණ වෙනුවෙන් ඇස්තමේන්තු කළ වියදම රුපියල් දශ ලක්ෂ 0–3ක් පමණ වනු ඇත. ආනයනය කරනු ලබන යකඩ පොලු හා දේශීය වානේ සුන්බුන් උපයෝගී කොට ගෙන වානේ නිපදවීමට බලාපොරොත්තුවන ක්‍රියා පිළිවෙලෙහි දෙවැනි පියවරෙහි මූලික වැඩ කටයුතු කෙරී ගෙන යයි. දේශීය යපස්, සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදනය සඳහා උපයෝගී කොට ගැනීමට අදහස් කරනුයේ එහි වැඩ පිළිවෙලේ තුන් වැනි අවධියේ දීය.

## ලංකා ටයර් සංයුක්ත මණ්ඩලය

වානේ සංයුක්ත මණ්ඩලය මෙන් ම, මෙම සංයුක්ත මණ්ඩලය ද 1962 දී පිහිටුවන ලද්දේ ටයර් සහ ටියුබ් නිෂ්පාදන කර්මාන්තශාලාවක් කැළණියේ පිහිටුවීම සඳහා සෝ. ස. ස. සංගමය වෙතින් ලබාගත් ණය මුදලක් උපයෝගි කර ගැනීමේ අරමුණ ඇතිවය. 1967 මැයි මාසයේ දී නිෂ්පාදනය ආරම්භ කරන ලද කර්මාන්ත ශාලාවේ පළමු වැනි පියවරෙහි ධාරිතා නිමැවුම වර්ෂයකට ටයර් 2,50,000ක්, ටියුබ් 1,52,000ක් හා වැසුම් 88,000ක් විය. මෙම යෝජනා ක්‍රමයෙහි ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 67.5ක් විය.

දැනට ලබාගත හැකි සංඛ්‍යාවලට අනුව, 1968–69 දී ටයර් නිෂ්පාදනයෙහි ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට වඩා 4502ක වැඩිවීමක් දක්වුනු අතර, ටියුබ් සහ වැසුම් නිෂ්පාදනය පහළ වැටුනි. ඉහතින් කී වැඩිවීමට තරමක් හේතු වූයේ 1968 දී අළුත් පරිමාණවල ටයර් නිෂ්පාදනය කිරීමය. සංයුක්ත මණ්ඩලය අඩු ධාරිතාවක ක්‍රියාත්මක විය. ඇත්ත වශයෙන් ම 1968–69 දී ධාරිතාව උපයෝගී කර ගැනීමේ අනුපාතික ටයර් සම්බන්ධයෙන් සියයට 24.9ක් හා ටියුබ් සම්බන්ධ යෙන් සියයට 28.4ක් වේ යැයි බලාපොරොත්තු වේ. වානේ නිෂ්පාදනයෙහි සංකීර්ණතාවය කරණ කොට ගෙන, ධාරිතා උපයෝගි කර ගැනීම අනුක්‍රමික ලෙස වැඩි කිරීමේ පිළිවෙතය අනෙක් අතට, ආනයන කරන ලද ටයර් වෙළඳ පොලෙශි ලබා ගැනීමට තිබීම හේතු කොට ගෙන, 1967-68 දී අඩුවූ අලෙවිකිරීම්, ටයර් ආනයනය අනුක්‍රමික ලෙස සීමා කිරීම හේතු කොට ගෙන 1968-69 දී තියුණු ලෙස වැඩි විය. එහෙයින් වැඩි ප්‍රමාණයක් අලෙවි කර ගැනීමට සංයුත්ත මණ්ඩලයට හැකි විය. අනාගතයේ දී ටයර් හිහකම් ක්‍රමයෙන් අඩුවීමත් සමග ම මීට වඩා මඳ වැඩිවීම් වලින් සෑහීමට පත්වීමට සංයුක්ත මණ්ඩලයට සිදු වනු ඇත.

1968–69 දී ටයර් 1,35,000ක නිෂ්පාදන පදනමක් මත රුපියල් දශ ලක්ෂ 20.0ක ලාභයක් සංයුක්ත මණ්ඩලය විසින් අයවැයකරණය කරන ලදී. එහෙත් වාත්තු අච්චු ලැබීම ප්‍රමාද වූයෙන්, නියත නිෂ්පාදනය අයවැයකරණය කරන ලද නිෂ්පාදනයෙන් අඩක් පමණ විය. දැනට ලබාගත හැකි තොරතුරුවලින් රුපියල් දශ ලක්ෂ 3.0ට වඩා මඳ ලාභයක් දක්වෙන අතර, එය ඉකුත් වර්ෂයේ ලද ලාභය වූ රුපියල් දශ ලක්ෂ 0.8 හා සැසැඳේ.

දැනට පවත්නා කර්මාන්ත ශාලාව පූර්ණධාරිතා ක්‍රියාකාරිත්වයකට පැමිණවීමෙන් පසු, (අතිරික්ත නිෂ්පාදනය අපනයන කිරීමට සංයුක්ත මණ්ඩලය සැලැසුම් කොට ඇත). යෝජනා ක්‍රමයේ දෙවැනි පියවර ක්‍රියාත්මක කිරීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වේ. වාර්ෂික ධාරිතාව ටයර් 3,60,000ක් දක්වා ද, ටියුබ් හා වැසුම් 3,50,000 දක්වා ප්‍රසාරණය කිරීම මෙයින් බලාපොරොත්තු වේ. එහි ප්‍රසාරණයට ඇති එක ම මාර්ගය වනුයේ සංයුක්ත මණ්ඩලය විසින් ආරම්භ කොට ඇති අපනයන දිරි ගැන්වීමේ වැඩ පිළිවෙලෙහි සාර්ථකත්වයයි.

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංයුක්ත මණ්ඩලය

වාත්තු කිරීම, තැලීම, අච්චුවලට වැක්කිරීම හා යකඩ හා යකඩ නොවන ලෝහ වර්ග යන්හි අනෙක් සකස් කිරීම් ඇතුළු, ලෝහ භාණ්ඩ, කුඩා ආයුධ කෘෂිකාර්මික උපකරණ හා වෙනත් විවිධ ලෝහ භාණ්ඩ නිපදවීම සඳහා 1963 දී ඉහත සඳහන් සංයුක්ත මණ්ඩලය පිහිටුවන ලදී. පළමුවෙන් ම පෝලන්ත මහජන සමූහාණ්ඩුව විසින් සපයා ඇති ණය මාලාවක් යටතේ ලෝහ භාණ්ඩ කර්මාන්තශාලාවක් සංයුක්ත මණ්ඩලය විසින් යක්කල පිහිටුවන ලදී. රුපියල් දශ ලක්ෂ 16.0 ක් වැය වූයේ යැයි ඇස්තමේන්තු කොට ඇති එහි වාර්ෂික ධාරිතාව ලෝහ භාණ්ඩ ඒකක දශ ලක්ෂ 3.4ක් විය. කර්මාන්ත ශාලාවේ ප්‍රධාන ලක්ෂණය වූයේ එහි ඉදිකරන ලද යන්ත්‍රෝපකරණ, විශේශිත භාණ්ඩ නිෂ්පාදන සඳහා නොවූයෙන්, සමාන භාණ්ඩ පරාසයක් එහි නිපදවීමට හැකි වීමය. එහෙයින් උදළු සහ වෙනත් කෘෂිකාර්මික උපකරණ, ගොඩනැගිලි සඳහා අවශ්‍ය ලෝහ භාණ්ඩ ජලනල උපකරණ, හැඳි ගෑරුප්පු, වඩු කාර්මික උපකරණ සහ ඉංජිනේරු උපකරණ ආදී භාණ්ඩ විශාල පරාසයක් නිපදවීමට කර්මාන්ත ශාලාවට හැකියාවක් ඇත. කර්මාන්ත ශාලාවේ වාණිජ නිෂ්පාදනය 1965 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ විය. තරමක් දුරට ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව වෙතින් ලබාගත් ණය මුදලක් ද උපයෝගී කොට ගෙන එඬේරමුල්ලෙහි යකඩ වාත්තු කම්හලක් ද, සංයුක්ත මණ්ඩලය විසින් පිහිටුවන ලදී. රුපියල් දශ ලක්ෂ 21.5ක වියදමක් දරා නිම කරන ලද එය වර්ෂයකට (දවසකට එක වැඩ මුරයක දී) ටොන් 6,000ක නිෂ්පාදන ධාරිතාවකින් යුක්ත විය. පරීක්ෂණ නිෂ්පාදනය 1968 දෙසැම්බර් මාසයේ දී ආරම්භ වූ අතර, වාණිජ නිෂ්පාදනය 1969 අප්‍රේල් මාසයේ දී හෝ නිරන්තර ලෙස විදුලි බලය ලබා ගැනීමට හැකි වූ කලෙක ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

ලෝහ භාණ්ඩ කර්මාන්ත ශාලාව 1967–68 දී පූර්ණ නිෂ්පාදනයෙහි පැවතුන හෙයින්) ඉකුත් වර්ෂයේ දීට වඩා නිමැවුමෙහි සමස්ත ලෙස වූ වැඩිවීමක් (ඒකක දශ ලක්ෂ 1.0ක,)

විය. විදුලි බලය ඇණහිටීම හේතු කොට ගෙන නිතර ම වාගේ බාධක ඇති වුවද, දැනට ලබා ගත හැකි සංඛ්‍යාව අනුව, ඒකක දශ ලක්ෂ 1.47ක් වන 1968–69 වර්ෂයේ නිමැයුම, 1967–68 නිමැයුම වූ ඒකක දශ ලක්ෂ 1.46ට වඩා සුළු වශයෙන් වැඩි වනු ඇත.

(සංයුක්ත මණ්ඩලයේ භාණ්ඩ උසස් වර්ගයේ ඒවා වුවද, ආනයනය කළ භාණ්ඩ වෙත පාරිභෝජකයන් වැඩි සැලකිල්ලක් දැක්වීම හා විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය යටතේ ආනයන කිරීම් ලිහිල් කිරීමෙන් ආනයනය කළ සමාන භාණ්ඩ වෙළෙඳ පොළෙහි ලබා ගැනීමට තිබීම හේතු කොට ගෙන අලෙවි කිරීම සම්බන්ධයෙන් විශාල දුෂ්කරතාවයනට මුහුණ පෑමට සංයුක්ත මණ්ඩලයට සිදු විය. 1968 දී මිල වැඩි කිරීම් කරන ලද වුවද, සංයුක්ත මණ්ඩලයේ භාණ්ඩ මිල අතින් තරඟකාරී විය. 1968–69 දී සංයුක්ත මණ්ඩලයේ අලෙවි කිරීම් පහළ වැටුන අතර, නිෂ්පාදනය කොට නිම කළ භාණ්ඩ විශාල ප්‍රමාණයක් තොග ලෙස තබා ගැනීම සංයුක්ත මණ්ඩලයට සිදු විය. එසේ වුවද, රුපියල අවප්‍රමාණ කිරීමෙන් සියයට 30 සිට සියයට 82 දක්වා ප්‍රමාණවලින් භාණ්ඩයන් ගේ මිල වැඩි කිරීම් සහ 1968 නොවැම්බර් මාසයේ දී උදළු වල මිල සියයට 12කින් වැඩි කිරීම හේතු කොට ගෙන අලෙවි ආදායම්වල සුළු දියුණුවක් දැක්විනි.

1967–68 දී නිෂ්පාදනය හා අලෙවිය වැඩි වූයෙන්, රුපියල් දශ ලක්ෂ 1.1 සිට රු. 37,000 දක්වා අලාභ අඩු කොට ගැනීමට සංයුක්ත මණ්ඩලයට හැකි විය. එහෙත්, අලෙවි කිරීමේ දුෂ්කරතාවයන් හේතු කොට ගෙන, 1968–69 දී අය වැය කරණ කොට ඇති රුපියල් දශ ලක්ෂ 2.1ක ලාභය ලබා ගැනීම නොහැකි වනු ඇත. සංයුක්ත මණ්ඩලයේ ආර්ථික ප්‍රරෝහණ ශක්තිය ප්‍රමාණ වශයෙන් රඳා පවතිනුයේ එහි භාණ්ඩ අලෙවි කර ගැනීමේ හැකියාව හා නිතර ඇති වන විදුලි බල ඇනහිටීම් වැනි සාධකවලින් තොර වූ ස්ථාවර නිෂ්පාදනයයි. මෙම වර්ෂයේ නිෂ් පාදනය ඇරඹීමට බලාපොරොත්තු වන වාත්තු යකඩ කම්හල සඳහා ක්‍රමවත් විදුලි බල සැපැයීම් වඩාත් වැදගත් වනු ඇත.

යක්කල කර්මාන්ත ශාලාවේ කෘෂිකාර්මික උපකරණ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා සංයුක්ත මණ්ඩලය විසින් 1968 නොවැම්බර් මාසයේ දී ටෙන්ඩර් කැඳවන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා රුපියල් දශ ලක්ෂ 6.21ක් වැය වේ යැයි ඇස්තමේන්තු කොට ඇත. හන්ගේරියානු මහජන සමූහාණ්ඩුවේ ආධාර ඇතිව විද්‍යුත් ට්‍රාන්ස්පෝමර්, ගෙවල්වල සවි කරනු ලබන මීටර්, සහ විද්‍යුත් මෝටර් නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට ද සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වේ.

**ලංකා පොහොර සංයුක්ත මණ්ඩලය**

ප්‍රධාන වශයෙන්, පොල්, වී, තේ සහ රබර් වගාව හා සම්බන්ධ රජයේ පිහිටාධාර ක්‍රම සඳහා රසායනික පෝර ආනයනය කිරීම, පිළියෙළ කිරීම හා බෙදා හැරීම සඳහා 1964 ජනවාරි මාසයේ දී මෙම සංයුක්ත මණ්ඩලය පිහිටුවන ලදී. එහි නිෂ්පාදන කටයුතු (එනම්, අමු ද්‍රව්‍ය ආනයනය කිරීම හා සීමා සහිත කොළඹ කොමර්ෂල් සමාගම වෙතින් කුලියට ගනු ලැබූ හුනුපිටිය මෝලෙහි ඒවා මිශ්‍ර කිරීම) 1964 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී. ඉන් පසුව බෙදා හැරීමේ පහසුවට නොයෙක් දිස්ත්‍රික්කවල පෝර ගබඩා රාශියක් පිහිටුවීමට සංයුක්ත මණ්ඩලය විසින් පසුව කටයුතු කරන ලදී.

සංයුක්ත මණ්ඩලය විසින් අමු ද්‍රව්‍ය ආනයනය කිරීමෙහි හා ඒවා මිශ්‍ර කොට බෙදා හැරීමෙහි සීඝ්‍ර වැඩිවීමක් ඉකුත් පස් වස තුළ දී දක්නට ලැබුණි. රජයේ කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පෝර අවශ්‍යතාවයන් වැඩිවීම මෙයට හේතු විය. අලෙවි ආදායම්හි ද අනුරූප වැඩිවීමක් දක්නට ලැබුණු අතර, ප්‍රධාන වශයෙන් රුපියල අවප්‍රමාණ කිරීමෙන් පසු ආනයන වියදම් වැඩි වීම හේතු කොට ගෙන 1967–68 දී ලාභයෙහි පිරිහීමක් ඇති විය. පිරිවැටුම වැඩිවීම හා 1968 අප්‍රේල් මාසයේ දී මිල වැඩි කිරීම හේතු කොටගෙන 1968–69 ඇස්තමේන්තු කොට ඇති ලාභයෙහි තියුණු වැඩිවීමක් දැක්විණි. සංයුක්ත මණ්ඩලයේ සේවා නියුක්තිය 1966–67 දී 111 සිට 1967–68 දී 161 දක්වා ද, 1968–69 දී 265 දක්වා ද වැඩි විය.

1967–68 අවසන් වන විට ටොන් 23,750ක ගබඩා කළ හැකි ප්‍රාදේශීය පොහොර ගබඩා 16ක් පිහිටුවා තිබුණි. 1968–69 දී ටොන් 19,000 ක ගබඩා කළ හැකි තවත් ගබඩා 14 ක් පිහිටුවීමට සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වේ. රසායනික පෝර මිශ්‍ර කිරීමේ කම්හලක් හුනුපිටියේ පිහිටුවීම සඳහා බ්‍රිතාන්‍ය ව්‍යාපාරායතනයක් හා සමග මෙම සංයුක්ත මණ්ඩලය විසින් ගිවිසුමකට අත්සන් තබන ලදී. රුපියල් දශ ලක්ෂ 11.6 ක් වැය වේ යැයි ඇස්තමේන්තු කොට ඇති මෙම කම්හලේ අවුරුද්දකට පෝර මිශ්‍ර කළ හැකිය.

**ලංකා ධීවර සංස්ථාව**

මෙම සංස්ථාව 1964 ඔක්තෝම්බරයේ දී ආරම්භ කරන ලද්දේ මසුන් මැරීම, සකස් කිරීම (එනම්, ටින් කිරීම, වියලීම) සහ විකිණීම ධීවර වරායයන් තැනීම සහ පිහිටුවීම (සීතකාමර ඇතුළු) ධීවර උපකරණ නිපදවීම, අපනයන විකිණුමද, බෝට්ටු හා ධීවර යාත්‍රා නිපදවීම, සහ ධීවර බෝට්ටු අළුත්වැඩියා කිරීමට හා නඩත්තුවට කරන ප්‍රතිපාදනයන් සඳහා ය. සංස්ථාව කොළඹ කුරුණෑගල සහ නුවර තොග වශයෙන් විකිණුමේ ගබඩා සහ බෙද හරින මධ්‍යස්ථාන පිහිටුවා ඇත. අළුත් මාලු බෙද හරින්නන් 110 කට අධික සංඛ්‍යාවක්ද "සිපිෂ්," ඒජන්තවරු 250කට වැඩි සංඛ්‍යාවන්ද ඇත. 1967–68 දී ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයෙන් මට්ටක්කුලියේ බෝට්ටු යාත්‍රාංශය භාර ගන්නා ලදී. මේ අතරතුරේ දී ගාල්ල මිරිස්ස, බේරුවල තංගල්ල, ත්‍රිකුණාමලය තොට, මන්නාරම, සහ වෙනත් ප්‍රධාන ධීවර මධ්‍යස්ථානවල ධීවර වරායවල් සංවර්ධනය කිරීමෙහිලා ද නියැලුනි.

සංස්ථාව විසින් ඇල්ලූ, මිළ දී ගත් මසුන් ප්‍රමාණය 1967–68 තෙක් ම දිගටම වැඩි වුණි. 1968–69 මෙම උපනතිය තවදුරටත් පෙන්නුම් කළේය. එහෙත් සියයට 50කින් ඉහළ යද්දී වෙළෙඳ පොලෙහි මිල දී ගැනීම් සැහෙන තරමකින් පහළ යාමෙන් මෙය තරමක් දුරට හිලව් වී ගියේය. අනෙක් අතට අලෙවිය 1967–68 දී අඩු වූවත්, 1968–69 දී නොවෙනස්ව පැවැතිනි. වියළි මාළු අලෙවිය ඉහළ යාම, නොවිකිණු මාළුවලින් කොටස් එයට යෙද වූ බව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, අලෙවිය අඩු වීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ සංස්ථාවේ නිමැයුමෙන් වැඩි හරියක් දේශීය වෙළෙඳ පොලේ මාළු සුලභව පවතින වක වානුවේදී නිපදවීමය. ධීවර කටයුතු වඩාත් හොඳින් වර්ෂය පුරා බෙද හැරියොත් සංස්ථාවට වැඩි අලෙවියක් ලබා ගැනීමට හැකි වනු ඇත.

1968–69 දී සංස්ථාවේ අලෙවි ආදයම රුපියල් දශ ලක්ෂ 0.86 කින් මද වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම ඉහළ යාම, අළුත් මාළු මිල වැඩි කිරීම හා අනෙක් නිෂ්පාදන අලෙවිය වැඩි කිරීමෙහි ප්‍රතිඵලයයි. සංස්ථාවේ සේවා නියුක්තිය 1967–68 දී 1,380 වූවත්, 1968 දෙසැම්බරයේ දී එය 1,308ක් විය.

සංස්ථාව එහි බෙද හැරීමේ කටයුතු අනුරාධපුරය, රත්නපුරය, වැනි මධ්‍යස්ථානවල, ක්‍රමයෙන් පුළුල් කිරීමට අදහස් කරන අතර, සංස්ථාව අනුරාධපුරය, හා රත්නපුරය වැනි මධ්‍යස්ථානවල තොග ගබඩා පිහිටුවීමෙන් පසු ක්‍රමයෙන් බෙද හැරීමේ කටයුතු පුළුල් කිරීමට අදහස් කරයි. දවසකට මාළු ටොන්, 2 ගණනේ ටින් කිරීමට බලාපොරොත්තු වන පෙසාලියේ මාළු ටින් කිරීමේ කර්මාන්ත ශාලාව 1969 දී නිෂ්පාදනය අරඹනු ඇත. ඉවතලන මාළු ඔළු ආදියෙන් තවත් මත්ස්‍යාහාර ටොන් 1ක් ද සංයුක්ත මණ්ඩලය විසින් නිපදවනු ඇත. මේ අතර ධීවර වරායවල් ඉදි කිරීමේ කටයුතු ද තවදුරටත් කෙරෙනු ඇත. 1966–67 දී පවරා ගනු ලැබූ බෝට්ටු කම්හල, බෝට්ටු අළුත් වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍රෝපකරණ වලින් සමන්විත වනු ඇත.

**රාජ්‍ය පිටි නිෂ්පාදන නීතිගත සංස්ථාව**

මෙම සංස්ථාව 1964 දී පිහිටුවනු ලැබුයේ සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයෙන් ආධාර වශයෙන් ලැබුණු පිටි මෝල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කටයුතු සඳහාය. මුර තුනක් වැඩ කිරීමෙන් වර්ෂයට තිරිඟු ටොන් 70.000ක (සියයට 72 පිටි, සියයට 23 නිවුඩු හා සියයට 3 ක් ගවාහාර නිපදවයි.) ඇබරුම් ධාරිතාවක් ඇති කොළඹ මෝදර පිහිටුවනු ලැබූ මෝලෙහි, වාණිජ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලද්දේ, 1968 දෙසැම්බර් මාසයේදීය. මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 29.1 කි.

ආරම්භයේ සිට එහි ධාරිතාව ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය ඉහළ යමින් 1969 ජනවාරියෙහි පැවැති සියයට 42.5 මාර්තු හා පෙබරවාරියේ දී 76.6 දක්වා වැඩිවිය. දැනට පෙනෙන උපනතිය යටතේ 1969–70 වන විට සංස්ථාවට මුළු ධාරිතාව අනුව ක්‍රියාත්මක වීමට හැකි වනු ඇතැයි පෙනේ. 1967–68 වර්ෂයේ දී 63 දෙනෙකු ගෙන් පැවැති සේවා නියුක්තිය 1968 දෙසැම්බරය වන විට 221ක් දක්වා වැඩි විය.

**අනෙකුත් රජයේ ව්‍යවසායෝ**

රජයේ කාර්මික අංශයට අයත් නොවුවද, වාණිජමයයි කිව හැකි වෙනත් ව්‍යවසායන් 39ක් 1968 වර්ෂයේ දී පැවතුණි. මේවා නම් ප්‍රවාහන ව්‍යාපාරයන් වන ලංකා ගමනා ගමන මණ්ඩලය හා ලංකාණ්ඩුවේ දුම්රිය සේවය, ඉන්ධන හා බලය සපයන කර්මාන්ත වන රජයේ විදුලි කර්මාන්ත, මහජන සේවා වන තැපැල් හා විදුලි සංදේශ දෙපාර්ත

මේන්තුව, ලංකා ගුවන් විදුලි සංස්ථාව, වරාය අධිකාරින් වන කොළඹ වරාය කොමිෂන් සභාව සහ වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය, මූල්‍ය ආයතන වන ලංකා බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, පර්යේෂණ හා ප්‍රචාරක ආයතන වන තේ පර්යේෂනායතනය සහ ලංකා සංචාරක මණ්ඩලය, වෙළෙඳ ව්‍යාපාර වන සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව සහ බහු කාර්ය ''ප්‍රදේශ සංවර්ධන අධිකාරි වන ගංගා නිම්න භූමි සංවර්ධන සංයුක්ත මණ්ඩලයත්‍ය.

පහත ඒන ඡෙදවලදී මෙම අංශයට අයත් ප්‍රධාන ව්‍යාපාරවල කටයුතු පසුගිය වර්ෂ කිහිපය සම්බන්ධයෙන් වෙන වෙන ම විශ්ලේෂණය කර ඇත.

## ලංකා දුම්රිය සේවය

ලංකා රජය සතු දුම්රිය සේවාව 1867 දී එහි ආරම්භයේ පටන්ම රජයේ දෙපාර්තමේන්තුවක් වශයෙන් ක්‍රියාත්මක වී ඇත. දුම්රිය සේවාවට අදල සංඛ්‍යා තොරතුරු සමහරක් පහත II (ඇ)5 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

එහි මූලාරම්භයේ පටන් 1968 සැප්තැම්බර් අවසානය දක්වා එහි මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 639.1ක් වූ අතර, ඉන් ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 24.8ක වැඩි වීමක් පිළිබිඹු කරයි. මෙකී ආයෝජන වියදම් සමහරක් ඇති වූයේ 1967–68 දී පුත්තලම් මාර්ගය ඔස්සේ දුම්රිය මග දීර්ග කිරීම නිසාය. 1967–68 අවසානයේ දී මුළු දුම්රිය මාර්ග සැතපුම් ප්‍රමාණය සැතපුම් 1,061 ක් ව පැවැති අතර, මෙම සංඛ්‍යාව පුළුල් දුම්රිය මාර්ග සැතපුම් 971කින් ද, පටු මාර්ග සැතපුම් 90කින් ද සමන්විත විය. අනෙක් අතට 1967–68 දී මුළු වාහන තොගයෙහි මඳ අඩුවීමක් දක්නට විය. මෙයට හේතු වූයේ පරන වාහන ධාවනයෙන් ඉවත් කිරීමය.

1967–68 තුළ දී ප්‍රවාහනය කරන ලද මගීන් ගේ සංඛ්‍යාව දශ ලක්ෂ 2.8කින් හෙවත් සියයට 3.6කින් වැඩි වූ අතර ඉකුත් වසරේදී එම වැඩිවීම දශ ලක්ෂ 4.0කින් හෙවත් සියයට 5.4ක් විය. එහෙත් මගීන් සැතපුම් ප්‍රමාණය 1967–68 (සියයට 7.7) දී ඉකුත් වසරට (සියයට 3.1) වඩා වැඩිවීමක් දක්විය. මෙයින් පෙනී යන්නේ සමාලෝචනයට භා නය වී ඇති වර්ෂය තුළ දී වඩාත්, එලදයී වූ සාපේක්ෂක වශයෙන් දුර සැතපුම් ප්‍රමාණයන්හී ගමන් සඳහා මගීන් පොළඹවා ගැනීමෙහි ලා තරමක් දුරට සමත් විය.[1] ඉකුත් වසරේ දී රුපියල් දශ ලක්ෂ 1.7ක්ව පැවැති මගීන් කෙරෙන් වූ ලැබීම් හි වැඩිවීම අනුව ගත් කළ 1967–68 වසරේ දී මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.1කින් වැඩි වී ඇති බව ද පෙනේ.

භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳව සලකන කල 1967–68ට වඩා ඉකුත් වසරේදී (ටොන් 8,000) මෙම පරිමාවෙහි ඇති වූයේ හුදෙක් ආන්තික වැඩිවීමකි. දුම්රිය දෙපාර්තමේන්තුවට, මහා මාර්ග ප්‍රවාහනය වැඩි තරඟ කාරිත්වයට මුහුණ දීමට සිදු වූ ඉකුත් දස වසරේ දී හෝ ඊට අධික කාලයක් පැවැති ප්‍රවනතාවට යටකී වැඩිවීම අනුකූල වෙයි. දැනට පවත්නා තත්වයට (ආනයනය සීමිතව පවත්නා) වඩා යහපත් තත්වයකින් මහා මාර්ගයේ ප්‍රවාහන තොග තිබුනේ වී නම්, තත්වය මෙයට වඩා අසතුටුදයක වන්නට ඉඩ තිබිණි. මෑත අතීතයේ දී දුම්රිය විසින් ප්‍රවාහනය කරනු ලැබූ භාණ්ඩයන් බොහෝ සෙයින් ම රජයේ තොග භාණ්ඩ (සීනි, පිටි, සිමෙන්ති, ඛණිජ තෙල් නිෂ්පාදිත වැනි දෑ) විය. ඉකුත් වසරේ ඇති වූ පහත වැටීම හා සසඳන කල, 1967–68 වර්ෂයේදී භාණ්ඩයන්ගේ ටොන්–සැතපුම් ප්‍රමාණය වැඩි වී තිබේ.[2] එම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට භාණ්ඩ ප්‍රවාහන අයභාරයේ රුපියල් දශ ලක්ෂ 0.9ක වැඩිවීමක් වාර්තා කළ හැකි විය. දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු අයභාරය, ඉකුත් වසරේ රුපියල් දශ ලක්ෂ 2.2හි වැඩිවීම හා සසඳන කල, 1967–68 දී රුපියල් දශ ලක්ෂ 4.6ක වැඩිවීමක් පෙන්නුම් කර තිබේ. අනෙක් අතට, මුළු වියදම රුපියල් දශ ලක්ෂ 6.1කින් අධික ලෙස වැඩි විය. ඉකුත් වසරේ දී මෙම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1.9ක් විය. 1967–68හි වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ, කාර්ය වියදම්වල රුපියල් දශ ලක්ෂ 4.6ක වැඩිවීමය. කාර්ය වියදම්හි වැඩිවීමට හේතු වූයේ, ''අතුරු'' දීමනාවන් ගෙවීම සඳහා තීරණය කිරීමෙන් පසු, වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීමත් (සේවා නියුක්තිය පහත වැටී තිබියදීත්, මුළු වැටුප් වැය රුපියල් දශ ලක්ෂ 0.3කින් වැඩි විය) ධාවන වියදම් වැඩිවීමත් ය. මේ අනුව අයභාරයේ වැඩිවීම් ධාවන වියදම්වල ඇති වූ වැඩිවීම මගින් කැපී ගිය අතර, 1967–68 දී දුම්රිය දෙපාර්ත මේන්තුවේ හිඟය ඉකුත් වසරේ දී මෙන් විය. වාර්ෂිකයන් සහ පොළී අය කිරීම් වැඩිවීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු හිඟය 1967–68 දී රුපියල් දශ ලක්ෂ 1.5කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 47.7ක්ව පැවැතියේය. මේ අතර, 1966–67 දී 1215කින් අඩු වූ මුළු සේවක සංඛ්‍යාව සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ දී තවදුරටත් 1,073කින් පහත වැටිනි.

---

1. 1967/68 දී මගින් ගමන් ගත් සාමාන්‍ය සැතපුම් ප්‍රමාණය සැතපුම් 20.1 සිට 20.9 දක්වා වැඩිවිය.
2. 1967/68 දී භාණ්ඩ ගෙන යන ලද දුර ප්‍රමාණය සුළු වශයෙන් වැඩිවිය.

## සංඛ්‍යා සටහන II (ඇ) 5

## ලංකාණ්ඩුවේ, දුම්රිය දෙපාර්තමේන්තුව—1963/64 සිට 1967/68 (අ)

| ශීර්ෂ | 1963–64 | 1964–65 | 1965–66 | 1966–67 | 1967–68 |
|---|---|---|---|---|---|
| 1. වර්ෂය අවසානයේ ආයෝජිත ප්‍රාග්ධනය (රුපියල් දශලක්ෂ) ... ... | **536.4** | **566.4** | **592.9** | **614.3** | **639.1** |
| 2. ධාවන පථය—සැතපුම් ගණන ... | **1,028** | **1,033** | **1,043** | **1,053** | **1,061** |
| (අ) පළල් දුම්රිය මාර්ගය ... | 938 | 943 | 953 | 963 | 971 |
| (ආ) පටු දුම්රිය මාර්ගය ... | 90 | 90 | 90 | 90 | 90 |
| 3. රිය (ගණන) ... ... | **7,785** | **8,010** | **8,204** | **8,067** | **7,983** |
| (අ) දුම්රිය ඇන්ජින් ... ... | 355 | 355 | 357 | 355 | 344 |
| (ආ) දුම්රිය මැදිරි (ආ) ... ... | 7,430 | 7,655 | 7,847 | 7,712 | 7,639 |
| 4. ප්‍රවාහනය | | | | | |
| (අ) මගීන් (ඇ) දශ ලක්ෂ ගණනින් ... | 73.4 | 73.5 | 74.7 | 78.7 | 81.5 |
| (ආ) භාණ්ඩ (ඈ) (ටොන් දශ ලක්ෂ) ... | 1.9 | 1.6 | 1.7 | 1.8 | 1.8 |
| 5. ගමනාගමන සැතපුම් ගණන | | | | | |
| (අ) මගීන් (සැතපුම් ගණන—දශ ලක්ෂ) | 1,453.5 | 1,498.4 | 1,536.9 | 1,584.9 | 1,706.2 |
| (ආ) භාණ්ඩ-(සැතපුම් ගණන) ටොන්, සැ. දශලක්ෂ) ... ... | 217.7 | 196.4 | 212.1 | 211.9 | 221.5 |
| 6. මුළු අයභාරය (රුපියල් දශ ලක්ෂ) ... | **100.4** | **97.3** | **99.9** | **102.1** | **106.7** |
| (අ) මගීන් ... ... | 47.6 | 48.0 | 48.9 | 50.6 | 53.7 |
| (ආ) භාණ්ඩ ... ... | 44.5 | 40.4 | 43.7 | 43.3 | 44.2 |
| (ඇ) අනෙකුත් ... ... | 8.3 | 8.9 | 7.4 | 8.2 | 8.8 |
| 7. මුළු වියදම (රුපියල් දශ ලක්ෂ) ... | **139.6** | **145.1** | **150.2** | **148.3** | **154.4** |
| (අ) ක්‍රියාකාරක වියදම ... ... | 120.9 | 124.9 | 128.3 | 125.0 | 129.6 |
| (ආ) වාර්ෂික මුදල් (ඉ) ... ... | 7.6 | 8.2 | 9.0 | 9.7 | 10.5 |
| (ඇ) පොළිය (ඊ) ... ... | 11.1 | 12.0 | 12.9 | 13.6 | 14.3 |
| 8. ලාභය (+) හෝ අලාභය (—) (රු. දශලක්ෂ) | | | | | |
| (අ) ක්‍රියාකාරී වීමෙන් ... ... | −20.5 | −27.6 | −28.4 | −22.9 | −22.9 |
| (ආ) සමස්ථ වශයෙන් ... ... | −39.2 | −47.8 | −50.3 | −46.2 | −47.7 |
| 9. සේවා නියුක්තිය | | | | | |
| (අ) සේවක සංඛ්‍යාව ... ... | 24,615 | 26,848 | 27,253 | 26,038 | 24,965 |
| (ආ) මුළු වැටුප් ප්‍රමාණය — රු. දශ ලක්ෂ | 79.2 | 81.3 | 83.4 | 82.6 | 82.9 |

මූලය: ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

(අ) ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වූ මුදල් වර්ෂයන් සඳහා ය.
(ආ) පළල් දුම්රිය මාර්ගයන්හී — රෝද 4.
(ඇ) මාසයකට ගමන් 50 ක පදනම යටතේ පිළියෙළ කළ බලපත්‍ර ගමන් බිමන් ඇතුළත් ය.
(ඈ) ගෙවීම් නොකරන භාණ්ඩවල ගෙන ඒම, ගෙනයෑම ද ඇතුළත් ය.
(ඉ) වාර්ෂික මුදල් ආපසු ගෙවා නොමැති වුවද, ආපසු ගෙවා ඇති බව සලකා ඇත.
(ඊ) පොළිය ආපසු ගෙවා නොමැති වුවද, පසුව කපා හරින ලදී.
(උ) වෘද්ධෝපගත ද ඇතුළත් ය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

ලංකාවේ කාර්යක්ෂම හා ක්‍රමවත් වූ බස් සේවාවක් සැපයීම සඳහා[1] 1958 ජනවාරි මස 1 වැනි දින ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවන ලදි. ඉහතින් ක්‍රියාත්මක වූ පුද්ගලික බස් සමාගම් සතු වූ දේපොල, මණ්ඩලය වෙත පැවරීමත් සමගම ප්‍රසිද්ධ මාර්ගයන්හි පොදුවශයෙන් මගීන් ප්‍රවාහනය කිරීමේ ඒකාධිකාරයක් ඒ වෙත පැවරුණි. 1967–68න් (ඔක්තෝබර් මස සිට සැප්තැම්බර්[2]) මස දක්වා අවසන්වන පස් වස තුළදී මණ්ඩලයේ ක්‍රියාකලාපය පිළිබඳව වැදගත් ලක්ෂණයන් කිහිපයක් සහ 1968–69 සඳහා ඇස්තමේන්තු පහත දැක්වෙන II (ඇ) 6 සංඛ්‍යා සටහනෙහි පෙන්නුම් කර ඇත.

1968 සැප්තැම්බර් මාසය අවසන් වන විට මණ්ඩලය විසින් වැය කොට තිබූ මුළු ප්‍රාග්ධනය රු. දශ ලක්ෂ 287.2 ක් විය. ඒ වූ කලී ඉකුත් වර්ෂයේදීට වඩා රුපියල් දශ ලක්ෂ 31කින් වූ වැඩිවීමෙකි. මෙම ආයෝජනයෙන් රුපියල් දශ ලක්ෂ 231.2ක් නැතහොත් සියයට 80.5ක් වාහන සඳහා වූ අතර, ඉතිරි ප්‍රමාණය ගරාජ, ඩිපෝ, සහ ආවරණ ආදිය සඳහා විය.

මණ්ඩලයට අයත් වූ වාහන සමූහය 1967–68 දී 5184 දක්වා 128 කින් වැඩිවිය. කෙසේ වෙතත්, පරණ බස් සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීම නිසා ක්‍රියා කරවිය හැකි බස් සංඛ්‍යාව 451 කින් වැඩි විය. අළුත්වැඩියා කිරීම සඳහා දීර්ඝ කාලයක් අවශ්‍ය වන නිසාත් අඩාලවීම් නිතර ඇතිවීම නිසාත් සේවාවේ නිතර යෙදවිය හැකි බස් සමූහය 189කින් අඩු විය. එහෙයින් දිනපතා ක්‍රියාකරවන ලද සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 1967–68 දී 3686 දක්වා 87 කින් වැඩි විය. මෙය පවත්නා කාල සටහන් යටතේ දිනපතා ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය වන බස් රථ සංඛ්‍යාව වන බස් රථ 4167න් සියයට 88.5ක් විය. ඉකුත් වර්ෂයේ එම අනුපාතය වන සියයට 86.4 හා සසඳන විට මෙය සුළු දියුණුවක් විය.

1967–68 දී කාලසටහන් අනුව නියමිත ධාවන සැතපුම් ගණන සැතපුම් දශ ලක්ෂ 17.4 කින් වැඩි විය. මෙම වැඩිවීම සිදු වූයේ ප්‍රධාන වශයෙන් ධාවන මාර්ග නැවත සකස් කිරීම නිසාය. එමනිසා අතිරේක බස් රථ සඳහා වූ අවශ්‍යතාවය මග හැරිණි. අනෙක් අතට ධාවනය කළ සැතපුම් ගණන වැඩි වූයේ සැතපුම් දශ ලක්ෂ 5.3කින් පමණි. ධාවනය කළ සැතපුම් ගණන හා නියමිත සැතපුම් ගණන අතර අනුපාතිකය 1966–67 දී සියයට 92.7 සිට 1967–68 දී සියයට 88.2 දක්වා පහළ වැටුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ (අඩාලවීම හා අවශ්‍ය වේලාවන්හි බස් රිය සේවකයන් නොමැතිවීම හේතුකොට ගෙන, අපතේ ගිය සැතැපුම් ගණන 1967–68 දී සැතපුම් දශ ලක්ෂ 10.9කින් නැතහොත් සියයට 51.2කින් සැතපුම් දශ ලක්ෂ 32.2 දක්වා වැඩිවීමයි. මේ අතර (හිස් බස් රථ ගරාජවල සිට ආරම්භවන ස්ථාන කරා ධාවනය කිරීම හේතු කොට ගෙන) බස් රථ හිස්ව ධාවනය කළ සැතපුම් ගණන ඉකුත් වර්ෂ පහ තුළ දී වැඩියෙන් නොවෙනස්ව පැවති සැතපුම් දශ ලක්ෂ 2.0යේ මට්ටමේ පැවතුනි.

ඉකුත් වර්ෂයන් තුළ දී අනවතර ලෙස වැඩි වූ, ගෙන යන ලද මුළු මගීන් ගේ සංඛ්‍යාව 1967–68 දී දශ ලක්ෂ 1250.1 දක්වා දශ ලක්ෂ 105.3කින් වැඩි විය. එතන්හි ම, මුළු මගීන්–සැතපුම් ගණන දශ ලක්ෂ 6.8 දක්වා දශ ලක්ෂ 0.8කින් වැඩි වූයෙන්, පැටවුම් අනුපාතිකය (මගීන්–සැතපුම් හා ධාරිතා ආසන–සැතපුම් අතර අනුපාතිකය) 1966–67 දී සියයට 56.9 සිට 1967–68 දී සියයට 59.9 දක්වා සුළු වශයෙන් වැඩි විය.

මගීන්ගේ වැඩිවීම (මගීන් සැතපුම් ප්‍රමාණය සමග පැටවීම් ප්‍රමාණය වැඩිවීම හේතු කොට ගෙන අයභාරයෙහි රුපියල් දශ ලක්ෂ 21.9ක හෙවත් සියයට 9.1ක වැඩිවීමක් ඇති විය. ඉන් රුපියල් දශ ලක්ෂ 21.5ක් ද, මගීන් කෙරෙන් වූ ලැබීම් වැඩිවීම නිසා ඇති වූවකි. එහෙත්, මෙම වැඩිවීම ඉකුත් වසරේ අයභාරයේ වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 25.3ට වඩා අඩුය. මින් රුපියල් දශ ලක්ෂ 24.6ක් සඳහා හේතු වූයේ මගීන් කෙරෙන් වූ ලැබීම් වැඩිවීමය.

අනෙක් අතට මණ්ඩලයේ වියදම 1967–68 දි රුපියල් දශ ලක්ෂ 23.5 කින් රුපියල් දශ ලක්ෂ 261.4 දක්වා වැඩි විය. ඉකුත් වසරේ මෙන්, වැඩිවීම රුපියල් දශ ලක්ෂ 25.0ක් විය. මෙම වැඩිවීම මුළුමනින් ම පාහේ ඇති වූයේ කාර්ය වියදම්හිය. මෙයට බොහෝ දුරට හේතු වූයේ ඉකුත් වසර දෙක තුළ දී මණ්ඩලයේ සේවා නියුක්තිය වැඩිවීමය. සේවා නියුක්තිය 66/67 දී 3,724න් හෙවත් සියයට 13.1 කින් ද, 1967–68 දී 2,771න් හෙවත් සියයට 8.6කින් ද වැඩි විය. මෙම වැඩිවීම මෙකී වර්ෂවල දී බස් ධාවනයෙහි හා නියමිත වූ ධාවනය කරන ලද්ද වූ ද, සැතපුම් ප්‍රමාණයෙහි වැඩිවීමට වඩා අධික විය. මේ අනුව අයභාරයේ වැඩිවීම පමණටත් වැඩියෙන් කපා හෙලූ මෙහි වියදමෙහි වැඩිවීම නිසා 1967–68 දී ගමනා ගමන මණ්ඩලය රුපියල් දශ ලක්ෂ 5.6ක පාඩුවක් පිට ක්‍රියාත්මක විය. මෙය ඉකුත් වසරේ රුපියල් දශ 'ලක්ෂ 3.2ක ලාභයටත්, ඊට කලින් වර්ෂ දෙකේ ලාභ වලටත් ප්‍රතිවිරුද්ධ වූ සිද්ධියකි.

---

1. 1957 අංක 48 දරණ රථවාහන පණත.
2. II (ඇ) 6 සංඛ්‍යා සටහනේ (අ) පාද සටහන බලන්න.

## සංඛ්‍යා සටහන II (ඇ) 6

## ලංකා ගමනා ගමන මණ්ඩලය 1964 – 1968/69 (අ)

| ශීර්ෂ | 1964 | 1965 | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 ඇස්ත මේන්තු |
|---|---|---|---|---|---|---|
| **1. වර්‍ෂය අවසානයේදී ආයෝජිත ප්‍රාග්ධනය (රු. දස ලක්ෂ) ... ...** | **182.5** | **203.3** | **227.4** | **256.2** | **287.2** | **313.3** |
| (අ) වාහන ... ... | 150.9 | 169.1 | 189.0 | 209.0 | 231.2 | 253.4 |
| (ආ) අනෙකුත් ... ... | 31.6 | 34.2 | 38.4 | 47.2 | 56,0 | 64.9 |
| **2. වාහන (ගණන)** | | | | | | |
| (අ) අයිතිව තිබූ ... ... | 4,820 | 4,875 | 5,085 | 5,056 | 5,184 | 5,366 |
| (ආ) ධාවනය වන බස් සංඛ්‍යාව ... | 4,008 | 4,225 | 4,160 | 4,363 | 4,814 | ල.නො. |
| (ඇ) යෙදවිය හැකි සංඛ්‍යාව ... | 3,641 | 3,498 | 3,721 | 3,937 | 3,748 | ල.නො. |
| (ඈ) අවශ්‍ය වූ සංඛ්‍යාව ... | 3,222 | 3,826 | 4,005 | 4,167 | 4,167 | 4,621 |
| (ඉ) ක්‍රියාත්මක වූ (සාමාන්‍යය) ... | 2,645 | 2,931 | 3,256 | 3,599 | 3,686 | 4,033 |
| **3. සැතපුම් ගණන (සැ. දශ ලක්ෂ) ...** | | | | | | |
| (අ) සටහන්කල ... ... | 149.0 | 167.9 | 190.7 | 222.0 | 239.4 | 258.4 |
| (ආ) ක්‍රියාත්මක වූ ... ... | 133.8 | 153.3 | 177.4 | 205.9 | 211.2 | 232.6 |
| (ඇ) නැති වූ ... ... | 18.6 | 18.3 | 18.8 | 21.3 | 32.2 | 32.5 |
| (ඈ) හිස්ව ධාවනය වූ ... | 2.1 | 2.0 | 2.2 | 2.3 | 2.2 | 2.1 |
| **4. උපයෝගි කොටගත් හැකියාව ...** | | | | | | |
| (අ) මුළු ආසන—සැතපුම් ගණන (දශ ලක්ෂ) ... ... | 6,897.0 | 7,965.1 | 9,307.1 | 10,868.6 | 11,386.8 | 12,560.0 |
| (ආ) ගෙන ගිය මුළු මගීන් ගණන (දශ (ලක්ෂ) ... ... | 761.6 | 893.7 | 1,025.2 | 1,144.8 | 1,250.1 | 1,340.0 |
| (ඇ) මුළු මගීන්—සැතපුම් ගණන (දශ ලක්ෂ) ... ... | 4,373.0 | 4,898.3 | 5,582.1 | 6,183.9 | 6,823.5 | 7,500.0 |
| (ඈ) පැටවීමේ සාධක (%) ... | 63.4 | 61.6 | 60.0 | 56.9 | 59.9 | 59.7 |
| (ඉ) උපයෝගී කොටගත් වාහනවල සාමාන්‍යය ... ... | 138 | 143 | 149 | 157 | 157 | 158 |
| (ඊ) මගීන්ගේ ගමන් බිමන්හි සාමාන්‍යය (හැතැප්ම) ... | 5.85 | 5.59 | 5.54 | 5.52 | 5.59 | 5.60 |
| (උ) මගියෙකුගෙන් සාමාන්‍ය ඉපැයුම (සත) ... | 21.30 | 20.68 | 20.58 | 20.58 | 20.76 | 20.79 |
| **5. අයභාරය (රුපියල් දශ ලක්ෂ) ...** | **171.5** | 145.1 | **215.7** | **241.0** | **262.0** | **286.2** |
| (අ) මගීන් ගේ ගමන් ගාස්තු ... | 169.1 | 141.9 | 211.4 | 236.0 | 257.5 | 280.8 |
| (ආ) අනෙකුත් ... ... | 2.4 | 3.2 | 4.3 | 5.0 | 5.4 | 5.4 |
| **6. වියදම (රුපියල් දශ ලක්ෂ) (ආ) ...** | **158.5** | **144.9** | **212.9** | **237.9** | **261.4** | **285.9** |
| (අ) කාර්ය වියදම ... ... | 80.0 | 70.2 | 107.3 | 122.6 | 144.6 | 162.2 |
| (ආ) ඉංජිනේරු ශිල්පය ... | 31.4 | 28.7 | 42.7 | 48.3 | 50.6 | 54.8 |
| (ඇ) පොදු කාර්යය ... ... | 24.9 | 20.6 | 30.7 | 32.5 | 32.9 | 35.0 |
| (ඈ) පරිපාලන ... ... | 22.2 | 25.5 | 32.2 | 34.5 | 33.2 | 33.8 |
| 7. වැටුප් වියදම (රුපියල් දශ ලක්ෂ) ... | 66.5 | 64.5 | 109.6 | 125.1 | 143.5 | 162.2 |
| 8. සේවා නියුක්තිය (ගණන) ... | 23,854 | 26,089 | 28,441 | 32,165 | 34,936 | ල.නො. |
| 9. ලාභය (+) හෝ අලාභය (—) රුපියල් දශ ලක්ෂ ) ... ... | + 13.0 | +0.2 | + 2.8 | + 3.2 | — 5.6 | +.3(ඇ) |

මූලය: ලංකා ගමනාගමන මණ්ඩලය.

(අ) 1965 දක්වා මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් ලෙස සැලකුවද, 1965 සැප්තැම්බර් මාසයේ සිට මුදල් වර්ෂය ලෙස, ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වෙනස් කරන ලදී. මේ නිසා 1964 සංඛ්‍යා ලිත් වර්ෂය සඳහාද, 1965 සංඛ්‍යා මාස 9ක් (එනම් ,ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) සඳහා ද, ඉන් පසුව දක්වන සංඛ්‍යා ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වූ වර්ෂය සඳහා ද වෙයි.

(ආ) රජයේ ණය සඳහා ගෙවූ පොලී මුදල්ද ඇතුලත්වේ.

(ඇ) අය–වැය ගත සංඛ්‍යාවන්ය.

### සීමාසහිත ලංකා ගුවන් සේවය

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ශාඛාවක් වශයෙන් 1947 දෙසැම්බර් මස '' ලංකා ගුවන් සේවයෙහි '' වැඩ කටයුතු ආරම්භ වූ අතර, පසුව මෙය සංයුක්ත මණ්ඩලයක් වශයෙන් පිහිටුවන ලදී.[1] මේ අවස්ථාවේ දී එය, අභ්‍යන්තර සේවය ( ලංකාව ඇතුළත සහ බොම්බාය සහ ට්‍රිචිනාපොලිය දක්වා ) ප්‍රාදේශීය සේවා ( ඉන්දු-ලංකා ප්‍රදේශය ඇතුළත ඉන්දීය ගුවන් සේවා සංයුක්ත මණ්ඩලය සමග ) සහ ජාත්‍යන්තර සේවා ( ලංකාව හරහා ලන්ඩනය සහ සිංගප්පූරුව අතර බී. ඕ. ඒ. සී. සහ ක්වන්ටාස් ගුවන් සේවා සමග ) වශයෙන් ක්‍රියාත්මක වෙයි. පහත දැක්වෙන II (ඇ) 7 සංඛ්‍යා සටහනෙහි 1967/68 වර්ෂයෙන් (මුදල් වර්ෂය ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා ) අවසාන වන වර්ෂ හතරක කාලය තුළදී '' ලංකා ගුවන් සේවයෙහි '' ප්‍රධාන ලක්ෂණයන් දැක්වෙයි.

1968 සැප්තැම්බර් මාසයේදී වත්කම්වල වටිනාකම ( ගුවන් යානා ඇතුළුව ) රුපියල් දශ ලක්ෂ 13.3 ක් විය.[2] ගෙන යන ලද මගීන් සංඛ්‍යාව 1967 68 වර්ෂයේදී 1,406 කින් අඩුවූ අතර, ගෙන ගිය භාණ්ඩයන් ටොන් 29 කින් වැඩි විය. ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර ගුවන් සේවයෙහි අඩුවීම නිසා අඩුවූ මගීන් සංඛ්‍යාව, අභ්‍යන්තර ගුවන් සේවාවෙහි වැඩිවීම මගින් තරමක් දුරට මග හැරී ගියේය. ගුවන් මගින් ගෙන ගිය භාණ්ඩ ප්‍රමාණයෙහි වැඩිවීම ජාත්‍යන්තර සහ අභ්‍යන්තර ප්‍රවාහණයෙහි වැඩිවීම නිසා සිදුවූ අතර ප්‍රාදේශීය ගුවන් සේවයෙහි අඩුවීම මගින් තරමක් දුරට මැකී ගියේය. අනික් අතින්, ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර ප්‍රවාහණයෙහි ඉහළ යාම හේතු කොට ගෙන, ගෙන ගිය භාණ්ඩ ප්‍රමාණය ටොන්-සැතපුම් 152 කින් ඉහළ ගියේය. ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සේවාවන් මගින් ගෙන ගිය බර ප්‍රමාණයෙහි සැලකිය යුතු වැඩිවීමක් වූ නමුත්, ජාත්‍යන්තර සේවයෙහි අඩුවීම සහ ලංකාව හරහා ගමන් කරන විදේශීය ගුවන් සේවාවන් සඳහා වූ ඉංජිනේරු සහ ගමනාගමන සේවාවන් කරණ කොට ගෙන වූ වියදම් මගින් ප්‍රාදේශික සහ ජාත්‍යන්තර සේවාවන්හි වැඩිවීම වුවමනාවට වඩා කැපී යාම නිසා මුළු ආදයම රුපියල් දශ ලක්ෂ 0.24 කින් අඩුවී ගියේය. රුපියල් දශ ලක්ෂ 0.8 කින් වියදම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගුවන් යානා ක්‍රියාත්මක කිරීමේ ගාස්තු වැඩි වීමයි. එම නිසා ලංකා ගුවන් සේවයෙහි ලාභය 1966/67 දී රුපියල් දශ ලක්ෂ 3.8 සිට 1967/68 දී රුපියල් දශ ලක්ෂ 2.7 දක්වා පිරිහිණ.

ට්‍රයිඩන්ට් අයි. ඊ. වර්ගයෙහි ජෙට් ගුවන් යානයක් මිලදී ගැනීම සඳහා ගුවන් සේවය ගිවිසුමක් අත්සන් කොට ඇති අතර 1969 ජූනි මාසයේදී එය ලබා ගැනීමට හැකි වේයැයි බලාපොරොත්තු වෙයි. මෙම අහස්යානය මගින්, කරච්චිය, බොම්බාය, දිල්ලිය සහ බැංකොක් යන නගර සම්බන්ධ කොට ගුවන් සේවයක් ඇරඹීමට සහ එමගින් සැලකිය යුතු දේශ සංචාරකයින් සංඛ්‍යාවක් ඇද ගැනීමට එය අදහස් කරයි.

### කොළඹ වරාය කොමිසම

1950 ට පෙරාතුව, කොළඹ වරාය ( සහ ලංකාවේ අනිකුත් ප්‍රධාන වරායවල් ) පාලනය කරනු ලැබුවේ ප්‍රධාන වශයෙන් රේගු දෙපාර්තමේන්තුව මගින් වූ අතර, මෙය, '' ඈත අතීතයේ දී ලොව පුරා පැවැති වරායයන් සම්බන්ධයෙන් පොදු සිද්ධියක් විය.[3] වරාය ප්‍රයෝජනයට ගන්නන්ගේ නියෝජිත මුළුවක් විසින් රේගු දෙපාර්තමේන්තුවට අනුසාසනය කරන ලදී. 1950 දී ප්‍රධාන වරාය ප්‍රයෝජනයට ගන්නන් ගේ නියෝජිතයන් ගෙන් යුක්ත වූ, කොළඹ වරාය කොමිසමක්, වරාය කොමසාරිස්වරයෙකු ප්‍රධාන කොට පිහිටුවනු ලැබීය. කොළඹ වරායේ ( සහ අනිකුත් පිට වරායවල් ) පාලනය , '' කොළඹ වරාය කොමිෂම ''[4] නමින් හැඳින් වූ රජයේ දෙපාර්තමේන්තුවක වගකීම බවට පත් කෙරුණි. මෙසේ වරාය පාලනයෙන් වෙන් කැරුනු රේගුව, තවදුරටත් වරායන්හී තීරුබදු එකතු කිරීම, තීරු බදු නොගෙවා භාණ්ඩ ගෙන යාම වැළැක්වීම යනාදී කටයුතු වල නිරත වේ. 1968 දී නැව් බඩු පැටවීමේ කටයුතු සඳහා තවත් සංවිධානයක් ( වරාය ( නැව්බඩු ) සංයුක්ත මණ්ඩලය ) පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරායේ කාර්යයන් තවදුරටත් බෙදී ගියේ ය. එහෙයින්, කාර්යයන්ගේ සෑහෙන අතිච්ඡාදනය බේරුම් කරලීම අපහසු වුවද, සාමාන්‍ය වශයෙන් ලංකාවේ වරායයන් හී යන්ත්‍ර ස්ථාපනයන්

---

1. ආරම්භයේදී '' සීමාසහිත ලංකා ගුවන් සේවය '' යනුවෙන් හැඳින් වූ අතර, 1948 දී '' ලංකා ගුවන් සේවය '' වශයෙන් යොද ගන්නා ලදී. වර්තමාන සංයුක්ත මණ්ඩලය 1951 වර්ෂයේදී ලංකා ගුවන් පනත යටතේ පිහිටුවන ලද්දකි.
2. මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 31.1 ක්වූ ජංගම වත්කම් ඇතුළුව.
3. නෙඩ්කෝ : කොළඹ වරායේ සහ ලංකාවේ සමහර පිට වරායයන් ගේ කටයුතු සහ වර්ධනය පිළිබඳ වාර්තාව හේග් 1961 පිටු 17.
4. කොළඹ වරාය ( පාලනය ) 1950 නො. 10 දරන පනත.

සංඛ්‍යා සටහන II (ඇ) 7

සීමාසහිත ලංකා ගුවන් සේවය 1964-65 සිට 1966-68 (අ)

| විෂය | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68 |
|---|---|---|---|---|
| 1. වත්කම්වල වටිනාකම ( රු. '000 ) (ආ) | | | | |
| වර්ෂය අවසානයේදී ... ... ... ... | 6,334 | 7,126 | 13,303 | 13,286 |
| 2. ගෙන ගිය මගීන් සහ භාණ්ඩ | | | | |
| (අ) මගීන් (සංඛ්‍යාව) ... ... ... | 64,070 | 86,955 | 82,286 | 80,880 |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 32,889 | 39,867 | 32,934 | 33,473 |
| (2) ප්‍රාදේශීය සේවා ... ... ... | 23,226 | 36,863 | 38,049 | 36,308 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 7,945 | 10,225 | 11,303 | 11,099 |
| (ආ) භාණ්ඩ (ටොන්) ... ... ... | 471 | 531 | 513 | 542 |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 46 | 46 | 36 | 45 |
| (2) ප්‍රාදේශීය සේවා ... ... ... | 192 | 256 | 187 | 130 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 233 | 229 | 290 | 367 |
| 3. මගීන් හා බර (ටොන්) සැතැප්ම | | | | |
| (අ) මගීන් — සැතපුම් '(000) ... ... ... | 37,418 | 59,447 | 64,547 | 60,577 |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 5,958 | 7,395 | 5,928 | 6,093 |
| (2) ප්‍රාදේශීය සේවා ... ... ... | 8,507 | 12,847 | 14,371 | 14,192 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 22,953 | 39,205 | 44,248 | 40,292 |
| (ආ) භාණ්ඩ — බර ටොන් සැතපුම් ('000) ... | 4,356 | 6,456 | 7,170 | 7,322 |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 441 | 547 | 432 | 435 |
| (2) ප්‍රාදේශීය සේවා ... ... ... | 703 | 1,032 | 1,099 | 1,102 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 3,212 | 4,877 | 5,639 | 5,785 |
| 4. පාවිච්චියෙහි ධාරිතාවය | | | | |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 68.1 | 57.6 | 38.2 | 56.4 |
| (2) ප්‍රාදේශීය සේවා ... ... ... | 48.1 | 52.1 | 50.5 | 50.3 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 48.1 | 38.8 | 42.4 | 48.0 |
| 5. මුළු ආදායම ( රු. '000 ) ... ... ... | 4,888 | 8,855 | 10,348 | 10,105 |
| (1) අභ්‍යන්තර සේවා ... ... ... | 1,221 | 1,130 | 1,330 | 1,727 |
| (2) ප්‍රාදේශික සේවා ... ... ... | 2,883 | 4,442 | 4,784 | 5,625 |
| (3) ජාත්‍යන්තර සේවා ... ... ... | 141 | 946 | 2,009 | 1,642 |
| (4) වෙනත් ... ... ... ... | 643 | 2,337 | 2,225 | 1,111 |
| 6. මුළු වියදම ( රු. '000) ... ... ... | 4,689 | 6,289 | 6,551 | 7,385 |
| (1) ගුවන්යානා ක්‍රියාත්මක කිරීමේ වියදම් ... | 2,886 | 3,863 | 4,305 | 4,743 |
| (2) මාර්ග සහ භූමියෙහි වියදම් ... ... | 1,616 | 2,156 | 1,913 | 2,083 |
| (3) මූල්‍ය ගාස්තු ... ... ... | 173 | 155 | 205 | 255 |
| (4) වෙනත් ... ... ... ... | 14 | 115 | 128 | 304 |
| 7. ලාභය (+) හෝ අලාභය (—) රු. '000 ( බදු අය කිරීමට පෙර ) ... ... ... | +199 | +2,566 | +3,797 | +2,720 |
| 8. සේවා නියුක්තිය (සංඛ්‍යාව) ... ... ... | 244 | 303 | 584 | 578 |

මූලය : සීමාසහිත ලංකා ගුවන් සේවයෙනි.

(අ) 1966-67 සහ 1967-68 ඔක්තෝබර්–සැප්තැම්බර් මුදල් වර්ෂයන් සඳහා සංඛ්‍යා තාවකාලිකය.
(ආ) ගුවන් නැව් ඇතුළුව.

## සංඛ්‍යා සටහන II (ඇ) 8

## කොළඹ වරාය කොමිෂම – 1964/65 සිට 1968/69 (අ)

| ශීර්ෂයන් | 1964/65 | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| 1. ප්‍රාග්ධන වියදම (රුපි. දහස් ගණනින්) (සමුච්චිත) (ආ) ... ... | **263,292** | **277,194** | **292,060** | **305,053** | **322,918** |
| ඒ අතුරින්, | | | | | |
| (අ) කොළඹ ... ... ... | 248,191 | 258,618 | 267,170 | 273,382 | 283,095 |
| (ආ) ගාල්ල ... ... ... | 13,419 | 15,993 | 20,920 | 25,784 | 28,706 |
| (ඇ) ත්‍රිකුණාමලය ... ... | 164 | 466 | 1,033 | 1,399 | 1,898 |
| 2. අයභාරය (රු. දහස්) ... ... | **29,113** | **33,789** | **33,777** | **36,328** | **36,643** |
| (අ) කොළඹ ... ... | **28,413** | **33,359** | **33,448** | **35,959** | **36,382** |
| ඒ අතුරින්, | | | | | |
| (1) වරාය ගාස්තු ... | 4,260 | 4,653 | 4,599 | 5,823 | 5,500 |
| (2) නැව්තොට ගාස්තු ... | 6,770 | 8,018 | 7,930 | 7,880 | 7,500 |
| (3) කුලිය ... ... | 7,946 | 9,909 | 9,727 | 9,954 | 10,282 |
| (4) තෙල් ලබා දීම් ... | 3,558 | 3,536 | 4,381 | 5,124 | 5,700 |
| (ආ) පිටවරායන් ... ... | **700** | **430** | **329** | **369** | **261** |
| ඒ අතුරින්, | | | | | |
| (1) ගාල්ල ... ... | 88 | 42 | 73 | 30 | 25 |
| (2) ත්‍රිකුණාමලය... ... | 528 | 340 | 234 | 244 | 200 |
| 3. කාරක වියදම (ඇ) වාර්ෂික (රු. දහස්) | **21,954** | **22,437** | **23,743** | **23,265** | **30,053** |
| ඒ අතුරින්, | | | | | |
| (අ) කොළඹ ... ... | 21,019 | 21,501 | 22,725 | 22,370 | ල.නො. |
| (ආ) අනෙකුත් වරායයන් ... | 310 | 298 | 306 | 215 | ල.නො. |
| (ඇ) වෙරළෙහි රක්ෂාවරණය ... | 541 | 638 | 685 | 663 | ල.නො. |
| 4. අතිරික්තය (+) හෝ හිඟය (—) (ඈ) | **+7,159** | **+11,352** | **+10,934** | **+13,063** | **+6,590** |
| (අ) කොළඹ ... ... ... | +7,394 | +11,858 | +10,723 | +13,589 | ල.නො. |
| (ආ) අනෙකුත් වාරායයන් ... | + 390 | + 132 | + 23 | + 154 | ල.නො. |

මූලය : කොළඹ වරාය කොමිසම.

(අ) මුදල් වර්ෂය සඳහා ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා.
(ආ) රුපි. දශ ලක්ෂ 177.4 ක් වූ 1955 දී කොළඹ වරායේ වත්කම් අගැයීමක් පදනම් කරමින්.
(ඇ) ආවර්තන වියදම්
(ඈ) ශීර්ෂ 2 — 3 රජයේ දෙපාර්තමේන්තු බොහොමයක මෙන් වරාය කොමිසම ගිණුම් තබන්නේ අය භාර සහ වියදම පදනම් කරමින්ය. වානිජ ගිණුම් ක්‍රමයන් යොදගතහොත්, කොමිසම ඇයගේ කටයුතු වලින් පාඩු විඳිනු ඇතැයි ඇස්තමේන්තුකොට ඇත.

නඩත්තු කිරීමේ සහ ඒවා කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක කිරීමේ මුළු වගකීම වරාය කොමිසම සතු යයි සිතිය හැකිය. තවද, මෙ මගින් මුහුදු බඩ ආරක්ෂාව සහ ධීවර වරායන් ගොඩනැගීමේ කටයුතු සිදු කෙරේ. දෙවැනි කාර්යය ලංකා ධීවර සංස්ථාවේ එම කාර්යය සමග අතිච්ඡාදනය වේ.

පසුගිය අවුරුදු 4 තුළදී කොළඹ වරාය කොමිෂමෙහි කාර්යයන් ගේ ප්‍රධාන ලක්ෂණයන් සහ 1968/69 සඳහා වූ ඇස්තමේන්තු ඉහත දක්වෙන II(ඇ) 8 වැනි සංඛ්‍යා සටහනේ දක්වෙයි:—

වරාය කොමිසම මගින් ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධන ආයෝජනය ( කොළඹ දී 1955 දී කළ වත්කම් අගැයීමක් පදනම් කරමින් ) 1968 සැප්තැම්බර් මාසයේ දී රුපි. දශ ලක්ෂ 305.1 ක ප්‍රමාණයක් විය. මේ වසරේ දි පැවැති සංවර්ධන කටයුතු හේතු කොට ගෙන මෙය රුපි. දශ ලක්ෂ 322.9 දක්වා ඉහළ යතැයි බලාපොරොත්තු වේ. මෙම ආයෝජන ප්‍රමාණයෙන් සියයට 90.0 ක් පමණ කොළඹ වරාය හා සම්බන්ධයෙන් විය.

1966/67 දී මදකින් පහළ වැටුනු, කොමිසමේ ආදයම[1] 1967/68 දී සැලකිය යුතු ප්‍රමාණය කින් ඉහළ ගියේ ය. මෙයට ප්‍රධාන හේතුව වූයේ 1967 දී වරාය ගාස්තු ඉහළ යාම ( 1967 දෙසැම්බරයේ සිට වරාය ගාස්තු, නැව්තොට ගාස්තු සහ ගබඩා කුලී ඉහළ දමූ අතර, අනෙක් ගාස්තු 1967 මාර්තු සිට ඉහළ දමුනි ) සහ ආදයමෙහි හිඟ මුදල් එකතු කිරීමය. 1968/69 දී ආදයම සුළු වශයෙන් වැඩි වෙතැයි ඇස්තමේන්තු කර ඇත. මුළු ආදයමම වාගේ උපයන ලද්දේ කොළඹ වරායෙහි වූ අතර, පිට වරායවලින් ලත් ආදයම සුළු ප්‍රමාණයක් විය. 1967/68 දක්වා තරමක් අනවතර වූ ක්‍රියාකාරී ( වර්තන ) වියදම 1968/69 දී තියුණු අන්දමින් ඉහළ යතැයි බලාපොරොත්තු වේ. මෙයට ප්‍රධාන හේතුව වනුයේ '' අතුරු'' දිමනාවන් ගෙවීම සහ උපකරණ නඩත්තු කිරීමේ වැඩි වන වියදමය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කොමිසම ලැබූ අතිරික්තය ( එනම්, කාරක වියදම අඩු වූ ආදයම ) 1967/68 දී තියුණු ලෙස ඉහළ ගියේ ප්‍රධාන වශයෙන් එම වර්ෂයෙහි ආදයම වැඩිවීම නිසා ය. 1968/69 දී ක්‍රියාකාරී වියදමෙහි අපේක්ෂිත වැඩිවීමත් සමගම 1968/69 අතිරික්ත සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ යතැයි ඇස්තමේන්තු කර ඇත.

නෙදර්ලන්තයෙහි ඉංජිනේරු උපදේශකයින්ගේ සමාගමක් මගින් ලංකාවේ වරායයන් ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ 1961දී නිකුත් කළ වාර්තාවකින්[2] වරාය කොමිසාරිස්වරයාගේ සහ වරාය ( නැව්බඩු ) සංයුක්ත මණ්ඩලයේ දැනට ඇති කාර්යයන් ඇතුළත් කොට ඒකාබද්ධ '' වරාය බලමණ්ඩලයක් '' පිහිටුවීමට යෝජනා කෙරුනි. මෙම අර්ධ ඒකාධිකාරී බලමණ්ඩලයට ප්‍රයෝජනයට ගන්නන් සහ කම්කරුවන්ගෙන් සෑදුනු කාරක සභාවක් මගින් අනුසාසනය කළ යුතු විය. තවද, මෙම වාර්තාව මගින් වරාය පාලන කටයුතු වෙත රේගු දෙපාර්තමේන්තුවෙන් කෙරෙන ඇඟිලි ගැසීම් ඉවත් කිරීමට ද, වරාය ගාස්තු ලිහිල් කිරීම ද, දැනට පවතින වරාය ගාස්තුවලින් නිදහස් කරනු වෙනුවට කෙළින් ම රජයේ සහනාධාර ගෙවීම, සෑම වෘත්තීය සමිතියක් ම නියෝජනය වුන වෘත්තීය සමිති කාරක සභාවක් උද්ගත කිරීම,සේවක කටයුතු වර්ධනය කිරීම සඳහා සේවක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, දැනට පවතින ශ්‍රමය ඉවත් කිරීමේ ක්‍රමය සංශෝධනය කොට ශ්‍රම දක්ෂතාවය වර්ධනය කිරීම වරාය මගින් සැපැයෙන වරාය පහසුකම් සම්බන්ධයෙන් සමහර ව්‍යුහයාත්මක වෙනස් කිරීම් ද ඇති කිරීමට එම වාර්තාව නිර්දේශ කළා ය. මෙම නිර්දේශයන් ගෙන් සමහරක් ක්‍රියාත්මක කර ඇත. '' ආවර්තන නැව් බඩු '' සම්බන්ධයෙන් පහසුකම් සැලැසීමට ද වරාය බලාපොරොත්තු වේ.

**වරාය ( නැව්බඩු ) සංයුක්ත මණ්ඩලය**

1958 අගෝස්තු මාසයේ දී වරාය ( නැව්බඩු ) සංයුක්ත මණ්ඩලය පිහිටවනු ලැබුවේ කොළඹ වරායෙහි බඩු පැටවීමේ පහසුකම් සැලසීම සහ එම වරායෙහි බඩු බෑමේ හා පැටවීමේ සමාගම් ජනසතු කිරීමටය.[3] එතැන් සිට, ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායන්වල බඩු බෑමේ හා පැටවීමේ කටයුතු ජනසතු කර ඇති අතර, පිළිවෙලින්, 1964 ඔක්තෝබර් සහ 1967 ඔක්තෝබර් මාසයේ සිට සංයුක්ත මණ්ඩලය වෙත පවරනු ලැබීය. පහත දක්වෙන II (ඇ) 9 සංඛ්‍යා සටහනින්, පසුගිය මුදල් වර්ෂ පහ තුලදී( අගෝස්තු සිට ජූලි දක්වා ) සංයුක්ත මණ්ඩලයේ කටයුතු පිළිබඳ සමහර සංඛ්‍යා තොරතුරු දක්වා ඇත.

---

1. ප්‍රධාන වශයෙන් අය විය යුතු ගාස්තු, කුලී සහ උපකරණ පාවිච්චි කිරීමේ ගාස්තුවලින් ලබාගත්.
2. නෙඩිකෝ : ඉහත දක් වූ පිටු xiii සිට xvi දක්වා.
3. වරාය ( නැව්බඩු ) සංයුක්ත මණ්ඩලය, 1958 13 වැනි පණත.

## සංඛ්‍යා සටහන II (ඈ) 9

## වරාය (නැව්බඩු) සංස්ථාව --1963/64 සිට 1967/68 (අ)

| ශීර්ෂ | 1963-64 | 1964-65 (ආ) | 1965-66 | 1966-67 | 1967-68 |
|---|---|---|---|---|---|
| 1. ආයෝජන ප්‍රාග්ධනය (රුපි. දශ ලක්ෂ) සංයුක්ත ... ... ... | **42.6** | **45.1** | **52.7** | **52.7** | **64.2** |
| (අ) කොළඹ ... ... ... | 42.6 | 44.4 | 50.1 | 50.1 | 58.1 |
| (ආ) ගාල්ල ... ... ... | — | 0.7 | 2.6 | 2.6 | 6.1 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | — |
| 2. එහා මෙහා කළ භාණ්ඩ (ටොන් දහස්) | **2,567** | **2,949** | **3,029** | **3,093** | **3,185** |
| (අ) කොළඹ ... ... ... | 2,567 | 2,849 | 2,957 | 3,040 | 2,906 |
| (ආ) ගාල්ල ... ... ... | — | 100 | 72 | 53 | 56 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | 223 |
| 3. අය භාරය (රුපි. දශ ලක්ෂ) ... | **55.0** | **62.0** | **73.7** | **75.8** | **86.7** |
| (අ) කොළඹ ... ... ... | 55.0 | 60.6 | 72.6 | 74.7 | 80.2 |
| (ආ) ගාල්ල ... ... ... | — | 1.4 | 1.1 | 1.1 | 1.1 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | 5.4 |
| 4. වියදම (රුපි. දශ ලක්ෂ) ... | **61.3** | **70.0** | **76.7** | **80.6** | **101.2** |
| (අ) කොළඹ ... ... ... | 61.3 | 67.5 | 73.8 | 77.7 | 90.8 |
| (ආ) ගාල්ල ... ... ... | — | 2.5 | 2.9 | 2.9 | 3.1 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | 7.3 |
| 5. ලාභ (+) හෝ පාඩු (—) (රුපි. දශ ලක්ෂ) ... ... | **–6.3** | **–8.0** | **–3.0** | **–4.8** | **–14.5** |
| (අ) කොළඹ ... ... ... | –6.3 | –6.9 | –1.2 | –3.0 | –10.6 |
| (ආ) ගාල්ල ... ... ... | — | –1.1 | –1.8 | –1.8 | –2.0 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | –1.9 |
| 6. සේවා නියුක්තිය (ගණනින්) ... | **16,059** | **17,059** | **17,792** | **17,974** | **20,188** |
| (අ) කොළඹ ... ... ... | 16,059 | 16,259 | 16,992 | 17,336 | 17,077 |
| (ආ) ගාල්ල ... ... ... | — | 800 | 800 | 638 | 631 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | 2,480 |
| 7. මුළු වැටුප් වැය (රුපි. දශ ලක්ෂ) ... | **46.0** | **51.8** | **56.7** | **67.7** | **83.0** |
| (අ) කොළඹ ... ... ... | 46.0 | 50.2 | 54.9 | 65.2 | 74.4 |
| (ආ) ගාල්ල ... ... ... | — | 1.6 | 1.8 | 2.5 | 2.8 |
| (ඇ) තිරිකුණාමලය ... ... | — | — | — | — | 5.8 |

මූලය : වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය

(අ) මුදල්වර්ෂයන් අගෝස්තු ජූලි. 1966/67 සිට සංඛ්‍යා තාවකාලිකය.

(ආ) ගාලු වරාය පිළිබඳ සංඛ්‍යා මාස 10 කට පමණි ; එනම්, 1964 ඔක්තෝබර් 1 වැනි ද සිට 1965 ජූලි 31 වැනි ද දක්වා.

1967/68 මුදල් වර්ෂය අවසානය වන විට, සංයුක්ත මණ්ඩලයේ, සනුවිචිත ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය ( එනම් 1968 ජූලි මස අවසානය වන විට ) රු. දශ ලක්ෂ 64.2 ක් වූ අතර, මෙමගින්, ඉකුත් වසරට වඩා රු. දශ ලක්ෂ 11.5 ක වැඩිවීමක් නිරූපනය වූයේය. මෙම ඉහල යාමෙන් රු. දශ ලක්ෂ 3.5 ක ප්‍රමාණයක් ගාලු වරාය සම්බන්ධයෙන් වූ අතර, ඉතිරිය කොළඹ වරාය වෙනුවෙන් විය.

සංයුක්ත මණ්ඩලයෙන් එහා මෙහා කළ භාණ්ඩ බර ප්‍රමාණය 1967/68 දී, ටොන් 92,000 කින් හෙවත් සියයට 3.0 කින් පමණ වැඩි වූ අතර, ඉකුත් වර්ෂයෙහි මෙම වැඩිවීම ටොන් 64,000 ක හෙවත් සියයට 2.1 ක් පමණ විය. 1967/68 දී වූ මෙම ඉහළ යාමට මුළුමණින්ම වාගේ හේතු වූයේ එම වර්ෂයේ දී ත්‍රිකුණාමල වරායෙහි නිමැවුමට ද ඇතුළත් කිරීම නිසාය. ඇත්ත වශයෙන්, 1967/68 දී කොළඹ වරායේ නිමැවුම, ඉකුත් වසරට වඩා ටොන් 134,000 කින් පහල වැටුනේය.

1967/68 දී බඩු බෑම සහ පැටවීමෙන් ලද ආදයම රුපි. දශ ලක්ෂ 10.9 කින් රුපි. දශ ලක්ෂ 86.7 දක්වා ඉහළ ගිය අතර, ඉකුත් වසරෙහි ඉහල යාම රුපි. දශ ලක්ෂ 2.1 කට පමණක් සීමා විය. මෙයට අඩ වශයෙන් හේතු වූයේ, ත්‍රිකුණාමල වරායෙන් ලද ආදයම රුපි. දශ ලක්ෂ 6.1 කින් සහ කොළඹ වරායෙන් ලත් ආදයම රුපි. දශ ලක්ෂ 5.5 කින් ද වැඩි වූ අතර, ගාලු වරායෙන් ලත් ආදයම මදකින් අඩුවීමෙන් හිලව් වී යාමය. එහා මෙහා කළ භාණ්ඩ ප්‍රමාණය අනුව තිබිය දී ද කොළඹ වරායෙහි ආදයම ඉහළ ගියේ ප්‍රධාන වශයෙන් නැව් බඩු පැටවීමෙන් ලත් ආදයමෙහි තිබුණු ඉහළ යාම ( රුපි. දශ ලක්ෂ 4.5 ) ක හේතුකොට ගෙනය. ආදයම ප්‍රධාන වශයෙන් අඩු වූයේ රු. දශ ලක්ෂ 0.7 කින් පහල වැටුනු ගල් අඟුරු බෑමෙන් සහ පැටවීමෙන් ලත් ආදයම සම්බන්ධයෙනි.

මේ අතර, 1967/68 දී සංයුක්ත මණ්ඩලයෙහි වියදම රුපි. දශ ලක්ෂ 20.6 ක හෙවත් සියයට 25.6 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙයින් රුපි. දශ ලක්ෂ 7.3 ක් ත්‍රිකුණාමල වරාය සම්බන්ධයෙන් වූ අතර, කොළඹ වරායෙහි වියදම රුපි. දශ ලක්ෂ 13.1 කින් හෙවත් සියයට 16.9 කින් වැඩිවුණි. එම වැඩි වූ වියදමෙන් වැඩි ප්‍රමාණයක් වැටුප් වියදම් වෙනුවෙන් වූ අතර, 1967/68 දී වැටුප් සඳහා කළ වියදම රුපි. දශ ලක්ෂ 15.3 කින් හෙවත් සියයට 22.6 කින් ඉහළ ගියේය. මෙම ප්‍රමාණයෙන් රුපි. දශ ලක්ෂ 5.8 ක් ත්‍රිකුණාමලයෙහි බඩු බෑමේ සහ පැටවීමේ කටයුතු ජනසතු කිරීමෙන් අනතුරුව, සේවයට ගත් සේවකයින් 2,480 ක් වෙනුවෙන් විය. රුපි. දශ ලක්ෂ 9.3 කින් හෙවත් සියයට 14.1 කින් ඉහල ගිය කොළඹ වැටුප් වැය ප්‍රමාණය වෙනුවෙන් ඉතිරි කොටස වෙන් විය. ඇත්ත වශයෙන්, 1967/68 මුළු සංයුක්ත මණ්ඩලයෙහි වියදමෙන් වැටුප් වැය පමණක් සියයට 82.0 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ දී අනුරූප අනුපාතය සියයට 84.0 ක් විය. මෙම ඉහළ අනුපාතයෙන් පෙනී යන්නේ වියදමෙන් වැඩි කොටසක් වෙන්වන ක්‍රමයෙහි එලදව වැඩි කිරීමෙන් ලංකාවේ වරාය කටයුතු වල සෞභාග්‍යයක් ඇති කළ හැකි බවය. 1967/68 දී සංයුක්ත මණ්ඩලයෙහි මුළු සේවා නියුක්තිය 2214 කින් හෙවත් සියයට 12.3 කින් ඉහළ ගිය අතර, ඉකුත් වසර තුළදී 182 ක හෙවත් සියයට 1.0 ක ආන්තික ඉහළ යාමක් පැවතිය. කොළඹ සහ ගාල්ලෙහි අඩුවීම් හිලව් කළ ත්‍රිකුණාමලයෙහි නව සේවකයින් බඳවා ගැනීම මුළුමනින්ම මෙයට හේතු විය.

මේ අනුව, 1967/68 දී පැවැති ආදයමෙහි වැඩිවීම, වියදමෙහි තියුණු ඉහල යාම ( හසුරුවනු ලැබූ භාණ්ඩ ප්‍රමාණය අඩු වුව ද ) නිසා හිලව් වී ගිය අතර, ඒ නිසා 1966/67 දී පැවැති රුපි. දශ ලක්ෂ 4.8 ක පාඩුව, 1967/68 දී රුපි. දශ ලක්ෂ 14.5 දක්වා ඉහල ගියේය. මුළු පාඩුවෙන් කොළඹ වරායෙහි පාඩුව, රුපි. දශ ලක්ෂ 10.6 ක් වූ අතර, ගාල්ලේ සහ ත්‍රිකුණාමලයෙහි පාඩුව පිළිවෙලින්, රුපි. දශ ලක්ෂ 2.0 ක් සහ 1.9 ක් විය. වරායයන් තුනම මැතදී අනුමත කළ සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක වීමේදී තවදුරටත් සිදුවන පාඩු අඩු කිරීමට හැකි වෙතැයි සංයුක්ත මණ්ඩලය බලාපොරොත්තු වේ. රුපි. දශ ලක්ෂ 11.1 ක ඇස්තමේන්තු කළ වියදම කින් යුත්, මෙම වැඩ පිළිවෙල මගින් වරායන්හී ශ්‍රම දක්ෂතාවය වැඩිවෙතැයි බලාපොරොත්තුවේ.

## ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

තෙල් ආනයනය, විකිණුම සහ නිෂ්පාදනය සඳහා පිහිටුවනු ලැබූ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, දැනට ඇති තෙල් වෙළෙඳ සමාගම් හා තරඟකාරීව, 1962 අප්‍රේල් මාසයේ දී වෙළෙඳ කටයුතු ආරම්භ කෙළේය. 1963 දී අභ්‍යන්තර මිහිතෙල් බෙද හැරීමේ කටයුතු ජනසතු කිරීමෙන් පසුව, ලංකාවේ තෙල් නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් ඒකාධිකාරයක් සංස්ථාවට හිමි විය. 1965 ට පසුව, තෙල් ශුද්ධ කිරීමේ කම්හලක් ගොඩනැංවීමට

## සංඛ්‍යා සටහන II (ඇ) 10

## ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව — 1964/1968

| ශීර්ෂය | 1964 | 1955 | 1966 | 1967 | 1968* |
|---|---|---|---|---|---|
| **1. ස්ථාවර වත්කම් වියදම අනුව ( රුපි. දශ ලක්ෂ සමුච්චිත) ...** | **46.5** | **80.6** | **89.2** | **99.7** | **170.3** |
| (අ) වෙළෙඳ ව්‍යාප්තිය ... | 46.5 | 78.2 | 81.2 | 81.6 | 87.2 |
| (ආ) තෙල් පිරිපහදු යෝජනා ක්‍රමය | — | 2.4 | 8.0 | 17.2 | 77.2 |
| (ඇ) මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලව යෝජනා ක්‍රමය ... | — | — | — | 0.5 | 5.0 |
| (ඇ) භූ-කම්පන සමීක්ෂණය ... | — | — | — | 0.4 | 0.9 |
| **2. තෙල් ආනයන ( ගැලුම් දශ ලක්ෂ (ආ)** | **208.8** | **183.9** | **195.5** | **224.5** | **214.3** |
| (අ) සුපිරි පෙට්‍රල් ... ... | 19.8 | 19.7 | 22.3 | 23.2 | 22.2 |
| (ආ) පිරි පෙට්‍රල් ... | 24.1 | 19.7 | 20.5 | 16.2 | 18.2 |
| (ඇ) ඔටෝ ඩීසල් ... ... | 46.3 | 42.1 | 45.4 | 55.5 | 53.2 |
| (ඇ) කාර්මික ඩීසල් ... | 26.3 | 22.9 | 21.6 | 21.3 | 26.1 |
| (ඉ) කළුතෙල් ( උඳුන් තෙල් ) ... | 42.6 | 24.5 | 35.8 | 39.6 | 33.2 |
| (ඊ) භූමිතෙල් ... ... | 49.7 | 55.0 | 49.9 | 68.7 | 61.4 |
| **3. තෙල් විකිණීම් ( ගැලුම් දශ ලක්ෂ ) (ආ)** | **175.2** | **186.8** | **200.8** | **219.4** | **221.0** |
| (අ) සුපිරි පෙට්‍රල් ... ... | 20.3 | 21.1 | 22.4 | 23.4 | 22.9 |
| (ආ) පිරි පෙට්‍රල් ... ... | 21.9 | 20.4 | 18.6 | 17.8 | 18.1 |
| (ඇ) ඔටෝ ඩීසල් ... ... | 39.6 | 42.8 | 47.2 | 53.2 | 53.4 |
| (ඇ) කාර්මික ඩීසල් ... | 22.3 | 21.9 | 21.6 | 23.5 | 22.3 |
| (ඉ) කළුතෙල් (උඳුන් තෙල් ) ... | 21.6 | 29.7 | 34.4 | 40.3 | 43.1 |
| (ඊ) භූමිතෙල් ... ... | 49.5 | 50.9 | 56.6 | 61.2 | 62.2 |
| **4. අයභාරය ( රුපි. දශ ලක්ෂ ) ...** | **265.3** | **265.9** | **300.6** | **318.3** | **350.8** |
| ඒ අතරින් තෙල් විකිණීම් ... | 263.0 | 264.5 | 298.8 | 316.1 | 348.6 |
| **5. වියදම රුපියල් දශ ලක්ෂ ...** | **234.1** | **245.2** | **277.5** | **303.1** | **346.2** |
| (අ) විකුණුනිෂ්පාදන වල ගොඩබෑ මිල | ල.නො. | 208.4 | 238.5 | 259.8 | 301.5 |
| (ආ) අනෙකුත් ... | ල.නො. | 36.8 | 39.0 | 43.3 | 44.7 |
| **6. ශුද්ධ ලාභය (+) රුපි. දශ ලක්ෂ )** | **+31.2** | **+20.7** | **+23.1** | **+16.1** | **+4.6** |
| **7. රක්ෂා නියුක්තිය — ගණනින් ...** | **1,595** | **1,750** | **2,129** | **2,215** | **2,515** |

මූලය : ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

* තාවකාලිකයි.

(අ) සංඛ්‍යාවන් මුදල් වර්ෂයන් සඳහා ය. ජනවාරි සිට දෙසැම්බර් දක්වා

(ආ) ස්නේහක තෙල්, ලිහිසි යනාදී සුළු ශීර්ෂ අත්හැර.

සහ මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් ස්ථාපනය කිරීම ඇතුළු භූ-සම්පත සමීක්ෂණයක් ද(මේ සියල්ල ම මෙතෙක් සම්පූර්ණ වී නැත. ) සංස්ථාව විසින් පවත්වා ඇත. පහත දැක්වෙන II (ඇ) 10 සටහනින් 1964 සිට 1968 දක්වා (ලිත් වර්ෂයන්) සංස්ථාවෙහි තෙල් බෙදා හැරීමේ කටයුතු පිළිබඳ සමහර ප්‍රධාන ලක්ෂණයන් නිරූපනය කරයි.

1968 දී සංස්ථාවෙහි මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 70.6න් රුපියල් දශ ලක්ෂ 170.3 දක්වා ඉහළ ගියේය. මෙය ප්‍රධාන වශයෙන් තෙල් ශුද්ධ කිරීමේ කම්හල වෙනුවෙන් ද (රුපියල් දශ ලක්ෂ 60.0) බෙදා හැරීමේ අයතන වෙනුවෙන් (රුපියල් දශ ලක්ෂ 5.6) මිශ්‍ර කිරීමේ යන්ත්‍රය (රුපියල් දශ ලක්ෂ 4.5) වෙනුවෙන් ද විය.

පසුගිය අවුරුදු පහ තුළ දී සංස්ථාවේ තෙල් ආනයනයන් ප්‍රමාණය උච්චාවචනය වී ඇත. 1967 තෙල් ආනයනයන් ඉහළ ගියේ මැද පෙරදිග යුද ගැටුම් උද්ගත වීමත්, ඒ හේතුවෙන් ජාත්‍යන්තර නැව් කටයුතු වෙත එල්ල වූ තර්ජනයන් ද හේතු කොට ගෙන ය. මේ අනුව, 1968 දී ආනයනයන් ප්‍රමාණය අඩු වූයේ, තරමක් දුරට මැද පෙරදිග අර්බුදය මගහැරීමෙන් අනතුරුව තොග ප්‍රයෝජනයට ගැනීම හේතු කොට ගෙනය. කෙසේ වුවද, දේශීය වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව අනවතර සහ අවිච්ඡන්න දියුණුවක් ලැබුවේය. පසුගිය අවුරුදුවල පැවතියාට වඩා උසස් මට්ටමේ වැඩිවීම් හා සසඳන කල, 1968 දී ගැලුම් දශ ලක්ෂ 2.5 ක වැඩිවීමට හේතුන් ලෙස දැක්විය හැක්කේ 1967 දී පැට්‍රල් මිල ඉහළ යාමෙන් සුපර් වර්ගයේ පැට්‍රල් විකුණුම් පහළ වැටීම සහ මිල අඩු සාමාන්‍ය වර්ගයේ පැට්‍රල් විකිණුම සුළු ප්‍රමාණයකින් ඉහළ යාමය. එමෙන් ම, කාර්මික ඩීසල් තෙල් මිලෙහි ද පහළ වැටීමක් සිදු විය. පසුගිය අවුරුදු කිහිපය මුළුල්ලේ කළුතෙල් සහ භූමිතෙල් විකිණුම් අනවතරයෙන් ඉහළ ගොස් ඇති අතර, කළු තෙල් (කර්මාන්ත වැඩියෙන් ප්‍රයෝජනයට ගන්නා) විකුණුම් ප්‍රමාණය වඩා වේගවත් අනුපාතයකින් ඉහළ ගියේය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1968 දී සංස්ථාවෙහි ආදයම ද අනවතරයෙන් ඉහළ ගොස් ඇති අතර, එය රුපියල් දශ ලක්ෂ 32.5කින් රුපියල් දශ ලක්ෂ 350.8 දක්වා ඉහළ ගියේය. 1968 දී සංස්ථාවේ වියදම ද, ඉහළ ගියේය. එනම් රුපියල් දශ ලක්ෂ 43.1කින් රුපියල් දශ ලක්ෂ 346.2 දක්වා ය. මෙම ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ ලංකා රුපියල අවප්‍රමාණය කිරීම නිසා ගෙන් වූ භාණ්ඩ මිල වැඩිවීමය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1967 සහ 1966 දී පිළිවෙළින් ලැබූ ලාභයන් වූ රුපියල් දශ ලක්ෂ 16.1 සහ 23.0 හා සැසැඳීමේ දී 1968 වර්ෂය සඳහා සංස්ථාවේ ලාභය රුපියල් දශ ලක්ෂ 4.6 දක්වා හීන විය. සංස්ථාවේ මුළු සේවා නියුක්තිය 1968 දී 300කින්, 2,515 දක්වා ඉහළ ගියේය. මෙසේ සේවා නියුක්ති ප්‍රමාණය ඉහළ ගියේ, තෙල් ශුද්ධ කිරීමේ සහ මිශ්‍ර කිරීමේ යන්ත්‍ර ස්ථාපනය කිරීමේ නව ආයෝජන කටයුතු නිසා ය.

දිනකට අශුද්ධ තෙල් බැරල් 38,000ක් පමණ හැසිර වීමේ හැකියාවක් ඇති රුපියල් දශ ලක්ෂ 150ක ඇස්තමේන්තු වියදමකින් ගොඩනැගුනු තෙල් ශුද්ධ කිරීමේ කම්හලෙහි කටයුතු 1969 මාර්තු මස අවසානය වන විට අවසන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන් තෙමසකට පසුව වාණිජ නිෂ්පාදනය ඇරඹෙනු ඇත. ලංඩනයේ සීමාසහිත කොන්සොලිඩේටඩ් පෙට්‍රෝලියම් සප්ලයි සමාගම සමග අත්සන් කළ ගිවිසුමකට අනුව අශුද්ධ තෙල් ද, ශිල්පීය සේවා සැපැයීමට සහ ශුද්ධ කිරීමේ කම්හලෙහි අතිරික්ත භාණ්ඩ විකිණුමට ද එකඟ වී ඇත.

## තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

රජයේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සිය වසරකට අධික කාලසීමාවක්ම ලංකාවේ තැපැල්, විදුලි සංදේශ සහ ටැලිපෝන් සේවාවන් මෙහෙයවනු ලැබීය. වෙනත් රජයේ දෙපාර්තමේන්තු මෙන්, මේ දෙපාර්තමේන්තුවද ලැබීම් සහ ගෙවීම් පදනම අනුව ගිණුම් පවත්වාගෙන යන නමුත්, නොමිළයේ සලසන පහසුකම් (නිදසුනක් වශයෙන් රජයේ දෙපාර්තමේන්තු වලට) සහ ක්ෂය වීම් යනාදිය සඳහා ගැලපිලි වලට ඉඩ තබමින්, වෙන් වශයෙන්, ''වාණිජ ගිණුම්'' මාලාවක් පළ කරනු ලබයි. 1966/67න් අවසන් වන (පසු සංඛ්‍යා මෙතාක් ලැබී නොමැත.) සතර අවුරුද්ද සඳහා වූ එකී වාණිජ ගිණුම්වලට අදළ සම්පිණ්ඩනයක් පහත සඳහන් II (ඇ) සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

තැපැල් සහ විදුලි සංදේශ සේවාවන් සඳහා යොදවනු ලැබූ මුළු ප්‍රාග්ධනය 1967 සැප්තැම්බරයට රුපියල් දශ ලක්ෂ 114.5 ක් වශයෙන් ඇස්තමේන්තු කොට තිබේ. [1] ටැලිපෝන් සේවාව සඳහා මෙකී මුදලින් රුපියල් දශ ලක්ෂ 105.4 ක් යෙදවාගෙන තිබේ.

---

1. ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් මෙන් නොව, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් මූලාරම්භයේ සිට කළ ප්‍රාග්ධන ආයෝජන පිළිබඳ සංඛ්‍යා සම්පූර්ණ වශයෙන් ලබාගත නොහැක. මෙම සංඛ්‍යාවෙන් පිළිබිඹු වන්නේ මෑත කාල වල ආයෝජනයන්ය.

1966/67 දී තැපැල් සේවාවට අයත් වූ ආදයම රුපි. දශ ලක්ෂ 57.5 ක් විය. මෙය මෙසේ වූයේ ඉකුත් වසරට වඩා රුපි. දශ ලක්ෂ 1.0 කින් පහත වැටීමක් හේතුකොට ගෙනය. මෙහි 1965/66 දී රුපි. දශ ලක්ෂ 6.0 ක්ව පැවතුන ලාභය 1966/67 දී රුපි. දශ ලක්ෂ 0.1 දක්වා පහත හෙලමින්, වියදම ( වාර්ෂිකයන් ඇතුළුව ) 1966/67 දී රුපි. දශ ලක්ෂ 4.9 කින් ඉහළ නැගිණි. විදුලි සංදේශ වලින් ලැබුන ආදයම 1966/67 දී රුපි. දශ ලක්ෂ 2.1 කින් වැඩි වී, රුපි. දශ ලක්ෂ 20.0 ක් විය. වියදම රුපි. දශ ලක්ෂ 2.5 කින් වැඩි වූයේ 1966/67 පාඩුව රුපි. දශ ලක්ෂ 2.2 දක්වා වැඩි කරමිනි. ටැලිපෝන් සේවාවේ ආදයමෙහි රුපි. දශ ලක්ෂ 3.4 කින් වැඩි වී තිබේ. එහෙත් 1965/66 දී රුපි. දශ ලක්ෂ 1.8 ක් වූ පාඩුව, 1966/67 දී රුපි. දශ ලක්ෂ 1.9 ක ලාභයක් බවට හරවමින්, 1967/68 දී වියදම පහළ වැටුණි. රුපි. දශ ලක්ෂ 2.3 ක ඉකුත් වසරේ ලාභය හා සසඳන කල, සමස්තයක් වශයෙන් තැපැල් හා විදුලි සන්දේශ සේවාවන් 1966/67 දී රුපි. දශ ලක්ෂ 0.3 ක පාඩුවක් පිට ක්‍රියාත්මක වී තිබේ. මෙයට හේතු වූ ප්‍රධාන සාධකයන් වූයේ, තැපැල් අයභාරය පහත වැටීම සහ ටැලිපෝන් සේවාවේ දියුණු ඵල විපාකයන් පමණ ඉක්මවා මකා හරිමින්, තැපැල් හා විදුලි සන්දේශ වියදමෙහි ඇති වූ වැඩි වීමය.

## සංඛ්‍යා සටහන II (ඇ) 11

## තැපැල් සහ විදුලි සංදේශ සේවය 1963/64 සිට 1966/67 (අ)

| ශීර්ෂ | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67 |
|---|---|---|---|---|
| 1. යෙදවූ ප්‍රාග්ධනය ( රුපි. දශ ලක්ෂ ) (ආ) ( රුපි. දශ ලක්ෂ–සමුච්චිත ) ... | **92.7** | **99.0** | **105.2** | **114.5** |
| (අ) විදුලි සංදේශ ... ... ... | 2.9 | 2.9 | 3.0 | 3.0 |
| (ආ) ටෙලිපෝන ... ... ... | 84.8 | 90.6 | 96.4 | 105.4 |
| (ඇ) අනෙකුත් ... ... ... | 5.0 | 5.5 | 5.8 | 6.0 |
| 2. තැපැල් සේවාව ( රුපි. දශ ලක්ෂ ) ... | | | | |
| (අ) අයභාරය ... ... ... | 50.7 | 49.8 | 52.5 | 51.5 |
| (ආ) වියදම (ඇ) ... ... ... | 46.2 | 46.0 | 46.5 | 51.4 |
| (ඇ) ශුද්ධ ලාභය+අලාභය (—) ... | + 4.6 | + 3.8 | + 6.0 | + 0.1 |
| 3. විදුලි සංදේශ සේවා ( රුපි. දශ ලක්ෂ ) | | | | |
| (අ) අයභාරය ... ... ... | 15.2 | 16.3 | 17.9 | 20.0 |
| (ආ) වියදම (ඇ) ... ... ... | 17.9 | 19.7 | 19.7 | 22.2 |
| (ඇ) ශුද්ධ ලාභය+අලාභය (—) ... | — 2.7 | — 3.4 | — 1.8 | — 2.2 |
| 4. ටෙලිපෝන් සේවාව ( රුපි. දශ ලක්ෂ ) | | | | |
| (අ) අයභාරය ... ... ... | 19.6 | 20.4 | 22.9 | 26.1 |
| (ආ) වියදම(ඇ) ... ... ... | 21.4 | 21.9 | 24.7 | 24.3 |
| (ඇ) ශුද්ධ ලාභය+අලාභය — ... | — 1.8 | — 1.5 | — 1.8 | + 1.9 |
| 5. (අ) මුළු අයභාරය ... ... | 86.5 | 87.3 | 94.2 | 98.7 |
| (ආ) මුළු වියදම ... ... ... | 86.4 | 88.6 | 91.9 | 99.0 |
| (ඇ) ශුද්ධ ලාභය+අලාභය (—) ... | —0.1 | -1.3 | — 2.3 | — 0.3 |
| 6. රක්ෂා නියුක්තිය ... ... ... | 24,762 | 25,031 | 22,187 | 22,844 |

මූලය : තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව.

(අ) මුදල් වර්ෂය ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වේ. 1966-67 සහ 1967-68 සඳහා වන සංඛ්‍යා තාවකාලිකය.

(ආ) විදේශ විදුලි සංදේශ සේවාව අත්හැර.

(ඇ) වාර්ෂික දයක මුදල් ඇතුළුව.

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

1967 ජනවාරියේදී පිහිටුවනු ලැබූ ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත ඊට කලින් පැවති රජයේ ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ දේපොළ පවරා ගනු ලැබීය. 1967/68 තුළදී ( වර්ෂය අවසන් වනුයේ 1968 සැප්තැම්බරයේදී ය ) සංස්ථාවේ ක්‍රියා කාරිත්වයෙහි ද ඒ හා සැසඳෙන, ක ලින් පැවැති රජයේ ගුවන් විදුලි දෙපාර්තමේන්තුවට අදළ සංඛ්‍යා තොරතුරු ද පහත II (ඇ) 12 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

සංස්ථාවේ වත්කම් වල වටිනාකම්, 1968 සැප්තැම්බරයේ දී, රුපි. දශ ලක්ෂ 6.0 ක්ව ඇස්තමේන්තු කර තිබේ. මේ අතර, 1967/68 අයභාරය, ප්‍රධාන වශයෙන් ම ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු ගෙවීම් පැහැර හැරීම නිසා, මදක් පහත වැටී, රුපි. දශ ලක්ෂ 8.3 ක්ව පැවතිය ද, වෙළඳ සේවයේ, ප්‍රචාරක කල් වේලාවන් අලෙවිය මගින් යටකී පහත වැටීම මදක් දුරට කැපී ගියේ ය. රුපි. දශ ලක්ෂ 7.5 ක්ව පැවැති වියදම ඉකුත් වසරට වඩා ආන්තික වශයෙන් අඩුවිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් විදුලි ප්‍රචාරයන්ගෙන් ලැබුන ලාභ 1966/67 දී පැවැති රුපි. දශ ලක්ෂ 1.2 සංඛ්‍යාවේ සිට 1967/68 දී රුපි. දශ ලක්ෂ 0.8 ක සංඛ්‍යාව දක්වා පහත වැටුණි. සංස්ථාවේ සේවා නියුක්තිය 1967/68 දී, 137 කින් වැඩි වී 935 ක් විය.

### සංඛ්‍යා සටහන II ( ඇ ) 12

### ලංකා ගුවන් විදුලි සංස්ථාව — 1963/64 සිට 1967/68 (අ)

| ශීර්ෂ | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68* |
|---|---|---|---|---|---|
| 1. වත්කම්වල වටිනාකම (ආ) ( රුපි. දශ ලක්ෂ ) ... ... | ල.නො. | ල.නො. | ල.නො. | 6.0 | 6.0 |
| 2. අයභාරය ( රුපි. දශ ලක්ෂ ) ... ... | 8.4 | 8.5 | 7.8 | 8.8 | 8.3 |
| (අ) බලපත්‍ර ගාස්තු ... ... | 4.2 | 4.3 | 3.9 | 4.5 | 3.5 |
| (ආ) වෙළෙඳ අංශයේ අලෙවිකාලය ... | 3.6 | 3.7 | 3.4 | 3.5 | 4.0 |
| (ඇ) අනෙකුත් ... ... ... | 0.5 | 0.6 | 0.5 | 0.7 | 0.8 |
| 3. එහි වියදම ( රුපි. දශ ලක්ෂ ) ... ... | 7.3 | 7.5 | 8.3 | 7.6 | 7.5 |
| (අ) සවදේශීය සේවය ... ... | 4.2 | 4.3 | 4.6 | 3.9 | ල.නො. |
| (ආ) වෙළෙඳ සේවය ... ... | 3.1 | 3.2 | 3.7 | 3.7 | ල.නො. |
| 4. ලාභය (+) අලාභය (—) ( රුපි. දශ ලක්ෂ ) ... ... | +1.1 | +1.1 | –0.5 | +1.2 | +0.8 |
| 5. සේවා නියුක්තිය (ගණන) (ආ) ... | 795 | 795 | 841 | 798 | 935 |

මූලය : ලංකා ගුවන් විදුලි සංස්ථාව.

* තාවකාලිකයි.

(අ) ඔක්තෝබර් මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ මුදල් වර්ෂය සඳහාය.
1967-68 වර්ෂයේ සංඛ්‍යා තොරතුරු තාවකාලිකය. ගුවන් විදුලි දෙපාර්තමේන්තුව යටතේ පැවැති ගුවන් විදුලි සේවය, 1967 ජනවාරි 5 වැනි දින ලංකා ගුවන් විදුලි සංස්ථාවක් බවට පත් කරන ලදී.

(ආ) වර්ෂය අවසානයේ තොරතුරු අනුවය,

## සමුපකාර තොග වෙළෙඳ ආයතනය

දෙවැනි ලෝක සංග්‍රාමය කාලයේදී අත්‍යාවශ්‍ය භාණ්ඩයන් ගේ හිඟයන් පිරිමැසීම වස්, පිහිටුවනු ලැබූ වෙළෙඳ හා බෙද හැරීමේ ආයතන ජාලය තවදුරටත් පවත්වා ගැනීමක් වශයෙන් 1950 ජූලි මාසයේ දී, මෙම ආයතනය පිහිටුවනු ලැබීය. මූලික වශයෙන්, තොග වෙළඳ සංවිධානයක් විය යුතු යයි අදහස් කරනු ලැබූ මෙම ආයතනය දීප ව්‍යාප්ත පදනමක් මත සිල්ලර අලෙවි සංවිධානයක් වශයෙන් ( විශේෂයෙන්ම නමසිය පණස් ගණන් වලදී ) ව්‍යාප්ත විය. 1964 වන විට, අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ( කරවල ආනයන ඒකාධිකාරය ඇතුළුව ) බෙහෙත් වර්ග, පොහොර, විකිණීමට හා ආනයනය කිරීමටත් ප්‍රවාහන මුද්‍රණ සහ අපනයන කටයුතු වල යෙදීමටත් පෙට්‍රල් දූරවන ස්ථානයන් මෙහෙයවීමටත්, මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වයන් පුළුල් විය. පොහොර ප්‍රචාරක සහ ඖෂධ දෙපාර්තමේන්තුව 1964/65 තෙක් වසා තිබිණ. රෙදි පිළි සහ අපනයන දෙපාර්තමේන්තු විසින් කරගෙන ගිය කාර්යය[1] රජයේ නව සමාගම් දෙකක, එනම් සීමාසහිත ලංකා සළු සල සහ, සීමා සහිත ඒකාබද්ධ අපනයන ( ලංකා ) සමාගම් වලට පිළිවෙළින් 1967 ඔක්තෝබර් 1 වැනි දින හා 1968 ජනවාරි 1 වැනි දින පවරා දෙනු ලැබීය. දැනට එහි ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් වී ඇත්තේ සිල්ලර බඩු ( නිදසුනක් වශයෙන් සීනි සහ ටින් මාළු ) සිමෙන්ති, ලෝහ භාණ්ඩ සහ වෙනත් ගෙදර දොරේ පාවිච්චියට ගන්නා අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සහ අලෙවිය ය.

1967 වසරින් අවසන් වන සතර වසර සඳහා ස. තො. සෙහි ඇතැම් මූලික සංඛ්‍යා තොරතුරු පහත II (ඇ) 13 සටහනින් දැක් වෙයි.

### සංඛ්‍යා සටහන II ( ඇ ) 13

### සමුපකාර තොග වෙළඳ ආයතනය — 1964/67 (අ)

| ශීර්ෂ | 1964 | 1965 | 1966 | 1967* |
|---|---|---|---|---|
| **1. ප්‍රාග්ධනය ( රුපි. දශ ලක්ෂ ) ... ... ...** | **40.9** | **64.0** | **75.4** | **107.5** |
| (අ) ස්ථාවර (සම්මත වූ ) ... ... ... | 11.7 | 12.2 | 10.9 | 16.2 |
| (ආ) කාරක ( ශුද්ධ ) ... ... ... | 29.2 | 51.8 | 64.5 | 91.3 |
| **2. මුළු පිරිවැටුම ( රුපි. දශ ලක්ෂ ) ... ...** | **689.5** | **732.2** | **784.2** | **837.5** |
| **3. මුළු වියදම ( රුපි. දශ ලක්ෂ ) ... ...** | **680.2** | **700.4** | **750.0** | **779.2** |
| 4. ලාභය හෝ අලාභය (—) රු. දශ ලක්ෂ | **+9.3** | **+31.8** | **+34.2** | **+58.3** |
| **5. ප්‍රධාන දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ( ලාභය හෝ අලාභය ) ( රුපි. දශ ලක්ෂ ) ...** | | | | |
| (අ) සාමාන්‍ය වෙළඳාම ... ... ... | +5.7 | +27.3 | +31.8 | +52.2 |
| (ආ) කරවල ... ... ... ... | +2.5 | +3.8 | +2.4 | +5.4 |
| **6. සේවා නියුක්තිය ( ගණන ) ... ... ...** | **4,322** | **4,467** | **4,918** | **5,581** |

මූලය : සමුපකාර තොග වෙළඳ ආයතනය.

* තාවකාලිකයි.

(අ) මෙම සංඛ්‍යා තොරතුරු ජනවාරි, දෙසැම්බර් දක්වා වූ මුදල් වර්ෂය සඳහා ය. 1968 සඳහා සංඛ්‍යා තවම ලබාගත නොහැකිය.

(ආ) විවිධ දෙපාර්තමේන්තුවලට වෙන් නොකළ ඇතැම් වැය '' සාමාන්‍ය අලෙවියෙන් '' අය කර ගෙන ඇත.

1. 1966, 38 වැනි ස. තො. ස. සංශෝධන පනත යටතේ ආරම්භ කරන ලදී.

මෙම කාලසීමාව තුළදී ස. තො. ස. හි. මුළු පිරිවැටුමෙහි ස්ථාවර වැඩිවීමක් දක්නට ලැබිණ. 1967 දී මෙම වැඩිවීම රුපි. දශ ලක්ෂ 53.3 ක් හෙවත් සියයට 6.8 ක්විය. මෙයට ප්‍රති විරුද්ධ වශයෙන් වියදම වැඩි වූයේ අඩු වේගයකිනි. මෙයට තරමක් දුරට හේතු වූයේ, කලින් කී පරිදි ලාභ දයක නොවන ඇතැම් ක්‍රියාකාරිත්වයන් වසාලීම ය. මෙම කරුණත්, පිරිවැටුමෙහි ක්‍රමවත් වැඩි වීමත් හේතුකොට ගෙන, 1965 න් පසුව, සිය වාර්ෂික ශුද්ධ ලාභය ක්‍රමයෙන් වැඩිකර ගත හැකි විය. 1965 දී රුපි. දශ ලක්ෂ 58.3 ක් වූ ශුද්ධ ලාභය වාර්තාගතව ඇති ඉහළම ලාභ සංඛ්‍යාව වෙයි. මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වයන් අතුරින් ප්‍රධාන ලාභ උපයන ක්‍රියාකාරිත්වයන් වූයේ, සාමාන්‍ය වෙළඳාම ( මුළු ලාභයන් සියයට 89.4 ක් සඳහා හේතු වූ ) සහ කරවල ආනයනය සහ වෙළඳාමය. මේ අතර ඇතැම් කාර්යයන් නවතා තිබියදීත් සේවා නියුක්තියෙහි ස්ථිර වැඩිවීමක් දක්නට ලැබිණ. 1967 අවසානයේ දී සේවා නියුක්තිය 5,581 දක්වා වැඩි වූ මුත්, 1968 අවසානයේ දී 5,505 තෙක් මඳ වශයෙන් පහත වැටිණි.

## කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය

කාර්මික ජනපද ඇති කිරීමේ පරමාර්ථයෙන් 1960 ජනවාරි මාසයේදී ඉහත සඳහන් සංස්ථාව පිහිටුවන ලදී. ( සෑම පහසුවෙකින් හෙබි කාර්මික භූමි ප්‍රදේශ එක් කොට ශත්‍ය කාර්මිකයන්ට කුලයට දීමට. ) මෙම සංස්ථාව මගින් ප්‍රථම කාර්මික ජනපදය 1965 දී ඒකල පිහිටුවන ලදී. ( පළමු වන පියවරේ කාර්මික ඒකක 20, 1963 දීද, දෙවන පියවරේ කාර්මික ඒකක 23, 1965 දීද අවසන් කරන ලදී. ) පහත දැක්වෙන II (ඇ) 14 සංඛ්‍යා සටහනින් මෙම කාර්මික ජනපද සංයුක්ත මංඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර දක්වා ඇත.

**සංඛ්‍යා සටහන II (ඇ) 14**

**කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය 1963/64 — 1967/68(අ)**

| විෂය | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68* |
|---|---|---|---|---|---|
| 1. වර්ෂය අවසානයේ ප්‍රාග්ධන ආයෝජන ( රු. '000 ) ... ... | 5,137 | 7,637 | 7,707 | 7,807 | 8,707 |
| 2. ධාරිතාවය ( කාර්මික ඒකක ප්‍රමාණ වශයෙන් ) ... ... | 43 | 43 | 43 | 43 | 43 |
| 3. මුළු ලැබුම් රු. '000 ( කර්මාන්ත බදු කුලිය ) ... ... | 157 | 176 | 251 | 360 | 350 |
| 4. ලාභ (+) හෝ අලාභ (—) රු. '000 ... | –6 | +3 | +46 | +52 | +91 |
| 5. සේවා නියුක්තිය ... ... ... | 16 | 17 | 22 | 21 | 23 |

මූලය : කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය.

* තාවකාලිකයි.

(අ) අප්‍රේල් සිට මාර්තු දක්වා මුදල් වර්ෂයන් සඳහාය.

1967/68 වර්ෂයේ අවසානයේදී මෙම සංයුක්ත මණ්ඩලයේ ප්‍රාග්ධන ආයෝජනයන් රුපියල් දශ ලක්ෂ 8.7 ක් විය. මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන් ඒකල ගොඩනගනු ලැබූ කාර්මික භූමි ප්‍රමාණයන් 43 සඳහා විය. සංයුක්ත මණ්ඩලයේ මුළු අයභාරය ( කාර්මිකශාලා කුලිය ද ඇතුළු ) රුපියල් දශ ලක්ෂ 0.35 ක් වූ අතර, ඉකුත් වර්ෂයට වඩා මෙම ප්‍රමාණය සුළු වශයෙන් අඩු විය. කෙසේ හෝ 1967/68 දී සංයුක්ත මණ්ඩලයේ ලාභ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.09 විය. සංස්ථාව මගින් සේවයේ නියුක්ත කළ ප්‍රමාණය 23 ක් විය. මහනුවර, ගාල්ල, යාපනය යන ස්ථානවල තවත් කාර්මික ජනපද 3 ක් පිහිටුවීමට සංස්ථාව බලාපොරොත්තු වන අතර ඒකල කාර්මික සංකීර්ණය පුළුල් කිරීමට ද බලාපොරොත්තු වේ. කාර්මික ඒකක 35 කින් යුත් ( පළමුවන පියවර ) මහනුවර කාර්මික වත්ත සඳහා රුපියල් දශ ලක්ෂ 12.6 ක් වැය වේ. 1969 අප්‍රේල්වල මෙහි වැඩ ආරම්භ කිරීමට සහ 1970 සැප්තැම්බර්වලදී වැඩ නිම කිරීමට

බලාපොරොත්තු වේ. මෙම ධාරිතාවයෙන් සහ වියදමෙන් යුතු ගාළු කාර්මික ජනපදය ද ( පළමු-වන පියවර ) 1970 දී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම කාර්මික සංකීර්ණයන් 35 කින් යුතු රුපියල් දශ ලක්ෂ 10 ක් වැය වන යාපනයේ කාර්මික ජනපදය ද මෙම කාලය තුළදීම වැඩ නිම කිරීමට කටයුතු යොද ඇත. ඒකල කර්මාන්ත ජනපදය සඳහා අතිරේක කාර්මික ඒකක 60 ඇති කිරීමට ද අදහස් කර ඇත.

**ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය**

1949 ඇරඹු ද සිට 1965 දක්වා, මෙම මණ්ඩලය හඳුන්වනු ලැබුයේ ගල්ඔය සංවර්ධන මණ්ඩලය[1] වශයෙනි. එකල ද මෙම මණ්ඩලය මගින් වර්ග සැතපුම් 1217 වන ගල්ඔය මිටියාවතේ සම්පූර්ණ වගකීම දරන ලදී. '' පළාතක් වැඩි දියුණු කිරීමේ බලධාරියකු '' වශයෙන් මෙම මණ්ඩලයට අයත් වූ කාර්යයන් වූයේ, වාරිමාර්ග පහසුකම් සැපයීම, ගං වතුර මර්ධනය කිරීම, ගොවියන් පදිංචි කරවීම, කෘෂිකර්මය, පරිවහනය, ගමනාගමනය සහ සමාජීය සැප පහසුකම් වැඩි දියුණු කිරීම සහ බලධාරීත්වය යටතේ පවතින ප්‍රදේශයේ සමස්ත පාලනය ආදියයි. 1961 දී මෙම මණ්ඩලය මගින් වැඩි ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙන් පසු, මෙම සංවර්ධනය කළ ප්‍රදේශයන් මධ්‍ය ආණ්ඩුවේ පරිපාලනයට භාර දීම අරඹන ලදී. එතැන් සිට, ප්‍රධාන කාර්යයන් වූ (වේලි ජලාශ සහ ඇළ), සීනි කර්මාන්තය, ගුවන් මාර්ග, විදුලි බල මධ්‍යස්ථානය, කාර්මික පුහුණු කිරීමේ ආයතනය සහ හාල් මෝල වැනි ඒවා රජයේ විවිධ දෙපාර්තමේන්තුවලට සහ සංස්ථාවලට භාර දීමට පටන් ගති.

මෙලෙස ගල්ඔය වැඩ කටයුතු ක්‍රමයෙන් වැඩිවීමත් සමග 1965[2] මෙම මණ්ඩලය '' ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය '' වශයෙන් නැවත සංස්ථාපිත කරන ලදී. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ගංගා නිම්න සංවර්ධනයන් සහ සමාන වැඩ කටයුතු ද අඩංගුවන පරිදි මෙම මණ්ඩලයේ කාර්යයන් පුළුල් කරන ලදී. මූලින්ම මෙම මණ්ඩලය මගින් වර්ග සැතපුම් 954 වන උඩ වලවේ ගංගා නිම්නය සංවර්ධනය අරඹන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා වැය වන මුදල රුපියල් දශ ලක්ෂ 373.7 වශයෙන් ඇස්තමේන්තු කර ඇත. එමෙන්ම ගල්ඔය මූලික වැඩපලේ කාර්ය මණ්ඩලය සහ බැර යන්ත්‍ර, '' බැර නිර්මාණ අංශය '' වශයෙන් 1967 දී මධ්‍යගත කරන ලදී. මේ නිසා මණ්ඩලයට බැර කටයුතු ගොඩ නැගීමේ සංවිධානයක්[3] වශයෙන් කටයුතු කිරීමට ඉඩකඩ ලැබුණි. එමෙන්ම මෙම මණ්ඩලය මගින් ජින්, බ්‍රැන්ඩි, වැනි දේශීය මත් ද්‍රව්‍ය නිෂ්පාදනය ද, ඉන්පසුව ලන්ඩනයේ ගාලා සුවඳ විලවුන් සමාගමේ සහාය ඇතිව සුවඳ විලවුන් නිෂ්පාදනය ද ඇරඹූහ.

මණ්ඩලය මගින් කරනු ලැබූ විවිධ කාර්යයන් පිළිබඳ නියම සංඛ්‍යා ලබා ගැනීම ඉතාම අසීරු අතර, පහත දැක්වෙන II (ඇ) 15 සංඛ්‍යා සටහනෙන්, 1967 68 ( ඔක්තෝබර් සිට සැප්-තැම්බර් ) අවසන් වූ ඉකුත් සිව් වසර තුළ එම මණ්ඩලයේ කාර්යයන් පිළිබඳ සමහර සංඛ්‍යා දක්වා ඇත.

1966/67 දී මණ්ඩලය කළ මුළු ප්‍රාග්ධන යෙදවුම්වල රුපියල් දශ ලක්ෂ 84.3 පහළ වැටීමක් පෙන්නුම් කෙරේ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1966 ඔක්තෝබර්වල සිට සීනි කර්-මාන්ත ශාලාව ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට බාර දීම නිසා එහි ප්‍රාග්ධන යෙදවුම් අඩුවීමයි. ගල්ඔය සහ උඩ වලවේ යෝජනා ක්‍රමවල ප්‍රාග්ධන යෙදවුම්වල වැඩිවීමක් පෙන්නුම් කළ අතර වෙනත් ප්‍රාග්ධන යෙදවුම් පිළිබඳ විස්තර ලබා ගත නොහැකිය.

ගල්ඔය ප්‍රාදේශීය බලධාරිත්වය යටතේ පැවතුන ඉතිරි ප්‍රදේශ වලින් ඉකුත් වර්ෂවලදී මෙන්ම 1966/67 දීද හිඟයක් ලැබුණි. එහෙත් උළු, ගඩොල් සහ වඩු කර්මාන්ත ශාලාවල කටයුතු වලින් ලාභ ලැබුණි. එමෙන්ම ගල්ඔය ප්‍රදේශයේ අක්කර 100,000 වත් වඩා ඉඩම් වලට වාරිමාර්ග පහසුකම් සපයා ඇති බව ඇස්තමේන්තු කර ඇත.

උඩ වලවේ යෝජනා ක්‍රමය පිළිබඳව ද විස්තරාත්මක සංඛ්‍යා තොරතුරු වැඩිපුර ලබා ගත නොහැක. උපකරණ අංශය සහ වාණිජ කටයුතුවල සමහර අංශයන්ගෙන් ලාභ ලැබී ඇති අතර, ලී ඉරීමේ මෝලෙන් අලාභ වී ඇත. මෙම යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමෙන් පසුව අක්කර 60,000 කට මද වාරිමාර්ග පහසුකම් ලබා දෙන අතර, කිලෝවට් 5940 ප්‍රමාණයක බලය ලබා දෙනු ඇත.

---

1. 1949 ගල්ඔය සංවර්ධන මණ්ඩල පනත, අංක 51.
2. 1965 අංක 6 දරණ ගංගා නිම්න සංවර්ධන මණ්ඩල පනත.
3. රාජ්‍ය කාර්මික නීති ගත සංස්ථාවට සමානය.

## සංඛ්‍යා සටහන් II (ඇ) 15

## ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය—1963-64 සිට 1966-67 (අ)

| ශීර්ෂ | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67 |
|---|---|---|---|---|
| **1. ප්‍රාග්ධන යෙදවුම් (ආ) (සංග්‍රහය රු. දශ ලක්ෂ)** | **779.8** | **832.1** | **875.3** | **791.0** |
| (අ) ගල්ඔය යෝජනා ක්‍රම ... ... ... | 660.2 | 674.0 | 682.9 | 700.8 |
| (ආ) ගල්ඔය සීනි කර්මාන්තය ... ... | 109.1 | 112.9 | 117.2 | — |
| (ඇ) උඩ වලවේ යෝජනා ක්‍රමය ... ... | 10.5 | 45.2 | 75.2 | 90.2 |
| **2. ලාභ (+) හෝ අලාභ (—) (ඇ) ( රු. '000 ) ...** | | | | |
| (අ) ප්‍රධාන කාර්යාලය (ඈ) ... ... | ල.නො. | ල.නො. | — 815 | — 1,449 |
| (ආ) ගල්ඔය යෝජනා ක්‍රමය ... ... මේවායින්, | ල.නො. | —10,319 | —11,500 | — 9,161 |
| (1) උළු සහ ගඩොල් කර්මාන්තය ... | + 138 | + 160 | + 117 | + 57 |
| (2) විදුලි බල ... ... ... | — 1,229 | + 341 | — | — |
| (3) හාල් මෝල ... ... ... | — 4 | — 93 | — 15 | — |
| (4) වඩු කර්මාන්ත ශාලාව ... ... | — 345 | — 297 | — 261 | + 380 |
| (ඇ) සීනි කර්මාන්තය ... ... ... | — 4,281 | — 6,195 | — 6,295 | — |
| (1) සීනි කර්මාන්ත ශාලාව ... ... | — 8,689 | —12,182 | —12,392 | — |
| (2) ස්කාගාරය ... ... ... | + 4,408 | + 5,987 | + 6,096 | — |
| (ඈ) උඩ වලවේ යෝජනා ක්‍රමය ... ... මේවායින්, | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| (1) උපකරණ අංශය ... ... ... | ල.නො. | ල.නො. | — 495 | — 4,105 |
| (2) ඉරුම් මෝල ... ... ... | ල.නො. | ල.නො. | — 201 | — 75 |
| (3) වෙනත් වාණිජ කටයුතු ... ... | ල.නො. | ල.නො. | — 154 | + 28 |
| (ඉ) සුවඳ විලවුන් කර්මාන්ත ශාලාව ... ... | — | — | — | + 43 |
| **3. සේවා නියුක්තිය (ගණන) ... ... ...** | **ල.නො.** | **ල.නො.** | **11,499** | **14,695** |

මූලය : ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය.

(අ) ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා මුදල් වර්ෂවලට, සෑම සංඛ්‍යාවක්ම තාවකාලිකය.
(ආ) වෙනත් ආයතනවලට පවරා දුන් ආයතනවල කළ ආයෝජනයන් ද ඇතුළත් වේ.
(ඇ) සමහර අවස්ථාවලදී, අය හා වැය අතර වෙනස් මේ සංඛ්‍යා වලින් පෙන්නුම් කෙරේ.
(ඈ) ප්‍රධාන කාර්යාලය පිළිබඳ ගණන් හිලව් පවත්වා ගෙන යාම පටන් ගත්තේ 1965-66 සිට පමණි.

1966/67 සුවඳ විලවුන් කර්මාන්ත ශාලාවෙන් රුපියල් 43,000 ක ලාභයක් ලැබුණි. එමෙන්ම මේ අතර මණ්ඩලය විසින් අලෙවිය සඳහා දේශීය මත් ද්‍රව්‍ය බෝතල කිරීම තව දුරටත් පවත්වා ගෙන යන ලදී.

### ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

රජයට අයත් ව ( ඉඩම් කොමසාරිස්වරයාට සහ දේශීය ආදයම් බදු කොමසාරිස්වරයාට අයත්ව තුබු ) තුබුන වතුයායන් අටක් භාර ගෙන ඒවා පරිපාලනය කිරීම උදෙසා 1959 දී මෙම සංස්ථාව පිහිටුවන ලදී. මෙයට අමතරව මෙම මණ්ඩලය මගින් තවත් වතුයායන් හතරක් ආරම්භ කර ඇත. 1967/68 අවසානය වන විට මෙම මණ්ඩලය මගින් වතුයායන් දෙළහක් සහ තේ කර්මාන්ත ශාලා 4 ක් පාලනය කරන ලදී. පහත දැක්වෙන II (ඇ) 16 වැනි සංඛ්‍යා සටහනේ මේවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර දක්වා ඇත.

මණ්ඩලය යටතේ පාලනය වූ වතුයායයන් දෙළහේ මුළු අක්කර ප්‍රමාණය 1965/66 සිට අක්කර 8654 ක්ව පැවතුනි. 1967/68 දී සමස්ත වශයෙන් වතුයායයන්ගෙන් ලද ආදයම රුපි. දශ ලක්ෂ 4.5 ක් වූ අතර, එම නිසා රුපි. දශ ලක්ෂ 0.29 ක ලාභයක් ලැබුණි. ඉකුත් වර්ෂය හා සසඳන විට එම වර්ෂයේ රුපි. දශ ලක්ෂ 0.35 ක අලාභයක් ලැබුනි. මෙම වර්ෂයේ ලාභයට හේතු වූයේ, ඉදල්ල,යෙලන්ගොවරි, හිග්ගොඩ නේවිස්මියර්,පැලවත්ත, ගිරාගම යන වතු වලින් ලාභ ලැබීමත්, මෙම ලාභ නිසා නෙල්ලැල්ල, යටවත්ත, යහලතැන්න, දිප්පිටිය යන වතු වලින් ලැබූ අලාභ මැකී යාමත් නිසා ය. 1967/68 වර්ෂයේ මෙම වගාවන් 12 හේ සේවා නියුක්තිය 7,213 ක් වූ අතර මෙම ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා 772 කින් වැඩිවීමකි.

## සංඛ්‍යා සටහන II (ඇ) 16

## ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය (අ)

| ශීර්ෂය | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67 | 1967-68 |
|---|---|---|---|---|---|
| 1. ආයෝජන ප්‍රාග්ධන ( වර්ෂය අවසානයේ දී ) ... ... | | **27,954** | **33,542** | **39,185** | **43,577** |
| (අ) වගාවන් සඳහා ... ... | ල.නො. | 22,848 | 28,378 | 34,000 | 36,500 |
| (ආ) කර්මාන්ත ශාලා ... ... | 4,900 | 5,106 | 5,164 | 5,185 | 7,077 |
| **2. වගාවන්** | | | | | |
| (අ) ගණන ... ... ... | 12 | 12 | 12 | 12 | 12 |
| (ආ) මුළු අක්කර ප්‍රමාණය ... | 8,441 | 8,435 | 8,654 | 8,654 | 8,654 |
| (ඇ) වගා කළ මුළු අක්කර ප්‍රමාණය... | 5,097 | 5,290 | 5,565 | 5,513 | 5,794 |
| (ඈ) මුළු අයභාරය (රු. '000) ... | 2,029 | 2,130 | 1,841 | 3,193 | 4,509 |
| (ඉ) ලාභය (+) හෝ පාඩුව (—) (රු. '000) ... ... ... | –235 | + 8 | +111 | –350 | +290 |
| (ඊ) සේවා නියුක්තිය ... | 6,181 | 6,209 | 6,631 | 6,441 | 7,213 |
| **3. කර්මාන්ත ශාලා** | | | | | |
| (අ) ගණන ... ... ... | 3 | 3 | 3 | 3 | 3 |
| (ආ) මුළු අය භාරය (රු. '000) ... | 1,901 | 2,038 | 2,107 | 1,458 | 3,155 |
| (ඇ) ලාභය (+) හෝ පාඩුව (—) ... (රු.'000) | –3 | +6 | –33 | –134 | +20 |
| (ඈ) සේවා නියුක්තිය ... | 231 | 254 | 215 | 192 | 246 |
| **4. මණ්ඩල ( සමස්ථයක් ලෙස ගත් විට )** | | | | | |
| (අ) මුළු අයභාරය ( රු. '000 ) ... | 3,930 | 4,168 | 3,948 | 4,651 | 6,065 |
| (ආ) ලාභය (+) හෝ පාඩුව (—) (ආ) (රු. '000) | –238 | +14 | +78 | –484 | +310 |
| (ඇ) සේවා නියුක්තිය ... | 6,412 | 6,463 | 6,846 | 6,633 | 7,459 |

මූලය : රාජ්‍ය වැවිලි මණ්ඩලය.

(අ) සැප්තැම්බර්වලින් අවසන් වන මුදල් වර්ෂය සඳහා ය. සැම සංඛ්‍යාවක් ම තාවකාලිකයි.

(ආ) මෙම සංඛ්‍යා ලේඛනයේ 2 (ඉ) සහ 3 (ඇ) යන ශීර්ෂවල එකතුව වන ලාභ සහ අලාභ සංඛ්‍යා, බදු අය කිරීමට පෙර මණ්ඩලය මගින් ප්‍රසිද්ධ කරනු ලැබූ වාර්ෂික වාර්තාවේ එන සංඛ්‍යාවලින් වෙනස් වේ. පසුව කී වර්තාව අනුව 1963-64 රුපි. 97,000 අලාභයක් ද, 1964-65 රු. 35,000 ක ලාභයක් ද මණ්ඩලය ලැබූ අතර, 1965-66 රු. 86,000 ක අලාභයක් සහ 1966-67 රු. 16,000 ක ලාභයක් ලබා ඇත.

## සංඛ්‍යා ලේඛන — (ඇ) 17

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව. 1964 — 1968 (අ)

| ශීර්ෂ | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
|---|---|---|---|---|---|
| **1. ප්‍රාග්ධන ආයෝජන ... ... ...** | **10.0** | **10.0** | **10.0** | **10.0** | **10.0** |
| **2. ජීවිත රක්ෂණ** | | | | | |
| (අ) වලංගු ජීවිත රක්ෂණ සහතික ප්‍රමාණය ( වර්ෂය අවසානයේ ) ... ... | 69,902 | 85,110 | 98,246 | 103,285 | ල.නො. |
| (ආ) වලංගු ජීවිත රක්ෂණවල වටිනාකම ( වර්ෂය අවසානයේ ) රු. දශ ලක්ෂ .. | 323.5 | 411.6 | 509.6 | 540.5 | ල.නො. |
| (ඇ) වාර මුදල් අයභාරය ( වර්ෂය තුළදී ) රු. දශ ලක්ෂ ... ... ... | 15.5 | 21.0 | 26.5 | 27.6 | 36.8 |
| (ඈ) ඉල්ලා සිටීම් ( වර්ෂය තුළදී ) රු. දශ ලක්ෂ | 0.5 | 0.9 | 0.8 | 1.6 | 1.7 |
| (ඉ) ජීවිත රක්ෂණ අරමුදල ( වර්ෂය අවසානයේ ප්‍රමාණය ) රු. දශ ලක්ෂ ... | 14.1 | 28.8 | 49.6 | 71.4 | 100.5 |
| (ඊ) මුළු අයභාරය (ආ) රු. දශ ලක්ෂ ... | 16.7 | 23.0 | 29.8 | 31.9 | 42.1 |
| (උ) මුළු වියදම (ආ) රු. දශ ලක්ෂ ... .. | 7.5 | 8.3 | 9.0 | 9.7 | 13.3 |
| (ඌ) අතිරික්තය (+) හෝ හිඟය (—) රු. දශ ලක්ෂ ... ... ... | +9.2 | +14.7 | +20.8 | +22.2 | +28.8 |
| (ඍ) වැය අනුපාතය ( සියයට ගණන ) ... | 45.3 | 34.9 | 30.6 | 29.5 | 30.1 |
| **3. ගිනි රක්ෂණ ( වර්ෂය තුළ ) රු. දශ ලක්ෂ** | | | | | |
| (අ) ශුද්ධ වාර මුදල් ... ... ... | 14.5 | 15.5 | 19.1 | 19.1 | 20.0 |
| (ආ) ශුද්ධ ඉල්ලීම් ගෙවීම් සහ නොබේරූ ... | 1.3 | 3.6 | 3.9 | 3.3 | 4.7 |
| (ඇ) ලාභය (+) හෝ අලාභය (—) ... ... | +5.0 | +11.2 | +13.4 | +17.5 | +14.0 |
| (ඈ) ප්‍රතිරක්ෂණ සංචිතය ( සියයට ගණන ) ... | 9.4 | 10.1 | 12.4 | 12.4 | 13.2 |
| **4. සාමාන්‍ය ආපද රක්ෂණ ( වර්ෂය තුළ ) රුපියල් දශ ලක්ෂ ... ... ...** | | | | | |
| (අ) ශුද්ධ වාර මුදල් ... ... ... | 19.9 | 20.8 | 22.2 | 24.5 | 30.1 |
| (ආ) ශුද්ධ ඉල්ලීම් ගෙවීම් සහ නොබේරූ ... | 4.8 | 8.8 | 18.6 | 24.1 | 29.3 |
| (ඇ) ලාභය (+) හෝ අලාභය (—) ... ... | +2.0 | +8.4 | +4.7 | +4.3 | +3.6 |
| (ඈ) ප්‍රතිරක්ෂණ සංචිතය ... ... ... | 13.0 | 13.5 | 14.4 | 15.9 | 19.5 |
| **5. මුහුදු රක්ෂණ ( වර්ෂය තුළ ) රු. දශ ලක්ෂ** | | | | | |
| (අ) ශුද්ධ වාර මුදල් ... ... .. | 1.9 | 2.7 | 3.1 | 2.8 | 4.4 |
| (ආ) ශුද්ධ ඉල්ලීම් ගෙවීම් සහ නොබේරූ ... | 0.8 | 1.3 | 1.4 | 2.8 | 3.6 |
| (ඇ) ලාභය (+) හෝ අලාභය (—) ... ... | ... | +0.6 | +2.2 | +1.1 | +1.4 |
| (ඈ) ප්‍රතිරක්ෂණ සංචිතය ... ... ... | 1.9 | 2.7 | 3.1 | 2.8 | 4.4 |
| **6. සේවා නියුක්තිය (ප්‍රමාණයන් වර්ෂය අවසානයේ)** | **820** | **1310** | **1390** | **1388** | **1505** |

මූලය : ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.

* තාවකාලිකයි.

(අ) ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුදල් වර්ෂය.

(ආ) අනෙකුත් රක්ෂණ සහතික සහ වාර්ෂිකයන් ද ඇතුළත් ය,

(ඇ) ඊ සහ උ යන විෂයන්වල වෙනස,

1967/68 දී මණ්ඩලයට අයත් තේ කර්මාන්ත ශාලා සතරින් ලැබූ මුළු ආදයම රුපි. දශ ලක්ෂ 3.2 කි. ඉකුත් වර්ෂයේ අලාභය වූ රුපි. දශ ලක්ෂ 0.131 හා සසඳන විට 1967/68 දී මෙම කර්මාන්ත ශාලා ලැබූ මුළු ලාභය රුපි. දශ ලක්ෂ 0.2 කි. 1967 පාලනය යටතට ගනු ලැබූ කළුබෝවිටියාන කර්මාන්ත ශාලාවෙන් රුපි. දශ ලක්ෂ 0.44 ක ලාභයක් ලැබීම මෙයට ප්‍රධාන හේතුව විය. අනෙක් ඒවා අතුරින් දෙරන්ගල කර්මාන්ත ශාලාවෙන් සුළු ලාභයක් ලැබුන අතර, අනෙක් ඒවා පාඩු විඳිමින් කටයුතු ගෙන යන ලදී. නමුත් මෙම කර්මාන්ත ශාලා පිහිටුවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය හුදු වාණිජමය ලාභ ලැබීමට වඩා උස් බිම් ජනපද පිහිටුවීමේ ක්‍රමය යටතේ කෙරුණකි: 1967/68 වර්ෂයේ දී මෙම කර්මාන්ත ශාලාවල සේවා නියුක්තිය 246 ක් විය.

කර්මාන්ත ශාලාවලින් ලැබූ අලාභය, වගාවන්ගෙන් ලද ලාභයන්ගෙන් කැපී ගිය විට මණ්ඩලයේ 1967/68 දී ලද ලාභය රුපි. දශ ලක්ෂ 0.31 වූ අතර, ඉකුත් වර්ෂයේ මණ්ඩලය රුපි. දශ ලක්ෂ 0.48 ක අලාභයක් විඳ ඇත.

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

1961 ජීවිත රක්ෂණ ජනසතුවෙන් පසුව, 1963 ජනවාරි පළමු වනද සිට ජීවිත රක්ෂණ කටයුතු පිළිබඳ ඒකාධිකාරියන් සහිතව, ඉහත සඳහන් කරන ලද සංස්ථාව පිහිටුවන ලදී. පසුකාලීනව 1963 සිට මෙම සංස්ථාවට සාමාන්‍ය රක්ෂණ කටයුතු පිළිබඳව ද ඒකාධිකාරියක් ලැබුණි. ( මුහුදු රක්ෂණ හැර ) මෙම සංස්ථාවේ බලධාරී ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 20.0 ක්වූ අතර මින් රජයේ දයකය රුපියල් දශ ලක්ෂ 10 ක් විය. පහත දැක්වෙන II (ඇ) 17 සංඛ්‍යා සටහනෙන් ඉකුත් වූ අවුරුදු 5 තුළ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සමහර වැදගත් කරුණු දක්වා ඇත. ( ලිත් වර්ෂ අනුවය ).

සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂයන් තුළදී නිකුත් කොට නොබේරූ ජීවිත රක්ෂණ සහතිකවල වටිනාකම් සහ ප්‍රමාණය ඉතා සීඝ්‍රයෙන් වැඩිවුන නමුදු 1967 වැඩිවීම ඉකුත් වර්ෂ වලට අඩු විය. වාර මුදල් ආදයම සීඝ්‍රයෙන් වැඩිවුන අතර, 1968 දී ජීවිත රක්ෂණ අරමුදල් රුපියල් දශ ලක්ෂ 100.5 ක් විය. එමෙන්ම ක්‍රියාකාරිත්වය හේතු කොට ගෙන ඇතිවූ අතිරික්තය ද අඛණ්ඩව වැඩුනු අතර, 1967 දක්වා වැය අනුපාතය ද ( රිය අයභාරයට ඇති වැය අනුපාතය සීඝ්‍රයෙන් පහළ වැටුණි. නමුත් 1968 දී අධික වැටුප් ගෙවීම නිසා වැය අනුපාතය ආන්තිකව වැඩුණි.

1966 දක්වා ගිනි රක්ෂණ වලින් ලැබූ වාර මුදල් අයභාරය ස්ථිරව තිබුණ අතර, 1967 දී ලැබූ ඉහළ ලාභය, ඉල්ලුම්වල පහළ යාම නිසා වැඩි විය. 1968 දී ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම නිසා ලාභ ප්‍රමාණය පහත වැටුණි. සාමාන්‍ය ආපද රක්ෂණ වලින් ලැබූ වාර මුදල් අයභාරය වැඩි වූ අතර, 1966 සිට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම නිසා ලාභයන්ගේ පහළ බසින උපනතියක් දක්විය. මේ අතර සංස්ථාව සාපේක්ෂ වශයෙන් මුහුදු රක්ෂණ කටයුතුවල ඉතා මඳ වශයෙන් නිරත විය. එමෙන්ම මින් ලැබූ අයභාරයෙහි සහ ලාභද උච්ඡාවචනය වෙමින් පැවතිණ. 1967 දී සංස්ථාවේ මුළු සේවා නියුක්තිය 1388 ක් වූ අතර 1968 දී එම ප්‍රමාණය 1505 දක්වා වැඩි විය.

### ජාතික ලොතරැයි මණ්ඩලය

1956 ආරම්භයේ සිට 1963 දක්වා මෙම මණ්ඩලය හඳුන්වනු ලැබූයේ '' ආරෝග්‍ය ශාලා ලොතරැයි මණ්ඩලය'' වශයෙනි. මේ අනුව මෙම මණ්ඩලයෙන් ලැබෙන අතිරේක මුදල් ලංකාවේ සෞඛ්‍ය ව්‍යාපාරයේ දියුණුව සඳහා යොදවන ලදී. 1964 ජනවාරි මාසයේදී මෙම මණ්ඩලය දැනට පවතින තත්වයට ප්‍රතිස්ථාපනය කළ අතර, එහි කාර්යයන් ද පුළුල් කරන ලදී. පහත දැක්වෙන II (ඇ) 18 සංඛ්‍යා සටහනින් මුදල් වර්ෂ 5 තුළ දී කරනු ලැබූ කාර්යයන් පිළිබඳ සංඛ්‍යා දක්වා ඇත.

1963/64 අදිනු ලැබූ ලොතරැයි ප්‍රමාණය 1963/64 දී 26 ක්වූ අතර, 1965/66දී 52 දක්වා වැඩි විය. එතැන් සිට සති පතා අදිනු ලැබූ ලොතරැයි විශේෂ ලක්ෂණයක් විය. ටිකට් මිල ගණන් සහ ත්‍යාගයන් වැඩිකර අමතර ලොතරැයියක් ( ජාතික සම්පත ) 1967/68 දී හඳුන්වා දෙන ලදී. 1966/67 මුළු ආදයම වූ රුපියල් දශ ලක්ෂ 28.9 සිට 1966/67 දී මුළු ආදයම ( නිමිකම්

## සංඛ්‍යා සටහන II (ඇ) 18

## ජාතික ලොතරැයි මණ්ඩලය 1963-64 -- 1967-68 (අ)

| ශීර්ෂ | 1963-64 | 1964-65 | 1965-66 | 1966-67* | 1967-68* |
|---|---|---|---|---|---|
| 1. ප්‍රාග්ධන ආයෝජන ( රු. '000 ) ... | 45 | 54 | 20 | 176 | 600 |
| 2. දිනුම් අදිනු ලැබූ ලොතරැයි ගණන ... | 26 | 41 | 52 | 52 | 54 |
| **3. ආදායම (රු. '000 ) ... ... ...** | **6,773** | **12,256** | **26,306** | **29,940** | **38,956** |
| (අ) ටිකට් අලෙවියෙන් ... ... | 6,622 | 11,975 | 25,318 | 28,909 | 37,960 |
| (ආ) වෙනත් ... ... ... | 151 | 281 | 988 | 1,031 | 996 |
| **4. වියදම ( රු. '000 ) ... ... ...** | **3,913** | **6,724** | **14,289** | **16,424** | **22,048** |
| (අ) තෑගිවල වටිනාකම ... ... | 2,649 | 4,580 | 10,127 | 11,564 | 15,184 |
| (ආ) පරිපාලනය (කොමිස් මුදල් ඇතුළුව) | 1,264 | 2,144 | 4,162 | 4,860 | 6,864 |
| 5. වියදම් අඩුකර ආදායම ... ... | +2,860 | +5,532 | +12,017 | +13,516 | + 6,908 |
| 6. ඒකාබද්ධ අරමුදලට කළ දායක දීමනා (ආ)... | 2,781 | 5,231 | 10,683 | 12,142 | 15,609 |
| 7. සේවා නියුක්තිය ( ගණන ) ... ... | 38 | 43 | 37 | 66 | 71 |

මූලය : ජාතික ලොතරැයි මණ්ඩලය

* තාවකාලිකය.

(අ) මෙම සංඛ්‍යා ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වන මුදල් වර්ෂ සඳහාය.

(ආ) මෙම සංඛ්‍යා වාර්තා කිරීමේ ප්‍රමාදකම් නිසා රජයේ ගණන් හිලව් වලින් වෙනස් වේ.

නොපෑ ත්‍යාගවල වටිනාකම ද ඇතුළුව ) රුපියල් දශ ලක්ෂ 40.0 දක්වා වැඩි විය. මේ අතර වියදම ද ඉතා සීඝ්‍රයෙන් ඉහළ නැගුණි. වැඩිවූ වියදම් වලින් රුපියල් දශ ලක්ෂ 3.6 ක් වැය වූයේ, ත්‍යාග මුදල් ප්‍රදානය වැඩි කිරීම නිසා වූ අතර රුපියල් දශ ලක්ෂ 2.0 ක් වැය වූයේ ඉහළ පරිපාලන වියදම් සහ කොමිස් මුදල් සඳහා ය.

1963 නො: 11 දරණ මූල්‍ය නීති පනතට අනුව, මුදල් වර්ෂය අවසානයේදී මණ්ඩලය සතුව පවතින සෑම මුදලක්ම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. මෙවැනි දායක දීමනා ක්‍රමයෙන් වැඩි වූ අතර, 1967/68 දී රුපියල් දශ ලක්ෂ 15.6 ක ප්‍රමාණයක් විය. 1967/68 දී මණ්ඩලය මගින් ස්ථිරව සේවා නියුක්ති කළ ගණන 71 ක් වූ අතර මෙම ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා 5 කින් වැඩිවිය.

### ලංකා සංචාරක මණ්ඩලය

ලංකාවේ සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් 1966 මැයි මස මෙම මණ්ඩලය පිහිටුවන ලදී. පහත දැක්වෙන II (ඇ) 19 සංඛ්‍යා සටහනෙහි, සංචාරක මණ්ඩලයට අදාළ වන සමහර සංඛ්‍යා සහ සංචාරක යාත්‍රා අනුව ගත් සංඛ්‍යා දක්වා ඇත.

1967/68 ( ඔක්තෝබර් සිට සැප්තැම්බර් අවසානයේ ) මණ්ඩලය තුළ කළ, ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.4 සිට රුපියල් දශ ලක්ෂ 7.0 දක්වා වැඩි විය. එමෙන්ම 1967/68 අවසානයේදී මණ්ඩලයේ වත්කම්වල අගය රුපියල් දශ ලක්ෂ 12.5 ක් විය. පටන් ගැනුමේදී මණ්ඩලය විසින් කුඩා හෝටලයක් සහ හෝටල්වල රැකියාවේ නියුක්ත වූවන් පුහුණු කරනු සඳහා හෝටල් පාසැලක් සහ තානායම් 14 ක් පාලනය කරන ලදී. 1967 සිට මේවා ලංකා හෝටල් සංස්ථාවට සහ පුද්ගලික ව්‍යවසායකයින්ට කුලියට දෙන ලදී.

## සංඛ්‍යා සටහන II (ඇ) 19

## ලංකා සංචාරක මණ්ඩලය 1965 – 66 –– 1967 – 68 (අ)

| විෂය | | 1965-66 (ආ) | 1966-67* | 1967-68* |
|---|---|---|---|---|
| 1. **ප්‍රාග්ධන ආයෝජන වර්ෂය අවසානයේදී (රු. '000)** | ... | **300.0** | **3,528.4** | **6,967.0** |
| 2. **වත්කම්වල අගය වර්ෂය අවසානයේදී (රු. '000)** | ... | **7,717.1** | **8,448.7** | **12,535.5** |
| 3. මුළු ආදාය ම (රු. 6.00)... | ... | 146.6 | 588.6 | 704.7 |
| 4. ලාභය (+) හෝ අලාභය (—) (ඇ) (රු. '000)... | ... | 200 | –2,061 | –3,272 |
| 5. සේවා නියුක්තිය (ගණන) වර්ෂය අවසානයේදී... | ... | 96 | 190 | 198 |
| 6. **සංචාරක සංඛ්‍යා (අ)** | | | | |
| (අ) **සංචාරකයින්ගේ පැමිණීම් (ඈ)** ... | ... | **98,048** | **82,754** | **69,679** |
| (1) සංචාරකයින් ( ගණන ) ... ... | ... | 18,969 | 23,666 | 28,272 |
| (2) විනෝදකාමීන් ( ගණන ) ... | ... | 79,079 | 59,088 | 41,407 |
| (ආ) සංචාරක රාත්‍රි(ඉ) ( ගණන) ... ... | ... | ල.නො. | 268,092 | 325,238 |

මූලය : ලංකා සංචාරක මණ්ඩලය

* තාවකාලිකය.
(අ) ශීර්ෂයන් 1 සිට 5 දක්වාවූ සංචාරක මණ්ඩලයෙහි සංඛ්‍යාවන් ඔක්තෝම්බර් සිට සැප්තැම්බර් දක්වා වූ මුදල් වර්ෂයන් වෙනුවෙනි. 6 වැනි ශීර්ෂයෙහි ඇති සංචාරක සංඛ්‍යා 1966, 1967 සහ 1968 වර්ෂයන් සඳහාය.
(ආ) සංචාරක මණ්ඩලය කටයුතු ඇරඹුයේ 1966 මැයි 1 වැනිදය.
(ඇ) ආදායමට වඩා වියදම අධිකය.
(ඈ) ''සංචාරකයින් '' වශයෙන් විග්‍රහ කරනු ලබනුයේ එක රාත්‍රියක් හෝ ඊට වැඩි ගණනක් නැවතී සිටීම අනුවය. '' විනෝදකාමීන් '' වශයෙන් විග්‍රහ කරන්නේ රාත්‍රියක් නැවතී නොසිටින අයයි.
(ඉ) සංචාරකයින් විසින් ගත කරනු ලැබූ රාත්‍රීන් ගණන.

1966/67 සහ 1967/68 යන කාලයන් තුළදී මණ්ඩලයේ මුළු අයභාරයෙහි සුළු වැඩිවීමක් පෙන්නුම් කළේය. කෙසේ හෝ සංචාර ව්‍යාපාරය උනන්දු කිරීම සඳහා ගිය වියදම් ආදායමට වඩා වැඩි වූ අතර, මේ නිසා ඇතිවූ හිඟය 1966/67 දී රුපියල් දශ ලක්ෂ 2.1 කින් වැඩි වූ අතර, 1967/68 දී රුපියල් දශ ලක්ෂ 3.3 කින් වැඩිවිය. මණ්ඩලය විසින් සේවා නියුක්ත කරන ලද ප්‍රමාණය 8 සිට 198 දක්වා 1967/68 දී වැඩි විය.

ලංකාවට පැමිණි සංචාරකයින්ගේ ගණන 1967 සහ 1968 දී පිළිවෙලින් 15,294 සහ 13,075 වශයෙන් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලංකාවට පැමිණෙන විනෝද-කාමීන්ගේ ගණන අඩුවීමයි. ( රාත්‍රියක් ගත නොකරන අය ) එමෙන්ම මෙයට තවත් හේතුවක් වූයේ 1967 ජූනි මස මැද පෙරදිග ඇති අවුල් නිසා, මුහුදු යාත්‍රාවල ගමනාගමනය තාවකාලිකව ඇන හිටීමයි. නමුත් සංචාරකයන්ගේ පැමිණීම නිසා, ( රාත්‍රියක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මෙහි ගත කරන ) හිලව් වී ගිය වැඩිවීම 1967 දී 4697 ක් වූ අතර, 1968 දී 4,606 ක් විය. එමෙන්ම 1968 දී '' සංචාරකයින් ගත කළ රාත්‍රීන් '' ද 57,146 කින් පැහැදිළි වැඩිවීමක් පෙන්නුම් කළේය.

මණ්ඩලය මගින් අගනුවර, දකුණු සහ නැගෙනහිර වෙරළබඩ, සංචාරකයින් සඳහා නිවාඩු ගත කරන ස්ථාන සහ වෙනත් සැප පහසුකම් ඇති කිරීමට සැලසුම් කළ අතර, පැරණි නගර සහ කඳුරට ප්‍රදේශවල හෝටල් සහ වෙනත් නිවාඩු ගත කරන ස්ථාන ගොඩ නැංවීමට ද වැඩ පිළිවෙල සකස් කොට ඇත. 1973 වන විට මණ්ඩලය මගින් අතිරේක නැවතීම් පහසුකම් සඳහා කාමර 1750 සැපයීමට ඇස්තමේන්තු කර ඇත. යෝජනා ක්‍රම 12 ක් දැනටමත් අනුමත කර ඇති අතර වෙරළබඩ ප්‍රදේශවල පහසුකම් වැඩි කිරීමට කාමර 800 ක් තැනීමටත්, පැරණි නගර සඳහා කාමර 100 ක් තැනීමටත් මෙමගින් අපේක්ෂා කෙරේ . මෙම වැඩ පිළිවෙල 1973 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ. බෙන්තොට අක්කර 100 ක පමණ සංචාරක ස්ථානය සහ පොළොන්නරුවේ අක්කර 10 ක පමණ වන අනෙක් සංචාරක ස්ථානයද වැඩ දැනටමත් ආරම්භ කර ඇත.